ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

[සහතිකය සටහන් කළේ 1978 දෙසැම්බර් මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1978 දෙසැම්බර් මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 3.25 යි   තැපැල් ගාස්තුව : රු. 1.00 යි

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

[සහතිකයෂ සටහන් කළේ 1978 දෙසැම්බර් මස 21 වන දින]

එල්. ඩී.—ඕ. 60/78.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවක් සහ විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයක් පිහිටුවීම පිණිස ද මණ්ඩප සහ පීඨ සහිත විශ්වවිද්‍යාල ද වෙනත් උසස් අධ්‍යාපන ආයතන ද පිහිටුවීම, පවත්වාගෙන යාම සහ පරිපාලනය කිරීම සඳහා සහ ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එහි විධිවිධාන සියල්ලම හෝ ඉන් යම් විධිවිධානයක් සම්බන්ධයෙන්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක හෝ දිනවල එය ක්‍රියාත්මක වන්නේ ය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

I වන කොටස

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිහිටුවීම

2. (1) තත් කාලයෙහි කොමිෂන් සභාවේ සාමාජිකයන් වන තැනැත්තන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවක් මේ පනත යටතේ පිහිටුවනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවක් පිහිටුවීම.

(2) කොමිෂන් සභාව යම් නමකින් හැඳින්විය යුතු යයි (1) වන උපවගන්තියෙන් නියම කෙරේ ද ඒ නාමයෙන් කොමිෂන් සභාව අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වන අතර—

(අ) ඒ නාමයෙන් කොමිෂන් සභාව විසින් සියලු අධිකරණවල නඩු පැවරීමට හා කොමිෂන් සභාවට විරුද්ධව නඩු පවරනු ලැබීමට ;

(ආ) කොමිෂන් සභාව විසින් ස්වකීය අභිමතය පරිදි මුද්‍රාව වෙනස් කිරීමට ;

(ඇ) චංචල හෝ නිශ්චල යන දෙවර්ගයේ ම දේපළ මිලට ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීමට සහ ඒ දෙවර්ගයේ ම දේපළ සතුව සිටීමට, බද්දට හෝ කුලියට ගැනීමට හෝ දීමට, උකස් කිරීමට, ඔඩපනයට යටත් කිරීමට සහ විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට

කොමිෂන් සභාවට සම්පූර්ණ බලය හා අධිකාරය ඇත්තේ ය.

3. පහත සඳහන් කටයුතු කොමිෂන් සභාවේ අරමුණු වන්නේ ය :— කොමිෂන් සභාවේ අරමුණු.

(1) ජාතික ප්‍රතිපත්තියම අනුකූල වන පරිදි විශ්වවිද්‍යාල අධ්‍යාපනය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම ;

(2) විශ්වවිද්‍යාල අධ්‍යාපනය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරනු ලබන මුදල් උසස් අධ්‍යාපන ආයතන වලට බෙදා වෙන් කරදීම සහ ඒ එක් එක් උසස් අධ්‍යාපන ආයතනය විසින් කරනු ලබන වියදම් පාලනය කිරීම ;

(3) උසස් අධ්‍යාපන ආයතනවල ශාස්ත්‍රීය තත්ත්වයන් පවත්වා ගැනීම ;

(4) උසස් අධ්‍යාපන ආයතනවල පරිපාලනය විධිමත් කිරීම ;

(5) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයට ශිෂ්‍යයන් ඇතුල් කිරීම විධිමත් කිරීම ;

(6) මේ පනතින් හෝ මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ හා නියම කරනු ලැබූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම.

කොමිෂන් සභාවේ සංයුතිය.

4. (1) කොමිෂන් සභාව සභාපතිවරයකුගෙන් සහ වෙනත් සාමාජිකයන් හතර දෙනකුගෙන් සමන්විත විය යුතු අතර ඔවුන් සියලු දෙනාම ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ ද එසේ නිශ්චය කරනු ලබන බල තල, කාර්ය හා කර්තව්‍ය ඇත්තා වූ ද ස්ථාවර හා තත්කාර්ය කමිටු කොමිෂන් සභාව විසින් කලින් කල පත් කරනු ලැබිය හැකි අතර ඒ එක් එක් කමිටුවේ සභාපතිවරයා කොමිෂන් සභාවේ සාමාජිකයකු විය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ ධුර කාලය.

5. (1) සභාපතිවරයා ඇතුළු කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු ම, ඔහු විසින් ධුරය දැරීම කලින් නතර වුවහොත් මිස, ඔහු පත් වූ දින සිට ගණන් බලනු ලබන වර්ෂ පහක කාලයක් ධුරය දරන අතර ධුරයෙන් ඉවත් කරනු ලැබුවේ නම් මිස, නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය :

එසේ වුවද තමාගේ ධුර කාලය ඉකුත්වීමට පෙර යම් සාමාජික යකු තම ධුරය දැරීම නතර වුවහොත් ඔහුගේ අනුප්‍රාප්තිකයා, ඒ අනුප්‍රාප්තිකයා ධුරය දැරීම කලින් නතර වුවහොත් මිස, ඔහුගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව තිබූ ධුර කාලය තුළ ධුරය දරන්නේ ය.

(2) ජනාධිපතිවරයා වෙත යවනු ලබන තම අත්සන යටතේ වූ ලිපියක් මගින් කොමිෂන් සභාවේ සාමාජිකයකුට තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය. එහෙත් ඒ ඉල්ලා අස්වීම භාරගන්නා තුරු ඔහු තව දුරටත් තම ධුරයේ සිටිය යුතු ය.

(3) කොමිෂන් සභාවේ සභාපතිවරයාට නැතහොත් වෙනත් සාමාජිකයකුට, රෝගාතුරවීම නිසා හෝ වෙනත් දුර්වලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙන යම් හේතු වක් නිසා හෝ තාවකාලිකව තම ධුරයෙහි කටයුතු කිරීමට නො හැකි වුවහොත්, අවස්ථාවෝචිත පරිදි, ඒ සභාපතිවරයා වෙනුවට කටයුතු කිරීමට වෙනත් සාමාජිකයකු හෝ එකී වෙනත් සාමාජිකයා වෙනුවට කටයුතු කිරීමට සුදුසු තැනැත්තකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(4) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ අනිකුත් සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ කටයුතු.

6. (1) කොමිෂන් සභාවේ සභාපතිවරයා කොමිෂන් සභාවේ සියලුම රැස්වීම්වල මූලසුන දරන්නේ ය. කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා නො පැමිණි විට, සාමාජිකයන් විසින්, පැමිණ සිටින සාමාජිකයන් අතුරින් යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මූලසුන දැරීම සඳහා තෝරා පත් කර ගත යුතු ය.

(2) කොමිෂන් සභාවේ රැස්වීමක් සඳහා අවශ්‍ය ගණ පූරණය සාමාජිකයන් තුන් දෙනකුගෙන් සමන්විත වන්නේ ය.

(3) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන වේලාවක දී හා ස්ථානයක දී යටත් පිරිසෙයින් එක් මාසයකට එක් රැස්වීමක්වත් පැවැත්වෙන පරිදි කොමිෂන් සභාව විසින් අවශ්‍යතාව අනුව රැස්වීම් පැවැත්විය යුතු ය; තවද (2) වන උපවගන්තියෙහි විධිවිධානවලට යටත්ව, ස්වකීය කටයුතු කරගෙන යාමෙහි ලා කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ සාදනු ලබන කාර්ය පරිපාටිය පිළිබඳ රීති කොමිෂන් සභාව විසින් පිළිපැදිය යුතු ය.

කොමිෂන් සභාවේ සභාපතිවරයා.

7. (1) කොමිෂන් සභාවේ සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ සභාපතිවරයා කොමිෂන් සභාවේ එදිනෙදා පරිපාලන කටයුතු භාරව සිටිය යුතු ය.

(3) 15 වන, 16 වන සහ 18 වන වගන්ති යටතේ කොමිෂන් සභාව සතු බලතල, කාර්ය සහ කර්තව්‍ය හැර, මේ පනත යටතේ කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ අනිකුත් බලතල, කාර්ය සහ කර්තව්‍ය අතුරින් යමක් කොමිෂන් සභාව විසින් යෝජනා සම්මතයක් මගින් සභාපතිවරයා වෙත පැවරිය හැකි ය.

(4) මේ පනත යටතේ සභාපතිවරයා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී කොමිෂන් සභාවේ සභාපතිවරයා ඒ කොමිෂන් සභාවේ සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත් වන්නේ ය.

(5) කොමිෂන් සභාවේ සභාපතිවරයා ඒ සභාවේ ප්‍රධාන විධායක නිලධරයා වුවත් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු ලෙස නො සැලකිය යුතු ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය.

8. (1) කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත් කළ යුතු අතර ඒ කාර්ය මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය:—

(අ) ලේකම්වරයෙක් ; සහ

(ආ) කොමිෂන් සභාවේ කටයුතු නිසි පරිදි හා කාර්යක්ෂම ලෙස කරගෙන යාම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන වෙනත් නිලධරයෝ හා සේවකයෝ.

(2) මේ පනතේ අනෙක් විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව විසින්—

(අ) කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත්කිරීම, සේවයෙන් පහකිරීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම ද කළ හැකි ය;

(ආ) ඒ කාර්ය මණ්ඩලයේ පඩි හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කළ හැකි ය;

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා නියමයන් හා කොන්දේසි නිශ්චය කළ හැකි ය;

(ඈ) කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ යහපත සඳහා ශුභ සාධක යෝජනා ක්‍රම ඇති කිරීම හා විධිමත් කිරීම ද ඒ කාර්ය මණ්ඩලය වෙනුවෙන් ඒ යෝජනා ක්‍රමවලට දායක මුදල් ගෙවීම ද කළ හැකි ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයම රජයේ නිලධරයන් පත් කිරීම.

9. (1) කොමිෂන් සභාවේ ඉල්ලීම පිට, රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, ඒ නිලධරයාගේ, ඒ නිලධරයා සේවයෙහි යොදවනු ලැබ සිටින්නේ යම් අමාත්‍යාංශයක් විසින් නැතහොත් යම් අමාත්‍යාංශයක් යටතේ ද ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට කොමිෂන් සභාව විසින් තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් ඔහු ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 26 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි (අ) ඡේදය හැර එම වගන්තියෙහි (3) වන හා (5) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහු කෙරෙහි හා ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 26 වන වගන්තියේ (4) වන හා (5) වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහු කෙරෙහි හා ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(4) නිශ්චිතව සඳහන් කාල සීමාවක් තුළ ආණ්ඩුවට සේවය කිරීමට එකඟවෙමින් ආණ්ඩුවත් සමග ගිවිසුමකට එළඹ ඇති තැනැත්තකු කොමිෂන් සභාව විසින් සේවයෙහි යොදවනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා කොමිෂන් සභාව යටතේ යම් කාලයක් සේවය කිරීම ඒ ගිවිසුමෙහි බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාවේ ඉල්ලීම පිට, යම් උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ කැමැත්ත ඇතිව, එවැනි ම කැමැත්ත ඇතිව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු

ලැබිය හැකි ය; නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථ සාධක අරමුදල් අයිතිවාසිකම් ඇතුළුව ඒ කොමිෂන් සභාව හා ඒ ප්‍රධාන විධායක නිලධරයා එකඟ වන නියමයන් හා කොන්දේසි මත ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(6) යම් උසස් අධ්‍යාපන ආයතනයක නිලධරයකු හෝ සේවකයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙන යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඔහු ද යටත් වන්නේ ය.

කොමිෂන් සභාවේ අරමුදල.

10. (1) කොමිෂන් සභාවට ස්වකීය වූ අරමුදලක් ඇත්තේ ය.

(2) ඒ අරමුදලට—

(අ) ඒ කොමිෂන් සභාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරනු ලබන සියලු මුදල් ද;

(ආ) කොමිෂන් සභාවට පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් හෝ අන් කවර මාර්ගයකින් හෝ ලැබෙන සියලු මුදල් හා කොමිෂන් සභාව විසින් ඉටු කරනු ලබන සේවා සඳහා අය කරනු ලබන ගාස්තු ද;

(ඇ) මේ පනතින් හෝ එය යටතේ හෝ ඒ අරමුදලට ගෙවීමට නියමිත සියලු මුදල් ද

ගෙවිය යුතු ය.

(3) ඒ අරමුදලින්—

(අ) මේ පනත හෝ වෙන යම් ලිඛිත නීතියක් යටතේ කොමිෂන් සභාවේ කටයුතු කිරීමේ දී හෝ කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී කොමිෂන් සභාව විසින් දරනු ලබන යම් වියදම් සඳහා අවශ්‍ය සියලු මුදල් ද,

(ආ) මේ පනතින් හෝ එය යටතේ ඒ අරමුදලින් ගෙවීමට නියමිත සියලු මුදල් ද

ගෙවිය යුතු ය.

කොමිෂන් සභාවේ ගණන් හා මුදල් වර්ෂය.

11. (1) කොමිෂන් සභාවේ ගණන්, විගණකාධිපතිවරයා විමසා භාණ්ඩාගාරය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට හා පිළිවෙළට තබා ගැනීමට කොමිෂන් සභාව විසින් සැලැස්විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ ගණන් පොත් කොමිෂන් සභාවේ කාර්යාලයෙහි තබා ගත යුතු ය.

(3) කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ආණ්ඩුවේ මුදල් වර්ෂය ම වන්නේ ය.

කොමිෂන් සභාවේ ගණන් විගණනය කිරීම.

12. (1) කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ ගණන් විගණකාධිපතිවරයා ලවා වර්ෂයක් පාසා විගණනය කරවාගත යුතු ය. ඒ ගණන් විගණනය කිරීමෙහි ලා තමාට සහායවීම පිණිස තමාගේ විධානය හා පාලනය යටතේ ක්‍රියා කරන සුදුසුකම් ලත් යම් විගණකවරයකුගේ හෝ විගණකවරයන්ගේ සේවය විගණකාධිපතිවරයා විසින් ලබා ගත හැකි ය.

NATIONAL LIBRARY OF SRI LANKA

(2) කොමිෂන් සභාවේ ගණන් විගණනය කිරීමෙහි ලා විගණකාධිපතිවරයා විසින් දරනු ලබන වියදම් පියවීමේ කාර්යය සඳහා මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයක් කොමිෂන් සභාවේ අරමුදලින් විගණකාධිපතිවරයාට ගෙවිය යුතු ය. විගණකාධිපතිවරයා විසින් කොමිෂන් සභාවෙන් ලබන ලද යම් පාරිශ්‍රමිකයක්, ඒ විගණන කාර්යය සඳහා ඔහු විසින් සේවයෙහි යොදවනු ලැබූ සුදුසුකම් ලත් විගණකවරයකුට ගෙවන ලද යම් මුදලක් වේනොත් එය ඉන් අඩුකර ගැනීමෙන් පසු ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

(3) මේ වගන්තියෙහි කාර්යය සඳහා "සුදුසුකම් ලත් විගණකවරයා" යන යෙදුමෙන් —

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන් ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි ගණකාධිකාරී සමාගමක් හෝ

අදහස් වේ.

(4) විගණකාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ ගණන් පරීක්ෂාකොට—

(අ) තමාට අවශ්‍ය සියලු තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් තමා විසින් ලබා ගන්නා ලද්දේ ද නැද්ද යන්න සඳහන් කරමින් ;

(ආ) වාර්තාවේ සඳහන් ගණන් ඒ කොමිෂන් සභාවේ මුදල් පිළිබඳව සත්‍යවූත් සාධාරණවූත් තත්ත්වයක් පිළිබිඹුවන පරිදි නිසි ආකාරයට පිළියෙළ කර ඇත්තේ ද යන්න සඳහන් කරමින් ; සහ

(ඇ) ඒ කොමිෂන් සභාවේ කටයුතු හා ගණන් පිළිබඳව වූ යම් පරීක්ෂණයක දී පාර්ලිමේන්තුවට වැදගත් විය හැකි යයි තමා අදහස් කරන ඒ ගණන්වල යම් කරුණකට අවධානය යොමු කරවමින්

වාර්තාවක් සැපයිය යුතු ය.

(5) විගණකාධිපතිවරයා විසින් තම වාර්තාව කොමිෂන් සභාව වෙත යැවිය යුතු ය.

(6) (5) වන උපවගන්තියෙහි සඳහන් විගණකාධිපතිවරයාගේ වාර්තාව කොමිෂන් සභාව විසින් සලකා බැලිය යුතු අතර ඒ වාර්තාව කොමිෂන් සභාවට එවීමෙන් පසු මාස තුනක් ඇතුළත, ඒ වාර්තාවෙන් පෙන්නුම් කර දෙන ලද කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ගන්නා ලද හෝ ගැනීමට අදහස් කරන පියවර විගණකාධිපතිවරයා වෙත දැන්විය යුතු ය.

(7) එක් එක් වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව කොමිෂන් සභාව වෙත ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත කොමිෂන් සභාව විසින් ඒ වාර්තාව, ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් (6) වන උපවගන්තිය යටතේ දක්වන ලද අදහස් හා ඒ වාර්තාවට අදාළ වන ගණන් ප්‍රකාශය සමග අමාත්‍යවරයා වෙත යැවිය යුතු ය. අමාත්‍යවරයා විසින් ඒවායේ පිටපත් ඒ ගණන් හා වාර්තාව අදාළ වන වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන වර්ෂය අවසාන වීමට පෙර පාර්ලිමේන්තුව ඉදිරියේ සභාගත කිරීමට සැලැස්විය යුතු අතර එයින් උද්ගත වන යම් ප්‍රශ්න වෙතොත් කොමිෂන් සභාවේ සභාපතිවරයා පාර්ලිමේන්තුවේ මහජන ගිණුම් කාරක සභාව ඉදිරියෙහි පෙනී සිට එම ප්‍රශ්නවලට පිළිතුරු දිය යුතු ය.

(8) කොමිෂන් සභාවේ ගණන් විගණකාධිපතිවරයා විසින් විගණනය කිරීම කෙරෙහි සහ විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ වන්නේ ය.

මේ පනත යනාදිය යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය මත කරනු ලැබූ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

13. (1) (අ) මේ පනත යටතේ හෝ යම් උචිත සාධන පත්‍රයක් යටතේ කොමිෂන් සභාව විසින් සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරනු ලැබූ ලෙස සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවට විරුද්ධව; හෝ

(ආ) මේ පනත යටතේ හෝ යම් උචිත සාධන පත්‍රයක් යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය මත ඒ කොමිෂන් සභාවේ සාමාජිකයකු විසින් හෝ එහි කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු විසින් සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරනු ලැබූ ලෙස සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොවිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියෙහි කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාවට විරුද්ධව පවරන ලබන සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් දරන්නට සිදු වන යම් වියදමක් වෙතොත් එම වියදම කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවිය යුතු ය. එබඳු යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කොමිෂන් සභාවට ගෙවනු ලබන හෝ කොමිෂන් සභාව විසින් අයකර ගනු ලබන යම් ගාස්තුවක් වෙතොත් ඒ ගාස්තුව ඒ අරමුදලට බැර කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ යම් උචිත සාධන පත්‍රයක් යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය මත හෝ ඔහු විසින් කරනු ලැබූ නැතහොත් කරනු ලැබූ ලෙස සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක පවරන

ලැබූ සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් ඔහුට දැරීමට සිදු වන යම් වියදමක්, ඔහු විසින් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දේ යයි අධිකරණය පිළිගනිත හොත්, ඔහු විසින් ඒ වියදම ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකර ගන්නා ලද්දේ නම් මිස, කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාවට විරුද්ධව ගෙන එනු ලබන යම් නඩුවක දී කොමිෂන් සභාවේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළට විරුද්ධව රිට් බලපත්‍රයක් නිකුත් නො කළ යුතු ය.

II වන කොටස

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය

මෙ කොටසේ මතු දැක්වෙන විධිවිධාන වෙනත් ඇතැම් විධිවිධාන ක්‍රියාත්මකවීම කෙරෙහි හානිකර නොවන බව.

14. කොමිෂන් සභාව වෙත යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍ය යක් පවරන හෝ නියම කරන මේ පනතේ වෙන යම් කොටසක විධිවිධාන ක්‍රියාත්මකවීම කෙරෙහි මේ කොටසේ මතු දැක්වෙන විධි විධාන හානිකර නොවන්නේ ය.

කොමිෂන් සභාවේ බලතල.

15. කොමිෂන් සභාව විසින් පහත සඳහන් බලතල සියල්ලම හෝ ඉන් යම් බලයක් හෝ දරා ක්‍රියාත්මක කළ යුත්තේ ය :—

(i) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ මුදල් අවශ්‍යතා සම් බන්ධයෙන් කලින් කල පරීක්ෂණ හෝ විමර්ශන පැවැත්වීම ;

(ii) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බල මණ්ඩලය විමසා ඒ උසස් අධ්‍යාපන ආයතනයේ නඩත්තුව හා සංවර්ධනය හෝ වෙන යම් සාමාන්‍ය හෝ විශේෂ කාර්යයක් සඳහා ත්‍රෛවාර්ෂික අය වැය වාර්තා කලින් කල පිළියෙළ කිරීම ;

(iii) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයට රජයේ අරමුදලින් යම් මුදලක් ප්‍රදානය කිරීම අවශ්‍ය නම් නැතහොත් අභිමත නම්, ඒ මුදලෙහි ස්වභාවය හා ප්‍රමාණය සම්බන්ධයෙන් කලින් කල අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීම ;

(iv) පඩි හා වැටුප් පිළිබඳ ආණ්ඩුවේ සමස්ත ප්‍රතිපත්තියට අනුකූලව, උසස් අධ්‍යාපන ආයතනවල කාර්ය මණ්ඩලයේ විවිධ ශ්‍රේණිවලට ගෙවිය යුතු පාරිශ්‍රමික ප්‍රමාණය හා කාර්ය මණ්ඩලයට ලැබිය යුතු වෙනත් ප්‍රතිලාභවල ස්වභාවය හා ප්‍රමාණය කලින් කල නිශ්චය කිරීම ;

(v) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයෙහි පැවැත්විය යුතු පාඨමාලා ද ප්‍රදානය කළ යුතු උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ද ඒ එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බල මණ්ඩලය විමසීමෙන් පසු නිශ්චය කිරීම ;

(vi) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයට වාර්ෂිකව ඇතුල් කළ යුතු මුළු ශිෂ්‍ය සංඛ්‍යාව හා ඒ ශිෂ්‍ය සංඛ්‍යාව එහි විවිධ පාඨමාලාවලට වෙන් කරන ආකාරය, ඒ එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බල මණ්ඩලය විමසීමෙන් පසු නිශ්චය කිරීම ;

(vii) නියමාවලි මගින් සංයුතිය, බලතල, කාර්ය හා කර්තව්‍ය නියම කරනු ලැබූ ප්‍රවේශ කමිටුවක් විමසීමෙන් පසු, එක් එක් උසස් අධ්‍යාපන ආයතනයට ඇතුල් කර ගැනීම සඳහා ශිෂ්‍යයන් තෝරා ගැනීම ;

(viii) විශ්වවිද්‍යාලයේ හෝ යම් පිළිගත් ආයතනයක ශිෂ්‍යයන් නොවන තැනැත්තන්ට විශ්වවිද්‍යාලයේ උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ලබා ගැනීමට හැකි වන සේ එක් එක් විශ්වවිද්‍යාලය විසින් පැවැත්විය යුතු බාහිර පරීක්ෂණ ඒ එක් එක් විශ්වවිද්‍යාලයේ පාලක බල මණ්ඩලය විමසීමෙන් පසු නිශ්චය කිරීම ;

(ix) උසස් අධ්‍යාපන ආයතනවල කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පරිපාටි සහ පත්කිරීමේ ක්‍රම සකස් කිරීම ;

(x) යම් උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධරයා විසින් කොමිෂන් සභාවේ සැලකිල්ලට යොමුකරනු ලබන්නා වූ ද ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ශිෂ්‍යයන්ගේ විනයට අදාළ වන්නා වූ ද කරුණු විමර්ශනය කිරීම හෝ විමර්ශනය කිරීමට සැලැස්වීම හා ඒ පිළිබඳව ප්‍රතිකර්ම පියවර ගැනීම ; සහ

(xi) මේ පනතෙහි නිශ්චිතව සඳහන් බලතල ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ද 3 වන වගන්තියෙහි දැක්වෙන අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා ද අවශ්‍ය වන වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම.

16. කොමිෂන් සභාවේ එක් එක් මුදල් වර්ෂය ඉකුත් වී මාස හයක කාලයක් ඉකුත් වන්නට පෙර, ඒ වර්ෂයේ කොමිෂන් සභාවේ වැඩ කටයුතු පිළිබඳ සම්පූර්ණ තොරතුරු ඇතුළත් වාර්තාවක් කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයා වෙත යැවිය යුතු අතර අමාත්‍යවරයා එහි පිටපත් පාර්ලිමේන්තුව ඉදිරියේ සභාගත කිරීමට සැලැස්විය යුතු ය. කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන මිලකට ඒ වාර්තාවේ පිටපත් මහජනයාට ලබාගැනීමට කොමිෂන් සභාව විසින් සැලැස්විය යුතු ය.

කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව.

තොරතුරු හා වාර වාර්තා ඉල්ලා සිටීමට කොමිෂන් සභාවට ඇති බලය.

17. කොමිෂන් සභාව විසින් යවනු ලබන දැන්වීමක් මගින්, මේ පනත යටතේ වූ කොමිෂන් සභාවේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට අවශ්‍ය වන සියලු ම කාරණාවලට අදාළ වාර වාර්තා හෝ තොරතුරු, ඒ දැන්වීමෙහි සඳහන් කරන ලද කාල සීමාව තුළ කොමිෂන් සභාවට සපයන ලෙස යම් උසස් අධ්‍යාපන ආයතනයක පාලක බල මණ්ඩලයට කොමිෂන් සභාව විසින් නියම කළ හැකි ය. ඒ දැන්වීමෙහි නියමයන් අනුව ක්‍රියා කිරීම ඒ පාලක බල මණ්ඩලයේ කාර්යය වන්නේ ය.

නියමාවලි සෑදීමට කොමිෂන් සභාවට ඇති බලය.

18. (1) මේ පනත යටතේ කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සඳහා කොමිෂන් සභාවට අවශ්‍ය වන සියලු කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් නියමාවලි සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොවන පරිදි, පහත සඳහන් කාරණා සියල්ල හෝ ඉන් යම් කාරණාවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් නියමාවලි සාදනු ලැබිය හැකි ය :—

(අ) යම් කාරණා සම්බන්ධයෙන් නියමාවලි සෑදීමට මේ පනතේ වෙන යම් විධිවිධානයකින් කොමිෂන් සභාවට බලය දී හෝ නියමිතව ඇද්ද ඒ සියලු කාරණා ;

(ආ) කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතනවල කාර්ය මණ්ඩලයේ සේවා නියමයන් හා කොන්දේසි ;

(ඇ) කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතනවල කාර්ය මණ්ඩලයට බඳවා ගැනීමේ පරිපාටි සහ පත් කිරීමේ ක්‍රම ;

(ඈ) උපාධි, අභිඥන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා විශ්වවිද්‍යාලවල අධ්‍යයන තත්ත්වයන් ඇති කිරීම හා පවත්වාගෙන යාම ;

(ඉ) උසස් අධ්‍යාපන ආයතනවල හා ඒවා අවට පහසුකම් සම්බන්ධීකරණය ;

(ඊ) විශ්වවිද්‍යාලවලින් සැපයිය හැකි හා සංවිධානය කළ හැකි ව්‍යාප්ති සේවාවල ස්වභාවය හා සීමාව ;

(උ) විදේශීය උපාධි හා අභිඥන පත්‍ර ද වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ද පිළිගැනීම ;

(ඌ) මෙහි මින් ඉහත සඳහන් කරන ලද කාරණා අතුරින් යම් කාරණයකට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ වෙනත් යම් කාරණයක්.

(3) කොමිෂන් සභාව විසින් මේ පනත යටතේ සාදනු ලබන සෑම නියමාවලියක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එහි සඳහන් දින සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

III වන කොටස

අමාත්‍යවරයාගේ බලතල

19. විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය පිළිබඳ සාමාන්‍ය මෙහෙයවීම සම්බන්ධයෙන් ද, මේ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ද අමාත්‍යවරයා වගකිව යුතු ය. අමාත්‍යවරයාගේ වගකීම.

20. (1) (අ) විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය සම්බන්ධයෙන් හා මේ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා සතු වගකීම ඵලදායී ලෙස ඉටු කිරීමට ඔහුට හැකි වන පරිදි, මුදල්, විශ්වවිද්‍යාලවල ශිෂ්‍යයන් සඳහා වෙන් කරනු ලබන ස්ථාන සංඛ්‍යාව හා ඉගැන්වීමේ මාධ්‍යය යනාදී කාරණා පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අනුව අවශ්‍ය යයි ඔහු සලකන සාමාන්‍ය ලිඛිත විධාන කොමිෂන් සභාවට කලින් කල නිකුත් කිරීම අමාත්‍යවරයා විසින් කළ හැකි වේ. ඒ සෑම විධානයක් ම හැකිතාක් ඉක්මණින් පාර්ලිමේන්තුව ඉදිරියේ සභාගත කළ යුතු ය. කොමිෂන් සභාව වෙත විධාන නිකුත් කිරීමට අමාත්‍යවරයා සතු බලය.

(ආ) කොමිෂන් සභාව ඒ විධාන අනුව ක්‍රියා කළ යුතු අතර ඒ විධාන අනුව කොමිෂන් සභාව විසින් ක්‍රියා කළ හැකිවන පරිදි අවශ්‍ය පහසුකම් හා තොරතුරු කොමිෂන් සභාවට හෝ එහි සාමාජිකයකුට හෝ නිලධරයකුට හෝ ලබා දීම හා සැපයීම උසස් අධ්‍යාපන ආයතනයක පාලක බලමණ්ඩලය විසින් කළ යුතු ය.

(2) (අ) විශ්වවිද්‍යාලයීය අධ්‍යාපනය සම්බන්ධයෙන් හා මේ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා සතු වගකීම ඵලදායී ලෙස ඉටු කිරීමට ඔහුට හැකිවන පරිදි යම් උසස් අධ්‍යාපන ආයතනයක කටයුතු සියල්ල හෝ ඉන් යම් කටයුත්තක් හෝ එහි පරිපාලනය විමර්ශනය කොට වාර්තා කරන ලෙස අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවට කලින් කල නියම කළ හැකි ය.

(ආ) කොමිෂන් සභාව විසින් ඒ නියමය අනුව ක්‍රියා කළ යුතු අතර ඒ නියමය අනුව කොමිෂන් සභාව විසින් ක්‍රියා කළ හැකි වන පරිදි අවශ්‍ය පහසුකම් හා තොරතුරු කොමිෂන් සභාවට හෝ එහි සාමාජිකයකුට හෝ නිලධරයකුට ලබා දීම හා සැපයීම ඒ නියමය අදාළ වන උසස් අධ්‍යාපන ආයතනයක පාලක බලමණ්ඩලය විසින් කළ යුතු ය.

(3) උසස් අධ්‍යාපන ආයතනයක පවත්නා තත්ත්වය රාජ්‍ය ආරක්ෂාවට අනතුරුදායක හෝ ජාතික ප්‍රතිපත්තියට පටහැනි හෝ හානිකර හෝ බවට අමාත්‍යවරයා සෑහීමට පත් වූ අවස්ථාවක, ඒ තත්ත්වය පාලනය කිරීම සඳහා අවශ්‍ය යයි තමා සලකන සියලු පියවර ගැනීමට අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවට විධාන කළ හැකි ය.

(4) යම් වර්ජනයක් හෝ පිටමං කිරීමක් හෝ වෙන යම් හේතුවක් නිසා උසස් අධ්‍යාපන ආයතනයක වැඩ කටයුතු හෝ පරිපාලනය බරපතල ලෙස අවුල් වී ඇති බවට සහ කටයුතු හා පරිපාලනය යථා තත්ත්වයට පත් කිරීමට ඒ උසස් අධ්‍යාපන ආයතනයේ බලමණ්ඩල අපොහොසත් වී ඇති බවට අමාත්‍යවරයා

සෑහීමට පත් වූ අවස්ථාවක, ඒ උසස් අධ්‍යාපන ආයතනයෙහි කටයුතු යථා තත්ත්වයට පත් කරනු පිණිස අවශ්‍ය වන සියලු ක්‍රියා මාර්ග අමාත්‍යවරයා විසින් ගත හැකි ය. යථා තත්ත්වයට පත් කරන තුරු අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ඒ උසස් අධ්‍යාපන ආයතනය සම්බන්ධ යෙන් පහත සඳහන් කාරණා සියල්ල හෝ ඉන් යම් කාරණයක් පිළිබඳව අවශ්‍ය යයි ඔහු සලකන සියලු විධිවිධාන සැලැස්විය හැකි ය:—

(අ) ඒ උසස් අධ්‍යාපන ආයතනය වසා දැමීම;

(ආ) ඒ උසස් අධ්‍යාපන ආයතනයේ යම් නිලධරයකු, බල මණ්ඩලයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් වෙනුවට, මේ පනත හෝ යම් උචිත සාධන පත්‍රයක් හෝ යටතේ වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ කාර්යය සඳහා නිසි බලධරයා වශයෙන් යම් තැනැත්තකු නමින් හෝ නිලයෙන් පත් කිරීම; සහ

(ඇ) ඉහත කී කාරණාවලට සම්බන්ධ වූ හෝ අදාළ වූ යම් කාරණයක්.

(5) අමාත්‍යවරයා විසින් (4) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නියමයක් එහි සඳහන් දිනයක ක්‍රියාත්මක වන්නේ ය. ඉන් පසු හැකිතාක් ඉක්මණින් එකී නියමය පාර්ලිමේන්තුව ඉදිරියේ සභාගත කළ යුතු අතර කලින් පරිච්ඡින්න කරනු ලැබුවහොත් මිස, එය ඉන් පසු මාස තුනක් නොඉක්මවන කාලයක් වලංගුව පවත්නේ ය.

IV වන කොටස

විශ්වවිද්‍යාල, මණ්ඩප හා විශ්වවිද්‍යාලයීය විද්‍යායතන

විශ්ව විද්‍යාලයක් පිහිටුවීම.

21. අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව විමසීමෙන් පසු, (මෙහි මින් මතු "විශ්වවිද්‍යාල නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින්—

(අ) නියමයෙහි සඳහන් කරනු ලබන සියලුම අධ්‍යයන ක්ෂේත්‍ර වල උසස් අධ්‍යාපනය ලබා දීමේ, දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු, විශ්ව විද්‍යාලයක් පිහිටුවනු ලැබිය හැකි ය;

(ආ) ඒ විශ්වවිද්‍යාලයට නමක් හා අභිධානයක් දිය හැකි ය;

(ඇ) ඒ විශ්වවිද්‍යාලයේ මූලස්ථානය පිහිටා තිබිය යුතු ප්‍රදේශය හෝ භූමි භාගය නියම කළ හැකි ය;

(ඈ) ඒ විශ්වවිද්‍යාලයට පීඨයක් හෝ පීඨ පැවරිය හැකි ය; තව ද

(ඉ) ඒ පීඨය හෝ පීඨ යම් අධ්‍යයන අංශවලින් සමන්විත විය යුත්තේ ද ඒ අංශ නියම කොට දැක්විය හැකි ය.

22. අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව විමසීමෙන් පසු, (මෙහි මින් මතු "මණ්ඩප නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින්— මණ්ඩපයක් පිහිටුවීම.

(අ) විශ්වවිද්‍යාලයක මණ්ඩපයක් පිහිටුවනු ලැබිය හැකි ය;

(ආ) ඒ මණ්ඩපයට නමක් හා අභිධානයක් දිය හැකි ය;

(ඇ) ඒ මණ්ඩපය අනුබද්ධ වූ විශ්වවිද්‍යාලයේ මූලස්ථානය පිහිටි ප්‍රදේශය හෝ භූමි භාගය නොවන්නා වූ ඒ මණ්ඩපය පිහිටා තිබිය යුතු ප්‍රදේශය හෝ භූමි භාගය නියම කළ හැකි ය;

(ඈ) ඒ මණ්ඩපයට පීඨයක් හෝ පීඨ පැවරිය හැකි ය; තවද

(ඉ) ඒ පීඨය හෝ පීඨ යම් අධ්‍යයන අංශවලින් සමන්විත විය යුත්තේ ද ඒ අධ්‍යයන අංශ නියම කොට දක්විය හැකි ය.

23. (1) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව විමසීමෙන් පසු (මෙහි මින් මතු "විවෘත විශ්වවිද්‍යාල නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින්— විවෘත විශ්වවිද්‍යාලයක් පිහිටුවීම.

(අ) 21 වන, 22 වන, 24 වන සහ 25 වන වගන්තිවල සඳහන් ආයතන අතුරින් යම් ආයතනයක ශිෂ්‍යයන් නොවන තැනැත්තන්ට උසස් අධ්‍යාපන පහසුකම් සලස්වා දීමේ කාර්යය සඳහා අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු විවෘත විශ්වවිද්‍යාලයක් පිහිටුවනු ලැබිය හැකි ය;

(ආ) ඒ විවෘත විශ්වවිද්‍යාලයට නමක් හා අභිධානයක් දිය හැකි ය; තව ද

(ඇ) ඒ විවෘත විශ්වවිද්‍යාලයේ මූලස්ථානය පිහිටා තිබිය යුතු ප්‍රදේශය හෝ භූමි භාගය නියම කළ හැකි ය.

(2) විවෘත විශ්වවිද්‍යාලයේ සැකැස්ම හා බලතල, කාර්ය සහ කර්තව්‍ය නියමාවලි මගින් නියම කළ යුතු ය.

24. අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව විමසීමෙන් පසු (මෙහි මින් මතු "විශ්වවිද්‍යාලයීය විද්‍යායතන නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින්— විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් පිහිටුවීම.

(අ) නියමයෙහි සඳහන් කරනු ලබන සියලුම අධ්‍යයන ක්ෂේත්‍ර වල උසස් අධ්‍යාපනය ලබා දීමේ, දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් පිහිටුවනු ලැබිය හැකි ය;

(ආ) ඒ විද්‍යායතනයට නමක් හා අභිධානයක් දිය හැකි ය;

(ඇ) ඒ විද්‍යායතනයෙහි මූලස්ථානය පිහිටා තිබිය යුතු ප්‍රදේශය හෝ භූමි භාගය නියම කළ හැකි ය;

(ඈ) ඒ විද්‍යායතනයට පීඨයක් හෝ පීඨ පැවරිය හැකි ය;

(ඉ) ඒ පීඨය හෝ පීඨ යම් අධ්‍යයන අංශවලින් සමන්විත විය යුත්තේ ද ඒ අධ්‍යයන අංශ නියම කොට දැක්විය හැකි ය;

(ඊ) ඒ විද්‍යායතනය අනුබද්ධ විය යුත්තේ යම් විශ්වවිද්‍යාලයකට හෝ විශ්වවිද්‍යාලවලට ද ඒ විශ්වවිද්‍යාලය හෝ විශ්වවිද්‍යාල නියම කොට දැක්විය හැකි ය.

අනුමත කරනු ලැබූ අධ්‍යයන පාඨමාලා පැවැත්වීම සඳහා පවත්නා ආයතන පිළිගැනීම.

25. කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හා නියමාවලි මගින් නියම කරනු ලබන කොන්දේසිවලට යටත් ව, විශ්වවිද්‍යාලයක විභාග සඳහා අනුමත කරනු ලැබූ අධ්‍යයන පාඨමාලා පැවැත්වීමේ කාර්යය සඳහා ආයතන පිළිගත හැකි ය.

21 වන, 22 වන, 23 වන සහ 24 වන වගන්ති යටතේ සෑම නියමයක් ම පාර්ලිමේන්තුව ඉදිරියේ සභාගත කළ යුතු බව.

26. සෑම විශ්වවිද්‍යාල නියමයක්, මණ්ඩප නියමයක්, විවෘත විශ්වවිද්‍යාල නියමයක් හා විශ්වවිද්‍යාලයීය විද්‍යායතන නියමයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය. ඒ එක් එක් නියමය එහි සඳහන් දිනයෙහි ක්‍රියාත්මක වන අතර ඉන් පසු හැකිතාක් ඉක්මණින් එය පාර්ලිමේන්තුව ඉදිරියේ සභාගත කළ යුතු ය.

21 වන, 22 වන, 23 වන හෝ 24 වන වගන්ති යටතේ නියමය වෙනස් කිරීම.

27. (1) විශ්වවිද්‍යාල නියමයක්, මණ්ඩප නියමයක්, විවෘත විශ්වවිද්‍යාල නියමයක් හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතන නියමයක්, කොමිෂන් සභාවේ නිර්දේශය පිට අමාත්‍යවරයා විසින් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ සෑම නියමයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය. ඒ එක් එක් නියමය එහි සඳහන් දිනයෙහි ක්‍රියාත්මක වන අතර, ඉන් පසු හැකිතාක් ඉක්මණින් එය පාර්ලිමේන්තුව ඉදිරියේ සභාගත කළ යුතු ය.

V වන කොටස

විශ්වවිද්‍යාලයක බලතල, කාර්ය හා කර්තව්‍ය

විශ්වවිද්‍යාල නියමය හා විශ්වවිද්‍යාලයක සාමාන්‍ය බලතල.

28. (1) 21 වන වගන්තිය යටතේ කරනු ලැබූ විශ්වවිද්‍යාල නියමයක් ක්‍රියාත්මක වූ පසු ඒ නියමයෙන් ඒ විශ්වවිද්‍යාලයට දෙනු ලැබූ නම හා අභිධානය ඇතිව විශ්වවිද්‍යාලයක් පිහිටුවනු ලැබූ ලෙස සැලකිය යුතු ය. ඒ විශ්වවිද්‍යාලයට පහත සඳහන් කටයුතු කිරීමට සම්පූර්ණ බලය හා අධිකාරය ඇත්තේ ය:—

(අ) ඒ නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරීම හා විරුද්ධව නඩු පවරනු ලැබීම;

(ආ) ස්වකීය අභිමතය පරිදි මුද්‍රාව වෙනස් කිරීම;

(ඇ) චංචල හෝ නිශ්චල යන දෙවර්ගයේ ම දේපළ, මිලට ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම සහ එකී මිලට ගැනීමක් ප්‍රකාර හෝ ප්‍රදානයකින් හෝ ත්‍යාගයකින්, බද්දකින්, අන්තිම කැමති පත්‍රයක් මගින් වූ දීමනාවකින් හෝ අන්‍යාකාරයකින් එය වෙත පැවරෙන එකී දේපළක් ගැනීම, භාර ගැනීම සහ අයත්ව සිටීම;

(ඈ) එකී දේපළක් විකිණීම, උකස් කිරීම බදු දීම, හුවමාරු කර ගැනීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම:

එසේ වුව ද යම් දේපළක් විශ්වවිද්‍යාලය වෙත පවරනු ලැබුවේ යම් නීතියක්, උචිත සාධන පත්‍රයක් හෝ නියමයක් මගින් ද ඒ නීතියෙන්, සාධන පත්‍රයෙන් හෝ නියමයෙන් ඇති කරන ලද සීමා කිරීමක්, කොන්දේසියක් හෝ තහනම් කිරීමක් කඩ කරමින් එකී දේපළ විකුණන ලද්දේ නම්, උකස් කරන ලද්දේ නම්, බදු දෙන ලද්දේ නම්, හුවමාරු කරන ලද්දේ නම් හෝ අන්‍යාකාරයකින් බැහැර කරන ලද්දේ නම්, ඒ විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම හෝ බැහැර කිරීම නිෂ්ඵල වන්නේ ය; තව ද

(ඉ) මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් විශ්වවිද්‍යාලය වෙත පවරනු ලැබ හෝ නියම කරනු ලැබූ සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම.

(2) මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් අන්‍යාකාර විධිවිධාන ප්‍රකාශිතව ම සලස්වා ඇත්තේ නම් මිස, මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධානවලින් විශ්වවිද්‍යාලයක් වෙත පවරනු ලැබූ බලතල විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

විශ්වවිද්‍යාලයක බලතල.

29. කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍යවලට යටත්ව, විශ්වවිද්‍යාලයකට පහත සඳහන් කටයුතු කිරීමට බලය ඇත්තේ ය:—

(අ) ශිෂ්‍යයන් ඇතුල් කර ගැනීම හා අනුමත කරන ලද යම් අධ්‍යයන ක්ෂේත්‍රයක ඉගැන්වීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ආ) විවිධ අධ්‍යයන ක්ෂේත්‍රවල ප්‍රවීණත්වය ලැබූ තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්යය සඳහා විභාග පැවැත්වීම;

(ඇ) විශ්වවිද්‍යාලයේ පරමාර්ථවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ පිටරට වෙනත් විශ්වවිද්‍යාල හෝ ආයතන සමග, ආචාර්යවරයන්, ශිෂ්‍යයන් හා ශාස්ත්‍රධරයන් හුවමාරු කර ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් සහයෝගයෙන් ක්‍රියා කිරීම;

(ඈ) පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම හා ඒ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ හෝ පිට රට වෙනත් විශ්වවිද්‍යාල හෝ බලධරයන් සමග විශ්වවිද්‍යාලය විසින් තීරණය කරන ආකාරයකින් හා එසේ තීරණය කරන කාර්ය සඳහා සහයෝගයෙන් ක්‍රියා කිරීම;

(ඉ) විශ්වවිද්‍යාලයෙහි හෝ යම් පිළිගත් ආයතනයක අනුමත කරන ලද පාඨමාලා සඳහා විශ්වවිද්‍යාලයෙහි අතුරු ව්‍යවස්ථාවකින් නියමිත විභාගවලින් සාමාර්ථය ලැබූ තැනැත්තන්ට හා තැනැත්තන් වෙත උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීම හා පිරිනැමීම ;

(ඊ) විශ්වවිද්‍යාලයෙහි හෝ යම් පිළිගත් ආයතනයක ශිෂ්‍යයන් නොවන තැනැත්තන්ට විශ්වවිද්‍යාලයේ උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ලබා ගැනීමට හැකි වන පරිදි, කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, බාහිර විභාග පැවැත්වීම ;

(උ) විශ්වවිද්‍යාලයෙහි හෝ යම් පිළිගත් ආයතනයක ශිෂ්‍යයන්ව නොසිටිමින් විශ්වවිද්‍යාලයේ බාහිර විභාගවලින් සාමාර්ථය ලැබූ තැනැත්තන්ට උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා, කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, ප්‍රදානය කිරීම හා පිරිනැමීම ;

(ඌ) අතුරු ව්‍යවස්ථාවකින් නියම කරනු ලැබිය හැකි කොන්දේසි පිට වෙනත් විශ්වවිද්‍යාලවල උපාධිධාරීන් හෝ ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලයේ සම තත්ත්වයේ හෝ සමාන උපාධිවලට හා පාඨමාලාවලට ඇතුල් කර ගැනීම හා ඔවුන් විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් හා ශිෂ්‍යයන් ලෙස ලියාපදිංචි කිරීම ;

(එ) විශ්වවිද්‍යාලයක සභාපති සභාව විසින් නිර්දේශ කරනු ලැබ ඒ විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අනුමත කරන ලද තැනැත්තන්ට සම්මාන උපාධි හෝ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා පිරිනැමීම ;

(ඒ) අතුරු ව්‍යවස්ථාවකින් නියම කරනු ලැබිය හැකි පරිදි, විශ්වවිද්‍යාලයට ඇතුල්වීමට අපේක්ෂා කරන තැනැත්තන් හෝ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් වෙනත් විශ්වවිද්‍යාලවල දී හෝ විශ්වවිද්‍යාල තත්ත්වයේ අධ්‍යාපන ආයතනවල දී සාමාර්ථය ලත් විභාග හා ගත කළ අධ්‍යයන කාල සීමාව විශ්වවිද්‍යාලයේ එවැනි විභාගවලට හා එවැනි අධ්‍යයන කාල සීමාවලට හෝ, ඉන් යම් කොටසකට සමාන ලෙස පිළිගැනීම හා ඕනෑම අවස්ථාවක ඒ පිළිගැනීම ඉවත් කර ගැනීම ;

(ඔ) විශ්වවිද්‍යාලයේ කාර්ය සඳහා පුස්තකාල, රසායනාගාර හා වෙනත් ගොඩනැගිලි ඉගැන්වීමේ හෝ පදිංචිවීමේ කාර්ය සඳහා ඉදි කිරීම, ඒවාට උපකරණ සැපයීම හා ඒවා පවත්වා ගෙන යාම ;

(ඕ) මහාචාර්ය තනතුරු, සහාය මහාචාර්ය තනතුරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු හෝ කථිකාචාර්ය තනතුරු හා විශ්වවිද්‍යාලයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් තනතුරු ඇති කිරීම ;

(ක) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග ඇති කිරීම හා ප්‍රදානය කිරීම ;

(ග) විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ හා ආචාර්යවරයන්ගේ, නිලධරයන්ගේ හා වෙනත් සේවකයන්ගේ වාසය, විනය හා ශුභ සිද්ධිය විධිමත් කිරීම හා ඒ සඳහා විධිවිධාන සැලැස්වීම ;

(ච) නේවාසිකාගාර පිහිටුවා පාලනය කිරීම, ශිෂ්‍යයන්ට නේවාසික පහසුකම් සලස්වන වාසස්ථාන සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ වාසය පිණිස අවශ්‍ය විය හැකි වෙනත් එවැනි සේවා හා පහසුකම් සැලැස්වීම ;

(ජ) ණය ලබා දීම සඳහා විධිවිධාන සලස්වන අතුරු ව්‍යවස්ථා අනුව විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ට බැංකුවලින් හා වෙනත් ආයතනවලින් ණය ලබා ගැනීමට සහාය වීම ;

(ට) සේවකයන් හා පාඨශාලා හැරයන්නවුන් ඇතුළු පොදු මහජනතාව උදෙසා කර්මාන්තවල හා කාර්මික ව්‍යාපාරවල ව්‍යාප්ති සේවා සඳහා විධිවිධාන, ඒ සඳහා විධිවිධාන සලස්වන යම් අතුරු ව්‍යවස්ථා අනුව, සැලැස්වීම ;

(ඩ) පාඨමාලා හෝ පාඨමාලාවල කොටස් විශ්වවිද්‍යාලයෙන් බාහිර වූ අධ්‍යාපන ආයතනවල පැවැත්වීමට කටයුතු, ඒ සඳහා විධිවිධාන සලස්වන අතුරු ව්‍යවස්ථා අනුව, පිළියෙල කිරීම ;

(ණ) ගාස්තු ඉල්ලීම හා භාර ගැනීම සඳහා විධිවිධාන සලස්වන යම් නියෝගයක් අනුව ගාස්තු ඉල්ලීම හා භාර ගැනීම ; සහ

(ත) විශ්වවිද්‍යාලයේ පරමාර්ථ ඉටු කර ගැනීම පිණිස අවශ්‍ය විය හැකි, ඉහත සඳහන් බලතලවලට ආනුෂංගික වූ හෝ නොවූ වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම.

30. 20 වන වගන්තියේ (ඇ) ඡේදයේ හා 31 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන්නා වූ හෝ ශ්‍රී ලංකාවේ නිත්‍යානුකූලව වෙසෙන්නා වූ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ම සියලු තැනැත්තන්ට, ඔවුන් කවර ජාතියකට, ආගමකට හෝ පන්තියකට අයත් වුව ද, විශ්වවිද්‍යාලයක් විවෘතව ඇත්තේ ය. එකී යම් තැනැත්තකුට විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයකු හෝ ශිෂ්‍යයකු වශයෙන් ඇතුල්වීමට හෝ එහි යම් තනතුරක් දැරීමට හෝ විශ්වවිද්‍යාලයෙන් යම් උපාධියක් ලැබීමට හෝ විශ්වවිද්‍යාලයෙන් යම් වාසියක් ලබා ගැනීමට නැතහොත් එහි වරප්‍රසාද භුක්ති විඳීමට හිමිකම ලබා දීම සඳහා ආගමික ඇදහීම හෝ මතය පිළිබඳ කිසිම පරීක්ෂණයක් ඇති කිරීම හෝ නියම කිරීම නො කළ යුතු ය. ජාතිය, ඇදහීම, පංතිය හෝ ආගම පිළිබඳ වෙනස්කම් නහනම් බව.

31. විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් ඒ කාර්ය සඳහා අනුමත කරනු ලැබූ තැනැත්තන් විසින් ආගම ඉගෙනීමට කැමති තැනැත්තන්ට අතුරු ව්‍යවස්ථාවලින් නියම කළ හැකි ආකාරයට විශ්වවිද්‍යාලයක දී ආගම ඉගැන්වීම 30 වන වගන්තියේ විධිවිධානවල ඇති කිසිවකින් වලක්වනු ලබන සේ නොසැලකිය යුතු ය ; නැතහොත් එසේ වටහා නොගත යුතු ය. 30 වන වගන්තිය අදාළ වීම පිළිබඳ ගැනුම් සීමා කිරීම.

VI වන කොටස

විශ්වවිද්‍යාලවල කුලපතිවරු හා නිලධරයෝ

කුලපති වරයා.

32. එක් එක් විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා ජනාධිපතිවරයා විසින් නම් කළ යුතු ය. කුලපතිවරයා විශ්වවිද්‍යාලයේ ප්‍රධානයා වන අතර, තමාගේ පත්වීම ලැබූ දින සිට අවුරුදු පහක කාල සීමාවක් ඔහු ධුරය දරන්නේ ය. තව ද පැමිණ සිටින විට ඔහු උත්තර මණ්ඩලයේ යම් රැස්වීමක හා විශ්වවිද්‍යාලයේ යම් උපාධි ප්‍රදානෝත්සවයක මූලසුන දරන්නේ ය.

විශ්ව විද්‍යාලයේ නිලධරයෝ.

33. පහත සඳහන් තැනැත්තෝ විශ්වවිද්‍යාලයක නිලධරයෝ වන්නාහ :—

(i) උප කුලපතිවරයා ;

(ii) නියෝජ්‍ය උප කුලපතිවරයකු වෙතොත් ඔහු ;

(iii) මණ්ඩප වෙතොත් ඒ එක් එක් මණ්ඩපයේ මණ්ඩපාධිපතිවරයා ;

(iv) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;

(v) ලේඛකාධිකාරිවරයා ;

(vi) පුස්තකාලයාධිකාරිවරයා ;

(vii) මූල්‍යාධිකාරිවරයා ; සහ

(viii) වෙනත් යම් තනතුරක් දරන තැනැත්තකු මේ වගන්තියෙහි කාර්ය සඳහා නිලධරයකු බව නියමාවලි මඟින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ ද එකී තනතුරක් දරන තැනැත්තා.

උප කුලපති වරයා.

34. (1) (අ) මේ වගන්තියේ (7) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, විශ්වවිද්‍යාලයක උප කුලපතිවරයා, ඒ විශ්වවිද්‍යාලයේ උත්තර මණ්ඩලය විසින් තෝරා ගනු ලැබූ පසු වර්ෂ තුනක කාලයක් සඳහා කුලපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය. ඔහුගේ අවසාන ධුර කාලය සම්පූර්ණ කිරීමේ දින සිට වර්ෂ තුනක කාලයක් ඉකුත් වීමෙන් පසු ඔහු නැවත තෝරා ගනු ලැබුවේ නම් මිස, උප කුලපතිවරයා වශයෙන් ඒ විශ්වවිද්‍යාලයට ම නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් නොවන්නේ ය. උප කුලපතිවරයකු තෝරා ගැනීමේ කාර්ය පරිපාටිය නියමාවලි මඟින් නියම කරනු ලැබිය යුතු ය.

(ආ) දෝෂාරෝපණ යෝජනාවක් සම්මත කර ගැනීමේ කාර්යය සඳහා කැඳවනු ලබන උත්තර මණ්ඩලයේ විශේෂ රැස්වීමක දී උත්තර මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කර ගනු ලබන දෝෂාරෝපණ යෝජනාවක් මත විශ්වවිද්‍යාලයක උප කුලපතිවරයා, කුලපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(2) උප කුලපතිවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණ කාල නිලධරයකු වන අතර, ඔහු එහි ප්‍රධාන විධායක හා ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා වන්නේ ය. ඔහු නිල බලයෙන් උත්තර මණ්ඩලයේ සාමාජිකයකු

වන අතර, නිල බලයෙන් පාලක සභාව හා සනාතන සභාව යන සභා දෙකෙහි ම සාමාජිකයෙක් හා සභාපතිවරයා ද වන්නේ ය. කුලපතිවරයා නොමැති විට උප කුලපතිවරයා උත්තර මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. විශ්වවිද්‍යාලයේ වෙන යම් බල මණ්ඩලයක නැතහොත් වෙන යම් මණ්ඩලයක යම් රැස්වීමක් කැඳවීමට, එහි පැමිණ සිටීමට හා එහි දී කථා කිරීමට ඔහුට හිමිකම් ඇති නමුත් ඒ වෙන යම් බල මණ්ඩලයේ හෝ මණ්ඩලයේ සාමාජිකයෙක් වන්නේ නම් මිස, එකී යම් රැස්වීමක දී ඡන්දය දීමට ඔහුට හිමිකම් නොමැත්තේ ය.

(3) පාලක සභාව විසින් කලින් කල නීත්‍යානුකූලව තමා වෙත නිකුත් කරනු ලැබිය හැකි නියමයන් අනුව මේ පනතෙහි හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන යථා පරිදි පිළිපැදීම ගැන වගබලා ගැනීම උප කුලපතිවරයාගේ කාර්යය වන්නේ ය. තව ද ඒ කාර්යය සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන සියලු බලතල ඔහුට ඇති අතර, ඔහුට ඒ බලතල ක්‍රියාත්මක කළ හැකි ය.

(4) මේ පනතේ විධිවිධානවලට යටත්ව, පාලක සභාවේ හා සනාතන සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරන බවට වගබලා ගැනීම උප කුලපතිවරයාගේ කාර්යය වන්නේ ය.

(5) උප කුලපතිවරයා විශ්වවිද්‍යාලයේ ගණන් දීමේ නිලධරයා වන්නේ ය.

(6) විශ්වවිද්‍යාලයක් තුළ විනය පවත්වා ගැනීම ගැන උප කුලපතිවරයා වග කිව යුතු ය.

(7) උප කුලපතිවරයා, ඔහු කලින් ධුරය අත්හැර ගියහොත් හෝ මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස, වර්ෂ තුනක කාල සීමාව හෝ හැට පස් වන විය හෝ සම්පූර්ණ කිරීම යන මෙයින් කලින් එළඹෙන අවස්ථාව තෙක් ඔහු ධුරය දරන්නේ ය.

(8) නිවාඩු පිට සිටීම, රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙන යම් හේතුවක් නිසා හෝ තම ධුරයේ කටයුතු ඉටු කිරීමට උප කුලපතිවරයාට තාවකාලිකව නොහැකි වුවහොත්, එසේ කටයුතු ඉටු කිරීමට නොහැකි වූ දින සිට දින හතක කාලයක් ඇතුළත ඒ ධුරයේ කටයුතු ඉටු කිරීම සඳහා සුදුසු යයි කොමිෂන් සභාවට හැඟෙන වැඩ පිළිවෙළක් කොමිෂන් සභාව විසින් යෙදිය යුතු ය. එතෙක් ලේඛකාධිකාරිවරයා විසින් ඒ ධුරයේ එදිනෙදා කටයුතු කර ගෙන යා යුතු ය.

(9) උප කුලපති ධුරයෙහි යම් පුරප්පාඩුවක් ඇති වුවහොත්, ඒ පුරප්පාඩුව ඇති වී දින හතක් ඇතුළත ඒ ධුරයේ කටයුතු ඉටු කිරීමට මේ වගන්තියේ මීට පූර්වයෙන් වූ විධිවිධාන යටතේ ස්ථිර පත්වීමක් කරන තෙක්, සුදුසු යයි කොමිෂන් සභාවට හැඟෙන වැඩ පිළිවෙළක් යෙදිය යුතු ය; තව ද එවැනි වැඩ පිළිවෙළක් කොමිෂන් සභාව විසින් යොදන තෙක්, ලේඛකාධිකාරිවරයා විසින් ඒ ධුරයේ එදිනෙදා කටයුතු කරගෙන යා යුතු ය.

නියෝජ්‍ය උප කුලපති වරයා.

35. විශ්වවිද්‍යාලයක පාලක සභාව විසින්, එහි අභිමතය පරිදි හා කොමිෂන් සභාවේ පූර්ව අනුමතය ඇතිව, නියෝජ්‍ය උප කුලපති වරයකු පත් කළ හැකි ය. නියෝජ්‍ය උප කුලපතිවරයකු පත් කිරීම සඳහා වූ කාර්ය පරිපාටිය හා ඔහුගේ බලතල, කාර්ය හා කර්තව්‍ය නියමාවලි මගින් නියම කරනු ලැබිය යුතු ය.

මණ්ඩපයක අධිපතිවරයා.

36. (1) මණ්ඩපයක් අනුයුක්ත කොට ඇත්තේ යම් විශ්ව විද්‍යාලයකට ද ඒ විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා විසින් ඒ මණ්ඩපයේ අධිපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය. ඔහු ධුර දැරීම කලින් අවසන් වුවහොත් මිස, ඔහු පත් කරනු ලැබුවේ යම් දිනයක සිට ද එදින සිට තුන් අවුරුදු කාලයක් ධුරය දරන්නේ ය. ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, ඉහත කී කාලයට ඉක්බිතිව ම එළඹෙන වැඩි දුරටත් වූ තුන් අවුරුදු කාලයක් සඳහා නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය.

(2) නිවාඩු පිට සිටීම, රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙන යම් හේතුවක් නිසා හෝ තම ධුරයේ කටයුතු ඉටු කිරීමට, මණ්ඩපාධිපතිවරයාට තාවකාලිකව නොහැකි වුවහොත් එසේ කටයුතු ඉටු කිරීමට නොහැකි වූ දින සිට දින හතක කාලයක් ඇතුළත, ඒ ධුරයේ කටයුතු ඉටු කිරීම සඳහා, උප කුලපතිවරයා විසින් සුදුසු යයි කල්පනා කරන වැඩ පිළිවෙලක් ඔහු විසින් යෙදිය යුතු ය. එවැනි වැඩ පිළිවෙලක් යොදන තෙක් ලේඛකාධිකාරිවරයා විසින් ඒ ධුරයේ එදිනෙදා කටයුතු කරගෙන යා යුතු ය.

(3) මණ්ඩපාධිපතිවරයා, මණ්ඩපයේ පූර්ණ කාල නිලධරයකු වන අතර මණ්ඩපයේ ශාස්ත්‍රීය හා පරිපාලන ප්‍රධානයා වන්නේ ය.

(4) මණ්ඩපාධිපතිවරයා මණ්ඩප සභාවේ සභාපතිවරයා වන්නේ ය.

(5) උප කුලපතිවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව මණ්ඩපයෙහි විනය පවත්වා ගෙන යාම මණ්ඩපාධිපති වරයාගේ වගකීම වන්නේ ය.

ලේඛකාධිකාරි වරයා.

37. (1) නියමාවලි මගින් සංයුතිය නියම කළ තෝරා ගැනීමේ කමිටුවක නිර්දේශය පිට පාලක සභාව විසින් විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරිවරයා පත් කළ යුතු ය. ඔහු ඒ විශ්වවිද්‍යාලයේ පූර්ණ කාල නිලධරයකු වන අතර මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් ඔහු වෙත පවරනු ලබන හා නියම කරනු ලබන බලතල, කාර්ය හා කර්තව්‍ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(2) විශ්වවිද්‍යාලයේ වාර්තා හා දේපළ භාරව සිටීම ගැන ලේඛකාධිකාරිවරයා වගකිව යුතු ය.

(3) ලේඛකාධිකාරිවරයා නිල බලයෙන් උත්තර මණ්ඩලයේ, පාලක සභාවේ සහ සනාතන සභාවේ ලේකම්වරයා වන්නේ ය.

(4) ලේඛකාධිකාරිවරයා විශ්වවිද්‍යාලයේ සහකාර ගණන් දීමේ නිලධරයා වන්නේ ය.

(5) උප කුලපතිවරයාගේ විධානයට හා පාලනයට යටත්ව විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විනය පාලනය සම්බන්ධයෙන් ලේඛකාධිකාරිවරයා වගකිව යුතුය.

38. (1) නියමාවලි මගින් සංයුතිය නියම කළ තෝරා ගැනීමේ කමිටුවක නිර්දේශය පිට පාලක සභාව විසින් විශ්වවිද්‍යාලයක මූල්‍යාධිකාරිවරයා පත් කළ යුතු ය. ඔහු ඒ විශ්වවිද්‍යාලයේ පූර්ණ කාල නිලධරයකු වන අතර මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් හෝ ඔහු වෙත පවරනු ලැබූ හා නියම කරනු ලැබූ බලතල, කාර්ය හා කර්තව්‍ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය. මූල්‍යාධිකාරිවරයා.

(2) ලේඛකාධිකාරිවරයාගේ විධානයට හා පාලනයට යටත්ව විශ්වවිද්‍යාලයේ මුදල් පරිපාලනය සම්බන්ධයෙන් මූල්‍යාධිකාරිවරයා වගකිව යුතු අතර, නියමාවලියෙන් නියම කරනු ලැබිය හැකි ආකාරයට හා පිළිවෙළට එහි ගණන් ඔහු විසින් පවත්වා ගෙන යා යුතු ය. විශ්වවිද්‍යාලයේ අරමුදල් ඔහු භාරයේ තිබිය යුතු ය.

39. (1) නියමාවලි මගින් සංයුතිය නියම කළ තෝරා ගැනීමේ කමිටුවක නිර්දේශය පිට පාලක සභාව විසින් විශ්වවිද්‍යාලයක පුස්තකාලයාධිකාරිවරයා පත් කළ යුතු ය. ඔහු ඒ විශ්වවිද්‍යාලයේ පූර්ණ කාල නිලධරයකු වන අතර මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් හෝ ඔහු වෙත පවරනු ලැබූ හා නියම කරනු ලැබූ බලතල, කාර්ය හා කර්තව්‍ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය. පුස්තකාලයාධිකාරිවරයා.

(2) උප කුලපතිවරයාගේ විධානයට හා පාලනයට යටත්ව විශ්වවිද්‍යාලයේ පුස්තකාලයේ හෝ පුස්තකාලවල පරිපාලනය සම්බන්ධයෙන් පුස්තකාලයාධිකාරිවරයා වගකිව යුතු ය.

VII වන කොටස

විශ්වවිද්‍යාලයක බලමණ්ඩල

40. විශ්වවිද්‍යාලයක බලමණ්ඩල පහත දැක්වේ :— විශ්වවිද්‍යාලයක බලමණ්ඩල.

(i) උත්තර මණ්ඩලය ;

(ii) පාලක සභාව ;

(iii) සනාතන සභාව ;

(iv) මණ්ඩප සභාවක් හෝ සභා හෝ වෙතොත්, එය හෝ ඒවා ;

(v) පීඨය හෝ පීඨ ;.

(vi) නියමාවලි මගින් බලමණ්ඩල වශයෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් මණ්ඩල.

උත්තර මණ්ඩලය.

41. (1) (මෙහි මින් මතු "උත්තර මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාලයක, උත්තර මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය:—

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකවරු:—

(i) කුලපතිවරයා;

(ii) උප කුලපතිවරයා;

(iii) නියෝජ්‍ය උප කුලපතිවරයකු වෙතොත්, ඒ නියෝජ්‍ය උප කුලපතිවරයා;

(iv) පාලක සභාවේ සාමාජිකවරු;

(v) මණ්ඩප වෙතොත් ඒ එක් එක් මණ්ඩපයේ අධිපතිවරයා;

(vi) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා.

(ආ) තෝරා පත්කර ගනු ලබන සාමාජිකවරු:—

(i) ඒ ඒ පීඨයේ සනාතන සභාවේ සාමාජිකයන් ද වන්නා වූ සාමාජිකයන් අතුරින් එක් එක් පීඨයෙන් තෝරා ගනු ලබන එක් සාමාජිකයෙක්;

(ii) සනාතන සභාවේ සාමාජිකයන් නොවන්නා වූ විශ්වවිද්‍යාලයේ සියලුම ස්ථිර ආචාර්යවරයන් විසින් තෝරා ගනු ලබන්නා වූ විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙක්;

(iii) විශ්වවිද්‍යාලයේ පරිපාලන කාර්ය මණ්ඩලය විසින් තෝරා ගනු ලබන සාමාජිකයකු හා විශ්වවිද්‍යාලයේ අනෙක් අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් තෝරා ගනු ලබන සාමාජිකයකු වශයෙන් සාමාජිකයන් දෙදෙනෙක්;

(iv) විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සභාව විසින් තම සාමාජිකයන් අතුරින් තෝරා ගනු ලබන ශිෂ්‍යයන් දෙදෙනෙක්;

(v) පාර්ලිමේන්තුව විසින් එහි මන්ත්‍රීවරයන් අතුරින් තෝරා ගනු ලබන මන්ත්‍රීවරයන් හය දෙනෙක්;

(vi) කොමිෂන් සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලබන වෘත්තීය හා සංස්කෘතික ආයතන අවක් අතුරින් එක් එක් ආයතනය විසින් තම සාමාජිකයන් අතුරින් තෝරා ගනු ලබන එක් සාමාජිකයෙක්.

(2) තෝරා ගනු ලැබූ එක් එක් සාමාජිකයා ඔහු තෝරා ගනු ලැබූ දින සිට තුන් වර්ෂයක් නොඉක්ම විය යුතු කාලයක් ධුරය දරන්නේ ය. එසේ වුව ද උත්තර මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තෝරා ගනු ලැබීමට ඔහු සුදුස්සකු වූයේ යම් තත්ත්වයක් නැත හොත් සාමාජිකත්වයක් අනුව ද ඒ තත්ත්වය හෝ සාමාජිකත්වය දරන තාක් පමණක් ඔහු තම සාමාජිකත්වය දරන්නේ ය.

42. (1) උප කුලපතිවරයා විසින් නියම කරනු ලබන දිනයක උත්තර මණ්ඩලයේ වාර්ෂික රැස්වීමක් පැවැත්විය යුතු ය. උත්තර මණ්ඩලයේ රැස්වීම්.

(2) අවශ්‍ය යයි තමා අදහස් කරන කවර අවස්ථාවක හෝ උත්තර මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවකගෙන් ලිඛිත අභියාචනයක් ලැබී සති දෙකක් ඇතුළත උප කුලපතිවරයා විසින් උත්තර මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

(3) උත්තර මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකින් සමන්විත වන්නේ ය.

(4) උත්තර මණ්ඩලයේ යම් රැස්වීමක විභාග හා ඊට සම්බන්ධ කරුණුවලට අදාළ කටයුතුවලින් 41 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ආ) ඡේදයේ (iv) වන විෂය යටතේ තෝරා පත් කරනු ලැබූ සාමාජිකයන් බැහැර කළ යුතු අතර එසේ බැහැර කරනු ලැබුවේ වුව ද, ඒ රැස්වීම් යථා පරිදි පවත්වනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

43. මේ පනතේ විධිවිධානවලට යටත්ව, උත්තර මණ්ඩලය විසින් පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය :— උත්තර මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය.

(අ) ලිඛිත ව්‍යවස්ථා සෑදීම හා එසේ සාදන ලද ලිඛිත ව්‍යවස්ථා, ලිඛිත ව්‍යවස්ථා මගින් සංශෝධනය කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම ;

(ආ) උප කුලපතිවරයා තෝරා පත්කර ගැනීම හා ඔහු එම ධුරයෙන් පහ කිරීම යෝග්‍ය යයි අදහස් කරන්නේ නම්, එසේ කරන ලෙස කුලපතිවරයා වෙත නිර්දේශ කිරීම ;

(ඇ) පාලක සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා සලකා බැලීම හා අවශ්‍ය නම් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම ;

(ඈ) විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගණන් සලකා බැලීම් හා අවශ්‍ය නම් ඒවා සංශෝධනය කිරීම හෝ පිළිගැනීම :

එසේ වුව ද ඒ පිළිබඳව පාලක සභාවේ මතය පළමුවෙන් ලබා ගෙන ඇත්තේ නම් මිස, එවැනි සංශෝධන නොකළ යුතු ය ; තවද

(ඉ) උත්තර මණ්ඩලයට මේ පනතින් හෝ මේ පනත යටතේ කරනු ලැබූ නියමයකින්, සාදනු ලැබූ නියමාවලියකින් හෝ ලිඛිත ව්‍යවස්ථාවකින් බලය පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ වෙන යම් ක්‍රියාවක් කිරීම හෝ වෙන යම් කාර්යයක් ඉටු කිරීම.

44. (1) (මෙහි මින් මතු "පාලක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාලයක පාලක සභාව විශ්වවිද්‍යාලයේ විධායක මණ්ඩලය හා පාලක බල මණ්ඩලය වන අතර එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය :— පාලක සභාව.

(i) උප කුලපතිවරයා ;

(ii) මණ්ඩපයක් වෙතොත් එහි මණ්ඩපාධිපතිවරයා ;

(iii) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;

(iv) සනාතන සභාව විසින් තම සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් තිදෙනෙක් ; සහ

(v) ඉහත සඳහන් (i) වන, (ii) වන, (iii) වන සහ (iv) වන ඡේද යටතේ වූ මුළු සාමාජික සංඛ්‍යාවට තුනක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාවට සමාන සාමාජික සංඛ්‍යාවක්. ඒ සාමාජිකයන් සියලු දෙනාම අධ්‍යාපන, වෘත්තීය, වාණිජ, කාර්මික, විද්‍යාත්මක හෝ පරිපාලන ක්ෂේත්‍රයන් හි විශිෂ්ඨ සේවාවක් ඉටු කර ඇති තැනැත්තන් අතුරින් කොමිෂන් සභාව විසින් පත් කළ යුතු ය.

(2) උප කුලපතිවරයා පාලක සභාවේ සභාපතිවරයා වන අතර ඔහු එහි සියලු ම රැස්වීම්වල මූලසුන දැරිය යුතු ය. යම් රැස්වීමක මූලසුන දැරීමට සභාපතිවරයාට නොහැකි වුවහොත් සාමාජිකයන් විසින් පැමිණ සිටින යම් සාමාජිකයකු ඒ රැස්වීමෙහි මූලසුන දැරීමට තෝරා ගත යුතු ය.

(3) (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පාලක සභාවේ යම් පත් කරනු ලැබූ සාමාජිකයෙක්, ඔහු කලින් ධුරය අත් හැර ගියහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට තුන් වර්ෂයක කාලයක් ධුරය දරන අතර ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය:

එසේ වුව ද යම් පත් කරනු ලැබූ සාමාජිකයකු තම ධුර කාලය ඉකුත් වීමට පෙර තම ධුරය අත්හැර ගියහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා, ඔහු කලින් ධුරය අත් හැර ගියහොත් මිස, තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දරන්නේ ය.

(4) කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත යවනු ලබන තම අත්සන යටතේ වූ ලිපියක් මගින් පාලක සභාවේ පත් කරනු ලැබූ සාමාජිකයකුට තම ධුරයෙන් ඉල්ලා අස් විය හැකි ය.

(5) කවර වූ හේතුවක් නිසා හෝ පාලක සභාවේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන පාලක සභාවේ පත් කරනු ලැබූ සාමාජිකයකු පාලක සභාවේ සාමාජිකයකු වශයෙන් වූ තම ධුරය අත්හැර ගිය ලෙස සැලකිය යුතු අතර ඒ හේතුවෙන් ඇති වන පුරප්පාඩුව පිරවීමට කොමිෂන් සභාව විසින් සුදුසු තැනැත්තකු පත් කළ යුතු ය.

(6) පාලක සභාවේ සාමාජිකයකුට යම් පාරිශ්‍රමිකයකට හිමිකම් නොමැති නමුත් (1) වන උපවගන්තියේ (v) වන ඡේදය යටතේ පත්කරනු ලැබූ සාමාජිකයකුට මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන දීමනා ගෙවනු ලැබිය හැකි ය.

(7) පාලක සභාවේ රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(8) එක් එක් වර්ෂයක දී දහයකට නොඅඩු රැස්වීම් සංඛ්‍යාවක් පැවැත්වෙන පරිදි අවශ්‍ය කවර අවස්ථාවක වුව ද පාලක සභාව රැස්විය යුතු ය.

(9) අවශ්‍ය යයි තමා සලකන කවර හෝ අවස්ථාවක නැතහොත් පාලක සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවකගෙන් ලිඛිත ඉල්ලීමක් ලැබී සතියක් ඇතුළත පාලක සභාවේ සභාපතිවරයා විසින් පාලක සභාවේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

45. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, විශ්වවිද්‍යාලය වෙත පැවරෙන නැතහොත් නියම කෙරෙන බලතල, කාර්ය හා කර්තව්‍ය පාලක සභාව විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය. පාලක සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය.

(2) (1) වන උපවගන්තියෙන් පාලක සභාව වෙත පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය පාලක සභාව විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය :—

(i) විශ්වවිද්‍යාලයේ දේපළ සහ අරමුදල් සතුව සිටීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම ;

(ii) විශ්වවිද්‍යාලය සඳහා කුල ලාංඡනයක් තෝරා ගැනීම සහ විශ්වවිද්‍යාලයේ පොදු මුද්‍රාවෙහි ආකෘතිය නිශ්චය කිරීම, එහි භාරය සඳහා විධිවිධාන සැලැස්වීම සහ එහි භාවිතය මෙහෙයවීම ;

(iii) විශ්වවිද්‍යාලයට සම්බන්ධ සියලු කාරණා මේ පනතෙහි හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව විධිමත් කිරීම හා නිශ්චය කිරීම ;

(iv) නිශ්චිත කාර්යයන් සඳහා විශ්වවිද්‍යාලයට කැමැත්තක් කර ගැනීමට සපයන ලද යම් අරමුදල් පරිපාලනය කිරීම ;

(v) විශ්වවිද්‍යාලයට අන්තිම කැමති පත්‍ර මගින්, පරිත්‍යාග මගින් හා ප්‍රදාන මගින් පවරනු ලබන දේපළ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව භාර ගැනීම හා පිළිගැනීම ;

(vi) විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගණන් සලකා බැලීම සහ ඒ වාර්තා සහ ගණන් උත්තර මණ්ඩලය වෙත හා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(vii) විශ්වවිද්‍යාලයේ මුදල් ඇස්තමේන්තු පිළියෙළ කිරීම හා ඒ ඇස්තමේන්තු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(viii) මේ පනතින් නියමිත යම් කාරණයක් සඳහා ලිඛිත ව්‍යවස්ථා කෙටුම්පත් කිරීම යෝග්‍ය යයි පාලක සභාවට හැඟෙන කවර විටක හෝ ලිඛිත ව්‍යවස්ථා කෙටුම්පත් කර ඒවා උත්තර මණ්ඩලයට ඉදිරිපත් කිරීම ;

(ix) අතුරු ව්‍යවස්ථා සෑදීමට බලය දෙනු ලැබ ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා සෑදීම ;

(x) විශ්වවිද්‍යාලයේ වෙන යම් බල මණ්ඩලයක් විසින් සෑදිය යුතු බවට විධිවිධාන සලස්වා නොමැති, නියෝග සෑදීම ;

(xi) විශ්වවිද්‍යාලයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිලි, භූමිභාග, ලී බඩු, උපකරණ හා වෙනත් ද්‍රව්‍ය සැපයීම ;

(xii) විශ්වවිද්‍යාලයෙහි සේවය සඳහා තැනැත්තන් පත් කිරීම, ඔවුන්ගේ සේවය තාවකාලිකව නතර කිරීම, ඔවුන් සේවයෙන් පහ කිරීම හෝ වෙනත් ආකාරයකින් ඔවුන්ට දඬුවම් කිරීම :

එසේ වුව ද නිලධරයන් හා ආචාර්යවරයන් සම්බන්ධයෙන් වූ විට හැර, මේ බලතල උප කුලපතිවරයා වෙත පවරනු ලැබිය හැකි ය ;

(xiii) සනාතන සභාවේ නිර්දේශ සලකා බැලීමෙන් පසු විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයෙන් හෝ ඉන් බැහැරින් හෝ පරීක්ෂකවරයන් පත් කිරීම සහ ඒ පරීක්ෂකවරයන්ට ගෙවනු ලබන යම් ගාස්තු නිශ්චය කිරීම ;

(xiv) විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ සාමාන්‍ය ශුභ සිද්ධිය දියුණු කිරීම සඳහා ශිෂ්‍ය නියෝජිතයන් ද ඇතුළත් විය යුතු ශුභ සාධක මණ්ඩලයක් පත් කිරීම. ඒ මණ්ඩලයේ සංයුතිය සහ බලතල, කාර්ය හා කර්තව්‍ය නියමාවලි මගින් නියම කරනු ලැබිය යුතු ය ;

(xv) විශ්වවිද්‍යාලය වෙනුවෙන් ගිවිසුම්වලට ඇතුළත් වීම හා ගිවිසුම් ක්‍රියාත්මක කිරීම හෝ අවලංගු කිරීම සහ ප්‍රයෝජනයට නොයොදා ඇති යම් ආදායමක් ද ඇතුළුව විශ්වවිද්‍යාලයට අයත් කවර මුදලක් වුව ද, භාර ආඥා පනතේ 20 වන වගන්තියේ හෝ වෙනත් ලිඛිත නීතියක හෝ විධිවිධාන යටතේ භාරකාර මුදල් නීත්‍යානුකූලව ආයෝජනය කළ හැකි යම් සුරැකුම් පතක ආයෝජනය කිරීම ; නැතහොත්, කොමිෂන් සභාවේ අනුමතය ඇතිව ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළ මිලට ගැනීම සඳහා එවැනි යම් මුදලක් ආයෝජනය කිරීම හෝ එවැනි ආයෝජන වෙනස් කිරීම හෝ ඒ මුදල්වලින් වියදම් සඳහා වහාම අවශ්‍ය නොවන යම් කොටසක් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන යම් බැංකුවක ස්ථිර තැන්පත් මුදලක් ලෙස තැන්පත් කිරීම ;

(xvi) සනාතන සභාව විමසීමෙන් පසු විශ්වවිද්‍යාලයේ කුලපතිවරයාගේ, නිලධරයන්ගේ, උපාධිධාරීන්ගේ සහ ශිෂ්‍යයන්ගේ උපාධි නේපථ්‍යය හෝ ලාංඡනය හෝ ඒ දෙකම නිශ්චය කිරීම ;

(xvii) කොමිෂන් සභාවට—

(අ) සනාතන සභාව විමසීමෙන් පසු මහාචාර්ය ධුර, සහාය මහාචාර්ය ධුර, කථිකාචාර්ය ධුර හා වෙනත් යම් අධ්‍යයන තනතුරක් ඇති කිරීම, නැති කිරීම හෝ අත්හිටුවීම සම්බන්ධයෙන් උපදෙස් දීම; සහ

(ආ) අනධ්‍යයන තනතුරක් ඇති කිරීම, නැති කිරීම හෝ අත්හිටුවීම සම්බන්ධයෙන් උපදෙස් දීම; සහ

(ඇ) විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයන්ගේ, නිලධරයන් ගේ හා වෙනත් සේවකයන්ගේ සුදුසුකම් සම්බන්ධයෙන් උපදෙස් දීම;

(xviii) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මේ පනතෙහි හෝ යම් උචිත සාධන පත්‍රයක හෝ අන්‍යාකාර විධිවිධාන සලස්වා නොමැති විශ්වවිද්‍යාලයේ අනිකුත් සියලු බලතල ක්‍රියාත්මක කිරීම:

එසේ වුව ද සනාතන සභාවේ මතය පාලක සභාව වෙත වාර්තා කිරීමේ හා ලැබීමේ අවස්ථාවක් සනාතන සභාවට පූර්වයෙන් දී ඇත්තේ නම් මිස, යම් අධ්‍යයන කාරණයක් සම්බන්ධයෙන් පාලක සභාව විසින් කිසිම යෝජනාවක් සම්මත කර නොගත යුතු ය.

මේ වගන්තියෙහි "අධ්‍යයන කාරණය" යන්නෙන් සනාතන සභාවේ පාලනයට හා සාමාන්‍ය විධානයට යටත් යම් කාරණයක් අදහස් වේ.

46. (1) විශ්වවිද්‍යාලයකට සනාතන සභාවක් තිබිය යුතු අතර එය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන බල මණ්ඩලය වන්නේ ය. සනාතන සභාව.

(2) විශ්වවිද්‍යාලයක සනාතන සභාව පහත සඳහන් තැනැත්තන් ගෙන් සමන්විත වන්නේ ය:—

(අ) උප කුලපතිවරයා;

(ආ) නියෝජ්‍ය උප කුලපතිවරයෙක් සිටී නම් ඒ නියෝජ්‍ය උප කුලපතිවරයා;

(ඇ) මණ්ඩප වෙතොත් ඒ එක් එක් මණ්ඩපයේ මණ්ඩපාධිපතිවරයා;

(ඈ) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා;

(ඉ) එක් එක් අධ්‍යයන අංශයේ ප්‍රධානයා;

(ඊ) පුස්තකාලයාධිකාරිවරයා; සහ

(උ) එක් එක් පීඨයේ ස්ථිර ආචාර්යවරයන් විසින් තමන් අතුරින් තෝරා පත් කර ගන්නා (ඇ), (ඈ) සහ (ඉ) යන ඡේදවල සඳහන් ආචාර්යවරයන් නොවන ආචාර්යවරයන් දෙදෙනෙක්.

(3) තෝරා පත් කර ගනු ලැබූ එක් එක් සාමාජිකයා තමා තෝරා පත් කර ගනු ලැබූ දින සිට ගණන් ගනු ලබන අවුරුදු දෙකක කාල සීමාවක් ධුරය දැරිය යුතු ය.

(4) සනාතන සභාවේ රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් හතරෙන් එකක් විය යුතු ය.

(5) විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ හා විභාග පිළිබඳ පාලනය හා සාමාන්‍ය විධානය සනාතන සභාව සතු වන්නේ ය.

(6) මේ පනතෙහි විධිවිධානවලට යටත්ව හා (5) වන උපවගන්තියෙන් සනාතන සභාව වෙත පැවරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව සනාතන සභාව විසින් පහත සඳහන් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය :—

(i) අදාළ පීඨයෙහි හෝ පීඨවල වාර්තා සලකා බැලීමෙන් පසු අධ්‍යයන පාඨමාලාවලට හා විභාගවලට අදාළ නියෝග කෙටුම්පත් කිරීම සහ අනුමතය සඳහා ඒ කෙටුම්පත් පාලක සභාව වෙත ඉදිරිපත් කිරීම ;

(ii) අදාළ පීඨයෙහි හෝ පීඨවල වාර්තා සලකා බැලීමෙන් පසු පරීක්ෂකයන් වශයෙන් පත් කිරීමට සුදුසු තැනැත්තන්ගේ නම් පාලක සභාව වෙත නිර්දේශ කිරීම ;

(iii) විශ්වවිද්‍යාලයේ මහාචාර්ය, සහාය මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කථිකාචාර්ය හා වෙනත් අධ්‍යයන තනතුරු ඇති කිරීම, නැති කිරීම හෝ අත්හිටුවීම සම්බන්ධයෙන් පාලක සභාව වෙත නිර්දේශ කිරීම ;

(iv) අදාළ පීඨයෙහි හෝ පීඨවල වාර්තා සලකා බැලීමෙන් පසු—

(අ) පවත්නා පීඨ හා අධ්‍යයන අංශ ප්‍රතිසංවිධානය කිරීම සඳහා සහ අලුත් පීඨ හා අධ්‍යයන අංශ සංවිධානය කිරීම සඳහා වූ යෝජනා ක්‍රම ; සහ

(ආ) අධ්‍යයන විෂයයන් ඒවා අදාළ පීඨවලට පැවරීම

පිළිබඳව පාලක සභාව වෙත නිර්දේශ කිරීම ;

(v) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග සඳහා තරග කිරීමේ ක්‍රමය හා කොන්දේසි පාලක සභාව වෙත නිර්දේශ කිරීම ;

(vi) පාලක සභාව විසින් අනුමත කරනු ලැබූ කොන්දේසි වේද ඒ කොන්දේසි මත අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග ප්‍රදානය කිරීම ;

(vii) සනාතන සභාවට සුදුසු යයි පෙනී යන ප්‍රමාණයක සනාතන සභාවේ ස්ථාවර කමිටු, තත් කාර්ය කමිටු හෝ මණ්ඩල සහ විශේෂයෙන්, එහෙත්, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව—

(අ) පුස්තකාල කමිටුවක්,

(ආ) ප්‍රවේශ කමිටුවක්,

(ඇ) පර්යේෂණ කමිටුවක්,

(ඈ) විෂය මාලා හා ඇගයීමේ කමිටුවක්, සහ

(ඉ) ආධුනික අධ්‍යයන නිවාඩු කමිටුවක්

පත් කිරීම හා ඒවායේ විෂය කරුණු නියම කිරීම සහ ඒ කමිටුවල වාර්තා සලකා බැලීම හා වෙනස් කිරීම් ඇතිව හෝ නැතිව ඒ වාර්තා අනුමත කිරීම හෝ ඒ වාර්තා ප්‍රතික්ෂේප කිරීම;

(viii) අධ්‍යයන පාඨමාලාවලට ශිෂ්‍යයන් ඇතුල් කරවා ගැනීම සඳහා තිබිය යුතු සුදුසුකම් පාලක සභාව වෙත නිර්දේශ කිරීම.

47. (1) මණ්ඩපයකට ("මණ්ඩප සභාව" යනුවෙන් මෙහි මින් මතු සඳහන් කරනු ලබන) සභාවක් ඇති අතර එහි සංයුතිය නියමාවලි මගින් නියම කළ යුතු ය. මණ්ඩප සභාව.

(2) පහත සඳහන් කටයුතු සඳහා මණ්ඩප සභාව වග කිව යුතු ය:—

(i) මණ්ඩපයේ අභ්‍යන්තර පරිපාලනය;

(ii) මණ්ඩපයට අනුයුක්ත වූ තැනැත්තන්ගේ සාමාන්‍ය ශුභ සිද්ධිය සඳහා හා ඔවුන්ට සැප පහසුකම් සැලසීම සඳහා කටයුතු පිළියෙළ කිරීම; සහ

(iii) ලිඛිත ව්‍යවස්ථා මගින් නියම කරනු ලබන වෙනත් කාර්ය ඉටු කිරීම.

(3) මණ්ඩපයේ අභ්‍යන්තර පාලනයට අදාළ වූ, ආනුෂංගික වූ හෝ සම්බන්ධ වූ සියලු කාරණා සම්බන්ධයෙන් මණ්ඩප සභාව විසින්, පාලක සභාවේ අනුමතය ඇතිව රීති සාදනු ලැබිය හැකි ය.

48. (1) විශ්වවිද්‍යාලයක එක් එක් පීඨය මෙහි පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය:— විශ්ව විද්‍යාලයේ පීඨ.

(අ) පීඨය සංයුක්ත වන අධ්‍යයන අංශවලට අයත් වූ ද ස්වකීය පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටින්නා වූ ද සියලුම මහාචාර්යවරයෝ, සහාය මහාචාර්යවරයෝ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෝ සහ කථිකාචාර්යවරයෝ;

(ආ) පුස්තකාලයාධිකාරිවරයා හෝ ඔහුගේ නාමිතයා;

(ඇ) පීඨයේ ස්ථිර සහකාර කථිකාචාර්යවරයන් විසින් තමන් අතුරින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් දෙදෙනෙක්;

(ඈ) (අ) හා (ඇ) ඡේදවල සඳහන් තැනැත්තන් හැර පීඨයේ ඉගැන්වීමේ කාර්යයන්හි යෙදී සිටින ස්ථිර කාර්ය මණ්ඩලය විසින් තමන් අතුරින් තෝරා පත් කර ගන්නා සාමාජිකයන් දෙදෙනෙක්;

(ඉ) පීඨයේ ශිෂ්‍යයන් විසින් තමන් අතුරින් තෝරා පත් කර ගන්නා ශිෂ්‍යයන් දෙදෙනෙක්; සහ

(ඊ) පීඨයට අදාළ අධ්‍යයන ක්ෂේත්‍රවල විශිෂ්ඨත්වයක් දරන්නා වූ ද විශ්වවිද්‍යාලයේ සාමාජිකයන් නොවන්නා වූ ද තැනැත්තන් අතුරින් පීඨය විසින් තෝරා පත් කර ගන්නා තැනැත්තන් තිදෙනෙක්.

(2) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ තෝරා පත් කර ගන්නා සාමාජිකයකු තෝරා පත් කර ගනු ලැබූ දින සිට ගණන් බලනු ලැබූ එක් අවුරුදු කාලයක් සාමාජිකයකු වශයෙන් ධුරය දරන අතර වෙනත් යම් සාමාජිකයෙක්, ඔහු තෝරා පත් කර ගනු ලැබූ දින සිට ගණන් බලනු ලැබූ අවුරුදු තුනක කාලසීමාවක් ධුරය දරන්නේ ය. ඒ සෑම සාමාජිකයෙක් ම නැවත තෝරා පත් කර ගනු ලැබීම සඳහා සුදුස්සෙක් වන්නේ ය.

(3) මේ පනතේ විධිවිධානවලට යටත්ව, පීඨයක් විසින් පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය:—

(i) සනාතන සභාව විසින් පීඨය වෙත යොමු කරනු ලබන යම් කාරණයක් සලකා බැලීම හා ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීම ;

(ii) සනාතන සභාවේ පාලනයට යටත්ව, පීඨයේ අධ්‍යයන අංශ වල ඉගැන්වීම, විභාග හා පර්යේෂණ කටයුතුවලට සම්බන්ධ කරුණු විධිමත් කිරීම ;

(iii) පීඨයේ අධ්‍යයන පාඨමාලා හා විභාගවලට සම්බන්ධ සියලුම කාරණා සම්බන්ධයෙන් සනාතන සභාව වෙත වාර්තා හා නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(iv) විශේෂ විෂයයක් හෝ විෂයයන් සලකා බලා ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීමේ කාර්යය සඳහා, පීඨයේ සාමාජිකයන් නොවන තැනැත්තන් ඇතුළත් විය හැකි කමිටු පත් කිරීම ; සහ

(v) පරීක්ෂකයන් වශයෙන් පත් කිරීමට සුදුසු තැනැත්තන් සනාතන සභාව වෙත නිර්දේශ කිරීම.

(4) පීඨයේ යම් රැස්වීමක විභාග හා විභාගවලට සම්බන්ධ කාරණා පිළිබඳ වූ කටයුතුවලින්, (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ තෝරා පත්කරගනු ලැබූ සාමාජිකයන් බැහැර කළ යුතු අතර, එසේ බැහැර කරනු ලැබුවේ වුවද ඒ රැස්වීම් යථා පරිදි පවත්වනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

පීඨයක පීඨාධිපතිවරයා.

49. (1) විශ්වවිද්‍යාලයේ පූර්ණකාල නිලධරයකු හා පීඨයෙහි ශාස්ත්‍රීය හා පරිපාලන ප්‍රධානයා විය යුතු පීඨාධිපතිවරයකු එක් එක් පීඨයෙහි විය යුත්තේ ය. යම් පීඨයක් යම් අධ්‍යයන අංශවලින් සමන්විත වන්නේ ද ඒ අංශවල ප්‍රධානයන් අතුරින් ඒ පීඨය විසින් පීඨාධිපතිවරයා තෝරා පත් කළ යුතු අතර එසේ තෝරා පත් කර ගනු ලැබූ විට ඔහු ඒ අදාළ අධ්‍යයන අංශයේ ප්‍රධානයාව සිටීම අවසන් විය යුතු ය.

(2) පීඨාධිපතිවරයා, යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව ඔහු තෝරා ගනු ලැබූ දින සිට වර්ෂ තුනක කාලයක් ධුරය දරන අතර ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත තෝරා පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය.

(3) නිවාඩු පිට සිටීම, රෝගාතුර වීම හෝ වෙනත් හේතුවක් නිසා තුන් මසකට නොවැඩි කාලයක් තම ධුරයේ කටයුතු කිරීමට පීඨයක පීඨාධිපතිවරයාට තාවකාලික ව නොහැකි වුවහොත් ඒ කාලය තුළ ඒ ධුරයේ කටයුතු කිරීමට උප කුලපතිවරයා විසින් ඒ පීඨයේ යම් අංශයක වෙනත් ප්‍රධානයකු පත් කළ යුතු ය. එසේ වුව ද පීඨයක පීඨාධිපතිවරයකු විශ්‍රාම ගන්නා විට හෝ ඉල්ලා අස්වන විට හෝ වෙනත් හේතුවක් නිසා තුන් මසකට වැඩි කාලයක් තම ධුරයේ කටයුතු කිරීමට ඔහුට නොහැකි වූ විට, ඒ පීඨයේ පීඨාධිපති ධුරය පුරප්පාඩු වූ ලෙස සැලකිය යුතු අතර මේ වගන්තියේ (1) වන උපවගන්තිය අනුව නව පීඨාධිපතිවරයකු තෝරා පත් කළ යුතු ය. එසේ තෝරා පත් කර ගනු ලබන තැනැත්තා තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දරන්නේ ය.

50. විශ්වවිද්‍යාලයක් විසින්, ඒ විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම, පර්යේෂණ සහ ව්‍යාප්ති වැඩ සටහන් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යයි ඒ විශ්වවිද්‍යාලය සලකන පීඨ සහ අධ්‍යයන අංශ පිහිටුවීම පිළිබඳව කලින් කල කොමිෂන් සභාවට නිර්දේශ ඉදිරිපත් කළ හැකි ය.

පීඨ පිහිටුවීම පිළිබඳව විශ්වවිද්‍යාලය නිර්දේශ ඉදිරිපත් කළ යුතු බව.

51. (1) උප කුලපතිවරයාගේ නිර්දේශය පිට පාලක සභාව විසින් පත් කරනු ලබන මහාචාර්යවරයෙක්, සහාය මහාචාර්යවරයෙක්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් හෝ කථිකාචාර්යවරයෙක් අධ්‍යයන අංශයක ප්‍රධානයා වන්නේ ය.

අධ්‍යයන අංශයක ප්‍රධානයා.

(2) අංශයක ප්‍රධානයා, යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, කලින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට වර්ෂ තුනක කාලයක් ධුරය දරන අතර නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය.

(3) නිවාඩු පිට සිටීම, රෝගාතුර වීම හෝ වෙනත් හේතුවක් නිසා තුන් මසකට නොවැඩි කාලයක් තම ධුරයේ කටයුතු කිරීමට අංශයක ප්‍රධානයාට තාවකාලිකව නොහැකි වුවහොත් ඒ කාලය තුළ ඒ ධුරයේ කටයුතු කිරීමට උප කුලපතිවරයා විසින් ඒ අංශයේ වෙනත් මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු හෝ කථිකාචාර්යවරයකු පත් කළ යුතු ය. එසේ වුවද අංශයක ප්‍රධානයකු විශ්‍රාම ගන්නා විට හෝ ඉල්ලා අස්වන විට හෝ වෙනත් හේතුවක් නිසා තුන් මසකට වැඩි කාලයක් තම ධුරයේ කටයුතු කිරීමට ඔහුට නොහැකි වූ විට, අංශයේ ප්‍රධානයාගේ ධුරය පුරප්පාඩු වූ ලෙස සැලකිය යුතු අතර (1) වන උපවගන්තිය අනුව අංශයේ නව ප්‍රධානයකු පත් කළ යුතු ය. එසේ පත් කරනු ලබන තැනැත්තා තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දරන්නේ ය.

52. විශ්වවිද්‍යාලයක බලමණ්ඩල වශයෙන් කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කරනු ලබන වෙනත් මණ්ඩලවල සංයුතිය, බලතල, කාර්ය හා කර්තව්‍ය සහ ඒ මණ්ඩලවල නිල බලයෙන් පත් වූ සාමාජිකයන් නොවන සාමාජිකයන්ගේ සාමාජිකත්වය පිළිබඳ නියම යන් නියමාවලි මගින් නියම කළ යුතු ය.

බල මණ්ඩල වශයෙන් කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කරනු ලැබූ මණ්ඩලවල සංයුතිය, බලතල, කාර්ය හා කර්තව්‍ය නියම කළ යුතු බව.

VIII වන කොටස

විශ්වවිද්‍යාලයක උපාධි ප්‍රදානෝත්සවය

විශ්වවිද්‍යාලයක උපාධි ප්‍රදානෝත්සවයක් පැවැත්වීම.

53. (1) විශ්වවිද්‍යාලයක් විසින්, උපාධි පිරිනැමීමේ කාර්යය සඳහා සෑම වර්ෂයකට එක් වරක්, කුලපතිවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි දිනයක හෝ දිනවල උපාධි ප්‍රදානෝත්සවයක් පැවැත්විය යුතු ය :

එසේ වුවද කුලපතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් අවස්ථාවක විශ්වවිද්‍යාලයක් විසින් විශේෂ උපාධි ප්‍රදානෝත්සවයක් පැවැත්විය හැකි ය :

එසේම තමදුරටත් උපාධි ප්‍රදානෝත්සවයක් නොපවත්වා ප්‍රථම උපාධි පිරිනමනු ලැබිය හැකි ය.

(2) උපාධි ප්‍රදානෝත්සවයක කාර්ය පටිපාටිය අනුරූ ව්‍යවස්ථා මගින් නියම කළ යුතු ය.

(3) උපාධි ප්‍රදානෝත්සවයක මූලසුන ජනාධිපතිවරයා පැමිණ සිටින විට, ඔහු විසින් දැරිය යුතු ය. ඔහු නොපැමිණි විට කුලපතිවරයා ඒ උපාධි ප්‍රදානෝත්සවයෙහි මූලසුන දැරිය යුතු අතර ජනාධිපතිවරයා හා කුලපතිවරයා යන දෙදෙනාම නො පැමිණි විට, උප කුලපතිවරයා මූලසුන දැරිය යුතු ය.

IX වන කොටස

විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක නිලධරයන් හා බලමණ්ඩල සහ ඔවුන්ගේ බලතල, කාර්ය හා කර්තව්‍ය

විශ්වවිද්‍යාලයීය විද්‍යායතන නියම සහ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක සාමාන්‍ය බලතල.

54. (1) 24 වන වගන්තිය යටතේ වූ විශ්වවිද්‍යාලයීය විද්‍යායතන නියමයක් ක්‍රියාත්මක වූ විට, ඒ නියමයෙන් දෙන ලද නාමය හා අභිධානය ඇතිව පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයට ද අධ්‍යක්ෂවරයාට හා කළමනාකාර මණ්ඩලයේ හා ශාස්ත්‍රීය කමිටුවේ තත් කාලයෙහි සාමාජිකයන්ට ද, මේ පනතේ 28 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ විශ්වවිද්‍යාලයක් විසින් කරනු ලැබීමට බලය පවරනු ලැබූ හෝ බලය දෙනු ලැබූ සියලු දේ ඒ නාමයෙන් හා ඒ නාමය යටතේ කිරීමට සම්පූර්ණ බලය හා අධිකාරය ඇත්තේ ය.

(2) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් වෙත මේ වගන්තියේ ඉහතින් ම විධිවිධානවලින් පවරනු ලැබූ බලතල, අන්‍යාකාර විධිවිධාන ප්‍රකාශිතව සලස්වා ඇත්තේ නම් මිස, එහි කළමනාකාර මණ්ඩලය විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

55. අදාළ විශ්වවිද්‍යාලයීය විද්‍යායතන නියමයට හා කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍යවලට යටත්ව, පහත සඳහන් කටයුතු කිරීමට විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයකට බලය ඇත්තේ ය :—

(අ) ශිෂ්‍යයන් ඇතුල් කර ගැනීම ;

(ආ) ඒ විද්‍යායතනය අනුබද්ධ කරනු ලැබූ විශ්වවිද්‍යාලය විසින් හෝ යම් විශ්වවිද්‍යාලයක් විසින් කොමිෂන් සභාවේ එකඟත්විය ඇතිව, අනුමත කරනු ලැබූ අධ්‍යයන ක්ෂේත්‍රයක හෝ ක්ෂේත්‍රවල ඉගැන්වීමේ කටයුතු සැලැස්වීම ;

(ඇ) එක් එක් උචිත විශ්වවිද්‍යාලය විසින් කොමිෂන් සභාවේ අනුමතය ඇතිව අනුමත කරනු ලැබූ අධ්‍යයන ක්ෂෙත්‍රයෙහි හෝ ක්ෂෙත්‍රවල, ප්‍රවීනත්වය ලැබූ තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්යය සඳහා ඒ උචිත විශ්වවිද්‍යාලයේ අනුමතය ඇතිව විභාග පැවැත්වීම සහ ඒ විභාගවලින් තාමාර්ථය ලැබ අතුරු ව්‍යවස්ථා මගින් ඒ විශ්වවිද්‍යාලය විසින් නියම කළ හැකි වෙනත් කොන්දේසි සපුරා ඒ විශ්වවිද්‍යාලයේ උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කරනු ලැබීමට සුදුසුකම් ලත් තැනැත්තන් ඒ විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම;

(ඈ) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ පරමාර්ථවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ පිටරට වෙනත් විශ්වවිද්‍යාල හෝ ආයතන සමග ආචාර්යවරයන්, ශිෂ්‍යයන් හා ශාස්ත්‍රධරයන් හුවමාරු කර ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් සහයෝගයෙන් ක්‍රියා කිරීම;

(ඉ) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ කාර්ය සඳහා පුස්තකාල, රසායනාගාර හා වෙනත් ගොඩනැගිලි, ඉගැන්වීමේ හෝ පදිංචිවීමේ කාර්ය සඳහා ඉදි කිරීම, ඒවාට උපකරණ සැපයීම හා ඒවා පවත්වාගෙන යාම;

(ඊ) මහාචාර්ය තනතුරු, සහාය මහාචාර්ය තනතුරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු, කථිකාචාර්ය තනතුරු හා විශ්ව විද්‍යාලයීය විද්‍යායතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් තනතුරු ඇති කිරීම;

(උ) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග ඇති කිරීම හා ප්‍රදානය කිරීම;

(ඌ) නේවාසිකාගාර පාලනය කිරීම, ශිෂ්‍යයන්ට නේවාසික පහසුකම් සලස්වන වාසස්ථාන සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ ශිෂ්‍යයන්ගේ වාසය පිණිස අවශ්‍ය විය හැකි වෙනත් එවැනි සේවා හා පහසුකම් සැලැස්වීම;

(එ) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ නිලධරයන්ගේ, ආචාර්ය වරයන්ගේ, ශිෂ්‍යයන්ගේ හා සේවකයන්ගේ වාසය, විනය හා ශුභ සිද්ධිය විධිමත් කිරීම හා ඒ සඳහා විධි විධාන සැලැස්වීම;

(ඒ) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ ශිෂ්‍යයන්ට බැංකුවලින් හා වෙනත් ආයතනවලින් ණය ලබා ගැනීමට සහාය වීම හා ඒ කාර්යය සඳහා සුදුසු අතුරු ව්‍යවස්ථා සෑදීම;

(ඔ) නියෝග මගින් කලින් කල නියම කරනු ලබන ගාස්තු ඉල්ලා සිටීම හා භාර ගැනීම;

(ඕ) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ පරමාර්ථ ඉටු කර ගැනීම පිණිස අවශ්‍ය විය හැකි ඉහත සඳහන් බලතලවලට ආනුෂංගික වූ හෝ නොවූ වෙනත් යම් ක්‍රියා හා දේ කිරීම:

එසේ වුව ද ඉගැන්වීමේ කටයුතුවලට හෝ විභාග පැවැත්වීමට බලපාන එකී මෙනත් ක්‍රියාවක් හෝ දෙයක්, ඒ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය අනුබද්ධ වූ විශ්ව විද්‍යාලයේ පූර්ව අනුමතිය ඇතිව මිස, නො කළ යුතු ය.

විශ්ව විද්‍යාලයීය විද්‍යායතනයක නිලධරයෝ.

56. පහත සඳහන් තැනැත්තෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතන යක නිලධරයෝ වන්නාහ :—

(1) අධ්‍යක්ෂවරයා,

(2) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා,

(3) ලේකම්වරයා,

(4) පුස්තකාලයාධිකාරිවරයා, සහ

(5) භාණ්ඩාගාරික.

අධ්‍යක්ෂවරයා.

57. (1) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක ප්‍රථම අධ්‍යක්ෂවරයා අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) පසුව පත්වන සෑම අධ්‍යක්ෂවරයකු ම, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ කළමනාකාර මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන තැනැත්තන් තිදෙනකුගෙන් යුත් මූල මණ්ඩලයකින් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු අධ්‍යක්ෂ වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ එසේ පත් කරනු ලැබූ සාමාජිකයා, අධ්‍යක්ෂ තනතුර භාර ගැනීම සඳහා, ඒ ආයතනය විසින් මුදා හැරිය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයකු, කලින් ධුරය අත් හැර ගියහොත් මිස හෝ මේ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, පත්කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන වර්ෂ තුනක කාලයක් ගතවීම හෝ ඔහුට හැට පස් වන විය සම්පූර්ණවීම හෝ 21 වන වගන්තිය යටතේ කරන ලද විශ්ව විද්‍යාලයීය නියමයකින් විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයකට විශ්ව විද්‍යාල තත්ත්වය පිරිනැමීම යන මේ අවස්ථාවලින් කලින් එළඹෙන අවස්ථාව තෙක් ධුරය දරන්නේ ය.

(4) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ ප්‍රථම අධ්‍යක්ෂ වරයා නොවන අධ්‍යක්ෂවරයකු, දෝෂාරෝපණ යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා කැඳවනු ලැබූ කළමනාකාර මණ්ඩලයේ විශේෂ රැස්වීමක දී ඒ මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නො අඩු ඡන්ද සංඛ්‍යාවකින් සම්මත කර ගනු ලැබූ දෝෂාරෝපණ යෝජනාවක් මත කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) ධුරයෙන් ඉල්ලා අස්වන හෝ ඉවත් කරනු ලබන හෝ විශ්ව විද්‍යාලයීය විද්‍යායතනයට විශ්වවිද්‍යාලයක තත්ත්වය පිරිනැමීමේ හේතුවෙන් අධ්‍යක්ෂ වශයෙන් ක්‍රියා කිරීමට නොහැකි වන අධ්‍යක්ෂ වරයෙක් අධ්‍යක්ෂ වශයෙන් තමා පත් කරනු ලැබීමට ඉහතින්ම, උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුව සිටියේ නම් සහ ඔහු හැට පස් වන විය සම්පූර්ණ කොට නොමැති නම්, උසස් අධ්‍යාපන ආයතනයේ ඔහුගේ නිත්‍ය තනතුරට ඔහුට පෙරළා පැමිණිය හැකි ය.

අධ්‍යක්ෂවරයාගේ කාර්ය සහ කර්තව්‍ය.

58. (1) අධ්‍යක්ෂවරයා විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ පූර්ණ කාල නිලධරයකු වන අතර ඔහු එහි ප්‍රධාන විධායක හා ශාස්ත්‍රීය නිලධරයා වන්නේ ය. ඔහු කළමනාකාර මණ්ඩලයේ හා ශාස්ත්‍රීය කමිටුවේ නිල බලයෙන් පත් වූ සභාපතිවරයා හා සාමාජිකයකු වන අතර කළමනාකාර මණ්ඩලයේ හා ශාස්ත්‍රීය කමිටුවේ සියලුම රැස්වීම් ඔහු විසින් කැඳවනු ලැබිය යුතු ය. විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ වෙන යම් බල මණ්ඩලයක හෝ මණ්ඩලයක රැස්වීමක් කැඳවීමට, ඒ රැස්වීමකට පැමිණ සිටීමට හා එහි දී කථා කිරීමට ඔහුට හිමිකම් ඇති නමුදු ඔහු ඒ බල මණ්ඩලයේ හෝ මණ්ඩලයේ සාමාජිකයෙක් වන්නේ නම් මිස, එකී යම් රැස්වීමක දී ඡන්දය දීමට ඔහුට හිමිකම් නොමැත්තේ ය.

(2) කළමනාකාර මණ්ඩලය විසින් කලින් කල තමා වෙත නීත්‍යානුකූලව නිකුත් කරනු ලබන විධානවලට අනුකූලව, මේ පනතේ හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන යථා පරිදි පිළිපැදීම ගැන වග බලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය. ඒ කාර්ය සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන සියලු බලතල ඔහුට ඇති අතර ඔහු විසින් ඒ බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(3) කළමනාකාර මණ්ඩලයේ හා ශාස්ත්‍රීය කමිටුවේ තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කෙරෙන බවට වග බලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය.

(4) අධ්‍යක්ෂවරයා විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ ගණන් දීමේ නිලධරයා වන්නේ ය.

(5) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය තුළ විනය පවත්වා ගැනීම පිළිබඳව අධ්‍යක්ෂවරයා වගකිව යුතු ය.

(6) නිවාඩු පිට සිටීම, රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙන යම් හේතුවක් නිසා තම ධුරයේ කාර්ය ඉටු කිරීමට අධ්‍යක්ෂවරයාට තාවකාලිකව නොහැකි වුවහොත් එසේ කාර්ය ඉටු කිරීමට නොහැකි වීමෙන් දින හතක් ඇතුළත ඒ ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා සුදුසු යයි කොමිෂන් සභාව අදහස් කරන වැඩ පිළිවෙලක් කොමිෂන් සභාව විසින් යෙදිය යුතු ය. එසේ වැඩ පිළිවෙලක් යොදන තෙක් ලේකම්වරයා විසින් ඒ ධුරයේ එදිනෙද කාර්ය කරගෙන යා යුතු ය.

(7) අධ්‍යක්ෂ ධුරයෙහි යම් පුරප්පාඩුවක් ඇති වුවහොත්, ඒ පුරප්පාඩුව ඇති වී දින හතක් ඇතුළත, 57 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ස්ථිර පත්වීමක් කරනු ලබනතුරු ඒ ධුරයේ කටයුතු කරගෙන යාමට සුදුසු යයි කොමිෂන් සභාව අදහස් කරන වැඩ පිළිවෙලක් කොමිෂන් සභාව විසින් යෙදිය යුතු ය. එසේ වැඩ පිළිවෙලක් යොදන තෙක් ලේකම්වරයා විසින් ඒ ධුරයේ එදිනෙද කාර්ය කරගෙන යා යුතු ය.

ලේකම්වරයා.

59. (1) නියමාවලි මගින් සංයුතිය නියම කළ යුතු තෝරා ගැනීමේ කමිටුවක නිර්දේශය පිට, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක ලේකම්වරයා, කළමනාකාර මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය. ඔහු විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ පූර්ණ කාල නිලධරයකු වන අතර මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් ඔහු වෙත පවරනු ලබන හා නියම කරනු ලබන බලතල, කාර්ය හා කර්තව්‍ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(2) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ වාර්තා හා දේපළ භාරව සිටීම ගැන ලේකම්වරයා වගකිව යුතු ය.

(3) ලේකම්වරයා, නිල බලයෙන් කළමනාකාර මණ්ඩලයේ හා ශාස්ත්‍රීය කමිටුවේ ලේකම්වරයා වන්නේ ය.

(4) ලේකම්වරයා, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ සහකාර ගණන් දීමේ නිලධරයා වන්නේ ය.

(5) අධ්‍යක්ෂවරයාගේ විධානයට හා පාලනයට යටත්ව, ලේකම්වරයා, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ සාමාන්‍ය පරිපාලනය හා එහි අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විනය පාලනය සම්බන්ධයෙන් වග කිව යුතු ය.

පුස්තකාලයාධිකාරිවරයා.

60. (1) නියමාවලි මගින් සංයුතිය නියම කළ යුතු තෝරා ගැනීමේ කමිටුවක නිර්දේශය පිට, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක පුස්තකාලයාධිකාරිවරයා, කළමනාකාර මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය. ඔහු විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ පූර්ණ කාල නිලධරයකු වන අතර මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් ඔහු වෙත පවරනු ලබන හා නියම කරනු ලබන බලතල, කාර්ය හා කර්තව්‍ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(2) අධ්‍යක්ෂවරයාගේ විධානයට හා පාලනයට යටත්ව, පුස්තකාලයාධිකාරිවරයා, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ පුස්තකාලයේ හෝ පුස්තකාලවල පරිපාලනය සම්බන්ධයෙන් වග කිව යුතු ය.

භාණ්ඩාගාරික.

61. (1) නියමාවලි මගින් සංයුතිය නියම කළ යුතු තෝරා ගැනීමේ කමිටුවක නිර්දේශය පිට, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක භාණ්ඩාගාරික, කළමනාකාර මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය. ඔහු විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ පූර්ණ කාල නිලධරයකු වන අතර මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් ඔහු වෙත පවරනු ලබන හා නියම කරනු ලබන බලතල, කාර්ය හා කර්තව්‍ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(2) ලේකම්වරයාගේ විධානයට හා පාලනයට යටත්ව, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ මුදල් පරිපාලනය කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාරික වගකිව යුතු අතර නියමාවලි මගින් නියම කරනු ලබන ආකාරයට හා පිළිවෙළට එහි ගණන් ඔහු විසින් පවත්වාගෙන යා යුතු ය. විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ මුදල් ඔහුගේ භාරයේ තිබිය යුතු ය.

62. පහත දැක්වෙන බල මණ්ඩල විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ බල මණ්ඩල වන්නේ ය:— විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක බල මණ්ඩල.

(1) කළමනාකාර මණ්ඩලය;

(2) ශාස්ත්‍රීය කමිටුව;

(3) පීඨය හෝ පීඨ; සහ

(4) නියමාවලි මගින් බල මණ්ඩල වශයෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් මණ්ඩල.

63. (1) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකාර මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය:— කළමනාකාර මණ්ඩලය.

(i) අධ්‍යක්ෂවරයා,

(ii) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා, සහ

(iii) ඉහත සඳහන් (i) වන හා (ii) වන ඡේද යටතේ වූ මුළු සාමාජික සංඛ්‍යාවට තුනක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාවට සමාන සාමාජික සංඛ්‍යාවක්. ඒ සාමාජිකයන් සියලුදෙනාම අධ්‍යාපන, වෘත්තීය, වාණිජ, කාර්මික, විද්‍යාත්මක හෝ පරිපාලන ක්ෂේත්‍රයන්හි විශිෂ්ඨ සේවාවක් ඉටු කර ඇති තැනැත්තන් අතුරින් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ 44 වන වගන්තියේ (2) වන, (3) වන, (4) වන, (5) වන, (6) වන, (7) වන, (8) වන හා (9) වන උපවගන්තිවල විධිවිධාන පහත සඳහන් වෙනස් කිරීම්වලට යටත්ව මණ්ඩලයට අදාළ වන්නේ ය:—

(අ) ඒ උපවගන්තිවල "උප කුලපතිවරයා" යන යෙදුම යම් තැනක යෙදේ ද ඒ සෑම තැනකම ඒ වෙනුවට "අධ්‍යක්ෂවරයා" යන යෙදුම ආදේශ කළ යුතු ය;

(ආ) ඒ උපවගන්තිවල "පාලක සභාව" යන යෙදුම යම් තැනක යෙදේ ද ඒ සෑම තැනක ම ඒ වෙනුවට "කළමනාකාර මණ්ඩලය" යන යෙදුම ආදේශ කළ යුතු ය.

(3) මේ පනතෙහි විධිවිධානවලට යටත්ව, මේ පනතේ 45 වන වගන්තියෙන් විශ්වවිද්‍යාලයක පාලක සභාව වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ බලතල, කාර්ය හා කර්තව්‍ය ඒ වගන්තියේ පහත සඳහන් වෙනස් කිරීම්වලට යටත්ව මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය:—

(අ) (i) ඒ වගන්තියෙහි "පාලක සභාව" යන යෙදුම හෝ සජාතීය යෙදුමක් යම් තැනක යෙදේ ද ඒ සෑම තැනක ම ඒ වෙනුවට "මණ්ඩලය" යන යෙදුම හෝ සජාතීය යෙදුමක් ආදේශ කළ යුතු ය;

(ii) ඒ වගන්තියෙහි "විශ්වවිද්‍යාලය" යන යෙදුම හෝ සජාතීය යෙදුමක් යම් තැනක යෙදේ ද ඒ සෑම තැනක ම ඒ වෙනුවට "විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය" යන යෙදුම හෝ සජාතීය යෙදුමක් ආදේශ කළ යුතු ය;

(iii) ඒ වගන්තියෙහි "සනාතන සභාව" යන යෙදුම හෝ සජාතීය යෙදුමක් යම් තැනක යෙදේ ද ඒ සෑම තැනක ම ඒ වෙනුවට "ශාස්ත්‍රීය කමිටුව යන" යෙදුම හෝ සජාතීය යෙදුමක් ආදේශ කළ යුතු ය; තවද

(ආ) (i) ඒ වගන්තියේ "උත්තර මණ්ඩලය" ගැන කර ඇති කවර වූ හෝ සඳහනක් අත්හැරීමෙන්; සහ

(ii) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (viii) වන සහ (xvi) වන ඡේද අත්හැරීමෙන්.

ශාස්ත්‍රීය කමිටුව.

64. (1) ශාස්ත්‍රීය කමිටුව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය:—

(අ) අධ්‍යක්ෂවරයා,

(ආ) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා,

(ඇ) එක් එක් අධ්‍යයන අංශයේ ප්‍රධානයා,

(ඈ) පුස්තකාලයාධිකාරිවරයා,

(ඉ) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය අනුබද්ධ කරනු ලැබ ඇත්තේ යම් විශ්වවිද්‍යාලවලට ද ඒ එක් එක් විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් ඒ සභාවේ සාමාජිකයන් අතුරින් නම් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙක්, සහ

(ඊ) එක් එක් පීඨයේ ස්ථිර ආචාර්යවරයන් විසින් ඒ පීඨයේ සාමාජිකයන් අතුරින් තෝරා පත් කරනු ලබන (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් තැනැත්තන් නොවන්නා වූ සාමාජිකයන් දෙදෙනෙක්.

(2) එක් එක් නම් කරනු ලැබූ හෝ තෝරා පත් කරනු ලැබූ සාමාජිකයා, අවසාථාවෝචිත පරිදි, තමා නම් කරනු ලැබූ හෝ තෝරා පත් කර ගනු ලැබූ දින සිට ගණන් ගනු ලබන වර්ෂ දෙකක කාලයක් ධුරය දරන්නේ ය.

(3) ශාස්ත්‍රීය කමිටුවේ රැස්වීමක ගණපූරණය එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් හතරෙන් එකක් විය යුතු ය.

(4) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මේ පනතේ 46 වන වගන්තියෙන් විශ්වවිද්‍යාලයක සනාතන සභාව වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ බලතල, කාර්ය හා කර්තව්‍ය ශාස්ත්‍රීය කමිටුව විසින්, ඒ වගන්තියේ පහත සඳහන් වෙනස් කිරීම්වලට යටත්ව ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය:—

(i) ඒ වගන්තියෙහි (5) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කළ යුතු ය:—

"(5) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ හා විභාග පිළිබඳ පාලනය හා සාමාන්‍ය විධානය, එක් එක් උචිත විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව, ශාස්ත්‍රීය කමිටුව සතු වන්නේ ය.";

(ii) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ (i) වන ඡේදයේ "සලකා බැලීමෙන් පසු" යන යෙදුම වෙනුවට "සලකා බැලීමෙන් පසු හා එක් එක් උචිත විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව" යන යෙදුම ආදේශ කළ යුතු ය;

(iii) "පාලක සභාව" යන යෙදුම වෙනුවට "මණ්ඩලය" යන යෙදුම ආදේශ කළ යුතු ය;

(iv) "විශ්වවිද්‍යාලයේ" යන යෙදුම වෙනුවට "විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ" යන යෙදුම ආදේශ කළ යුතු ය;

(v) "සනාතන සභාව" යන යෙදුම වෙනුවට "ශාස්ත්‍රීය කමිටුව" යන යෙදුම ආදේශ කළ යුතු ය.

විශ්වවිද්‍යාලයීය විද්‍යායතන පීඨ.

65. (1) අදාළ විශ්වවිද්‍යාලයීය විද්‍යායතන නියමයෙහි සඳහන් කරනු ලබන පීඨයක් හෝ පීඨ ගණනක් විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයකට ඇත්තේ ය.

(2) එක් එක් පීඨය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය:—

(අ) පීඨය සමන්විත වන අධ්‍යයන අංශවල, තම පත්වීම් ස්ථිර කරනු ලැබූ සියලුම මහාචාර්යවරු, සහාය මහාචාර්යවරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු හා කථිකාචාර්යවරු;

(ආ) පුස්තකාලයාධිකාරිවරයා හෝ ඔහුගේ නාමිතයා;

(ඇ) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය අනුබද්ධ කරනු ලැබූ එක් එක් විශ්වවිද්‍යාලයේ අනුරූප පීඨය විසින් ඒ පීඨයේ නිල බලයෙන් පත් වූ සාමාජිකයන් අතුරින් නම් කරනු ලැබූ නියෝජිතයන් තිදෙනෙක්;

(ඈ) පීඨයේ ස්ථිර සහකාර කථිකාචාර්යවරයන් විසින් තමන් අතුරින් තෝරා පත් කර ගනු ලැබූ එක් සාමාජිකයෙක්;

(ඉ) (අ) හා (ඇ) ඡේදවල සඳහන් තැනැත්තන් හැර පීඨයේ ඉගැන්වීමේ කාර්යයන්හි යෙදී සිටින ස්ථිර කාර්ය මණ්ඩලය විසින් තමන් අතුරින් තෝරා පත් කර ගන්නා සාමාජිකයෙක්; සහ

(ඊ) පීඨයේ ශිෂ්‍යයන් විසින් තමන් අතුරින් තෝරා පත් කර ගනු ලබන ශිෂ්‍යයන් දෙදෙනෙක්.

(3) යම් රැස්වීමක විභාගවලට හෝ ඒ හා සම්බන්ධ කාරණාවලට සම්බන්ධ කටයුතුවලින්, (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ තෝරා ගනු ලබන සාමාජිකයන් බැහැර කළ යුතු අතර එසේ බැහැර කරනු ලැබුවේ වුවද ඒ රැස්වීම යථා පරිදි පවත්වනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) එක් එක් නම් කරනු ලැබූ සාමාජිකයා තමා නම් කරනු ලැබූ දින සිට ගණන් ගනු ලබන වර්ෂ දෙකක කාල සීමාවක් ද එක් එක් තෝරා පත් කරනු ලැබූ සාමාජිකයා තම, තෝරා පත් කරනු ලැබූ දින සිට ගණන් ගනු ලබන එක් වර්ෂයක කාල සීමාවක් ද ධුරය දරන්නේ ය.

(5) මේ පනතේ 48 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් විශ්වවිද්‍යාලයක පීඨයක් වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ බලතල, කාර්ය හා කර්තව්‍ය විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය විසින්

ක්‍රියාත්මක කිරීම හා ඉවු කිරීම ඒ වගන්තියේ " සනාතන සභාව " යන යෙදුම එන කොතැනක වුවද ඒ වෙනුවට " ශාස්ත්‍රීය කමිටුව " යන යෙදුම සහ " සනාතන සභාවේ " යන යෙදුම එන කොතැනක වුවද ඒ වෙනුවට " ශාස්ත්‍රීය කමිටුවේ " යන යෙදුම ආදේශ කිරීමේ වෙනස් කිරීමට යටත්ව කළ යුතු ය.

49 වන වගන්තිය අවශ්‍ය වෙනස් කිරීම් සහිතව පීඨාධිපති වරයාට අදාළ විය යුතු බව.

66. විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක එක් එක් පීඨයේ පීඨාධිපති වරයාට සහ පීඨාධිපතිවරයා සම්බන්ධයෙන් 49 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.

පීඨ හා අධ්‍යයන අංශ පිහිටුවීම පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කළ හැකි බව.

67. විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් විසින්, ඒ විද්‍යායතනයේ ඉගැන්වීම, පර්යේෂණ සහ ව්‍යාප්ති වැඩ සටහන් දියුණු කිරීම සඳහා අවශ්‍ය යයි ඒ විද්‍යායතනය සලකන පීඨ සහ අධ්‍යයන අංශ පිහිටුවීම පිළිබඳව කලින් කල කොමිෂන් සභාවට නිර්දේශ ඉදිරිපත් කළ හැකි ය.

51 වන වගන්තිය එක් එක් අධ්‍යයන අංශයේ ප්‍රධානයාට අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු බව.

68. විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක එක් එක් අධ්‍යයන අංශයේ ප්‍රධානයාට සහ ප්‍රධානයා සම්බන්ධයෙන් 51 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.

ශාස්ත්‍රීය කමිටු යනාදියට 135 වන, 136 වන සහ 137 වන වගන්ති අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු බව.

69. මේ පනතේ විධිවිධානවලට යටත්ව, 135 වන, 136 වන සහ 137 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව පිළිවෙළින් විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක මණ්ඩලයට, ශාස්ත්‍රීය කමිටුවට හා වෙන යම් බල මණ්ඩලයකට හෝ මණ්ඩලයකට අදාළ වන්නේ ය:

එසේ වුවද් උචිත විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව මිස, ශාස්ත්‍රීය කාරණයකට අදාළ අතුරු ව්‍යවස්ථාවක් හෝ නියෝගයක් නො සෑදිය යුතු ය.

අර්ථ නිරූපණය.

70. මේ කොටසෙහි කාර්ය සඳහා—

" ශාස්ත්‍රීය කාරණය " යන්නෙන්, ශාස්ත්‍රීය කමිටුවේ පාලනයට හා සාමාන්‍ය විධානයට යටත් යම් කාරණයක් අදහස් වේ;

" උචිත විශ්වවිද්‍යාලය " යන්නෙන්, විශ්වවිද්‍යාලයක උපාධි, අභිඥාන පත්‍ර හෝ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සඳහා ඉගැන්වීමේ කටයුතු සැලැස්වීමේ හෝ විභාග පැවැත්වීමේ කාර්යය සඳහා විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් අනුබද්ධ කරනු ලැබූ විශ්වවිද්‍යාලය අදහස් වේ.

X වන කොටස

කාර්ය මණ්ඩලයට කරනු ලබන පත් කිරීම්

71. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයට කරනු ලබන සෑම පත් කිරීමක් ම, නියමාවලි මගින් නියම කරන ලැබූ බඳවා ගැනීමේ පරිපාටි සහ පත් කිරීමේ ක්‍රම අනුව, ඒ ආයතනයේ පාලක බල මණ්ඩලය විසින් කරනු ලැබිය යුතු ය. කාර්ය මණ්ඩලයට කරනු ලබන පත් කිරීම් පාලක බල මණ්ඩලය විසින් කළ යුතු බව.

(2) කොමිෂන් සභාව විසින්, නියමාවලි මගින් නියම කරනු ලැබූ බඳවා ගැනීමේ පරිපාටි හා පත් කිරීමේ ක්‍රම අනුව, උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයට පහත සඳහන් පත් කිරීම් කළ යුතු ය :—

(i) නිලධර තනතුරකට පත් කිරීම සම්බන්ධයෙන් මේ පනත යටතේ විශේෂයෙන් වෙනත් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක හැර, නිලධර තනතුරකට කරනු ලබන පත් කිරීම ;

(ii) ආචාර්ය තනතුරක් නොවන්නා වූ ද වර්ෂයකට රුපියල් නම දාහකට නොඅඩු ආරම්භක වැටුපක් හෝ කොමිෂන් සභාව විසින් නියමාවලි මගින් කලින් කල නියම කළ හැකි ඊට වැඩි ආරම්භක වැටුපක් සහිත වූ ද තනතුරකට කරනු ලබන පත් කිරීම ; සහ

(iii) ආචාර්ය තනතුරක් නොවන්නා වූ ද පත්වීම ලබන තැනැත්තා තනතුරේ එක් ශ්‍රේණියක හෝ පන්තියක හෝ සිට වෙනත් ශ්‍රේණියකට හෝ පන්තියකට උසස් කිරීම සිදුවන්නා වූ ද නියමාවලි මගින් නියම කරනු ලැබ ඇති වූ ද තනතුරුවලට කරනු ලබන පත් කිරීම්.

72. ආචාර්ය තනතුරකට කරනු ලබන සෑම පත් කිරීමක් ම ප්‍රථම අවස්ථාවේ දී වර්ෂ තුනක අඩුතික කාලයක් සඳහා වන අතර එක් අවස්ථාවක එක් වර්ෂයක් බැගින් වර්ෂ තුනක් නොඉක්මවන වැඩිපුර කාලයකට ඒ කාලය දීර්ඝ කිරීම ඒ ආචාර්යවරයා අනුයුක්ත වූ උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බල මණ්ඩලය විසින් කළ හැකි ය. ඒ පත් කිරීම, නියමාවලි මගින් නියම කරනු ලැබිය හැකි උචිත බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධාන සලස්වා ඇති ස්ථිර කිරීම පිළිබඳ නියමයන්ට හා කොන්දේසිවලට යටත් වන්නේ ය. ආචාර්ය තනතුරකට පත් කිරීම.

73. ස්වකීය තනතුරෙහි ස්ථිර කරනු ලැබූ ආචාර්ය තනතුරක් දරන්නකු වයස අවුරුදු හැට පහ සම්පූර්ණ වන තුරු හෝ අධ්‍යයන වර්ෂයක අතරතුරේ දී අවුරුදු හැට පහ සම්පූර්ණ කරත හොත් ඒ අධ්‍යයන වර්ෂයේ අන්තිම දිනය වන තුරු හෝ එම තනතුරේ සිටිය යුතු අතර ඉන් පසු ඔහු සේවයෙන් විශ්‍රාම ගත් ලෙස සැලකිය යුතු ය : ආචාර්යවරයන් විශ්‍රාම ගැනීම.

එසේ වුවද විෂමාචාරය, අකාර්යක්ෂමතාව හෝ කාර්ය පැහැර හැරීම පිළිබඳව ඒ ආචාර්යවරයා අනුයුක්ත වූ උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බලමණ්ඩලය විසින් පරීක්ෂණයක් පවත්වන

තුරු යම් වේලාවක එකී යම් තනතුරක් දරන්නකුගේ සේවය අත්හිටුවිය හැකි ය; නැතහොත් ඒ පරීක්ෂණයෙන් පසු ඔහු වරදකරු කරනු ලැබුව හොත්, ඒ පාලක බලමණ්ඩලය විසින් සම්මත කර ගනු ලබන යෝජනාවක් මඟින් ඔහු සේවයෙන් පහ කිරීම හෝ අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීම කළ හැකි ය.

ආචාර්ය තනතුරක් නොවන තනතුරකට කරනු ලබන පත් කිරීම.

74. ආචාර්ය තනතුරක් නොවන තනතුරකට කරනු ලබන සෑම පත් කිරීමක් ම ප්‍රථම අවස්ථාවේ දී වර්ෂ තුනක ආධුනික කාලයක් සඳහා වන අතර ඉන් පසු අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාව විසින් හෝ ඒ පත්වීම අදාළ වන උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බලමණ්ඩලය විසින් හෝ ස්ථිර කරනු ලැබීමට යටත් වන්නේ ය.

ආචාර්යවරුන් නොවන නැනැත්තන් විශ්‍රාම ගැනීම.

75. ආචාර්ය තනතුරක් නොවන තනතුරක් දරන්නකු වයස අවුරුදු පනස් පහ සම්පූර්ණ කරන තුරු තම ධුරයෙහි සිටිය යුතු අතර ඉන් පසු ඔහු ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගත් ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුවද එවැනි යම් තනතුරක් දරන්නකු විසින් කරන ලිඛිත ඉල්ලීමක් මත අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාව විසින් හෝ ඔහු අනුයුක්ත වූ උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බලමණ්ඩලය විසින්, ඔහු වයස අවුරුදු හැට සම්පූර්ණ කරන තුරු එක් වරකට එක් වර්ෂයක් බැගින් ඔහුගේ සේවය දීර්ඝ කිරීම කළ හැකි අතර ඉන් පසු ඔහු විශ්‍රාම ගත් ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ ම තවදුරටත් විෂමාචාරය, අකාර්යක්ෂමතාව හෝ කාර්ය පැහැර හැරීම පිළිබඳ අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාව විසින් හෝ ඔහු අනුයුක්ත වූ උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බලමණ්ඩලය විසින් හෝ පරීක්ෂණයක් පවත්වනතුරු යම් වේලාවක එකී යම් තනතුරක් දරන්නකුගේ සේවය අත්හිටුවිය හැකිය; නැතහොත් ඒ පරීක්ෂණයෙන් පසුව ඔහු වරදකරු කරනු ලැබුව හොත් ඒ කොමිෂන් සභාව හෝ පාලක බලමණ්ඩලය විසින් සම්මත කරගනු ලබන යෝජනාවක් මඟින් ඔහු සේවයෙන් පහ කිරීම හෝ අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීම, කළ හැකි ය.

සේවයෙන් පහ කිරීමට, අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීමට හෝ වෙනත් දණ්ඩනයකට විරුද්ධව අභියාචන කිරීම.

76. කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක හෝ තනතුරක් දරන්නා වූ සහ විෂමාචාරය, අකාර්යක්ෂමතාව හෝ කාර්ය පැහැර හැරීම සම්බන්ධයෙන් සේවයෙන් පහ කරනු ලැබූ හෝ අනිවාර්යයෙන් විශ්‍රාම ගන්වනු ලැබූ හෝ අන්‍යාකාරයකින් දඬුවම් කරනු ලැබූ සෑම තැනැත්තකු විසින් ම ඒ සේවයෙන් පහ කිරීමට හෝ විශ්‍රාම ගැන්වීමට හෝ දඬුවම් කිරීමට විරුද්ධව විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර ඒ සම්බන්ධයෙන් ඒ අභියාචන මණ්ඩලයේ තීරණය අවසානාත්මක වන්නේ ය.

උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයට රජයේ සේවයේ නිලධරයන් හා පළාත් පාලන ආයතන නිලධරයන් පත් කිරීම.

77. (1) උසස් අධ්‍යාපන ආයතනයක ඉල්ලීම පිට, රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු ඒ නිලධරයාගේ සහ ඒ නිලධරයා සේවයෙහි යොදවනු ලැබ සිටින්නේ යම් අමාත්‍යාංශයක් විසින් නැතහොත් යම් අමාත්‍යාංශයක් යටතේ ද ඒ ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, ඒ ආයතනය විසින්, එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන

කාලයක් සඳහා, ඒ උසස් අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් ඔහු ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 26 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදය හැර, එම වගන්තියේ (3) වන හා (5) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහු කෙරෙහි හා ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(3) රජයේ සේවයෙහි නියුක්ත යම් නිලධරයකු උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 26 වන වගන්තියේ (4) වන හා (5) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහු කෙරෙහි හා ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(4) උසස් අධ්‍යාපන ආයතනයක ඉල්ලීම පිට පළාත් පාලන සේවයේ හෝ යම් පළාත් පාලන ආයතනයක හෝ යම් නිලධරයකු හෝ සේවකයකු, අවස්ථාවෝචිත පරිදි, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ ඒ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව සහ ඒ ආයතනය විසින් එබඳුම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි කාලයක් සඳහා ඒ උසස් අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් ඒ උසස් අධ්‍යාපන ආයතනය හා පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ ඒ පළාත් පාලන ආයතනය එකඟ වන පරිදි විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ නියම හා කොන්දේසි ඇතුළු නියම හා කොන්දේසි යටතේ ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(5) නිශ්චිතව සඳහන් කාල සීමාවක් තුළ ආණ්ඩුවට සේවය කිරීමට එකඟවෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹ ඇති යම් නැනැත්තකු උසස් අධ්‍යාපන ආයතනයක් විසින් සේවයෙහි යොදවනු ලබන අවස්ථාවක ඒ තැනැත්තා ඒ උසස් අධ්‍යාපන ආයතනය යටතේ යම් කාලයක් සේවය කිරීම ඒ ගිවිසුමෙහි බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

78. ආචාර්ය තනතුරක් නොවන යම් තනතුරක් දරන්නකු උසස් අධ්‍යාපන ආයතන අතුළත හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාවෙන් උසස් අධ්‍යාපන ආයතනයකට හෝ මාරු කළ හැකි විය යුතු ය. ඒ මාරු කිරීම් කොමිෂන් සභාව විසින් කළ යුතු අතර තත් කාර්යය සඳහා නියමාවලි මගින් සංයුතිය නියම කරනු ලැබූ මාරු කිරීමේ මණ්ඩලයක් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය හැකි ය. මාරු කිරීම.

79. මේ කොටසෙහි "ආචාර්යවරයා" යන්නට පුස්තකාලයාධිකාරිවරයා, නියෝජ්‍ය පුස්තකාලයාධිකාරිවරයා හා සහකාර පුස්තකාලයාධිකාරිවරයා ඇතුළත් වන ලෙස සැලකිය යුතු ය. අර්ථ නිරූපණය.

XI වන කොටස

විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලය

විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලය පිහිටුවීම.

80. මේ පනත යටතේ තත් කාලයෙහි අභියාචන මණ්ඩලයේ සාමාජිකයන් වන තැනැත්තන්ගෙන් සමන්විත වන (මෙහි මින් මතු "අභියාචන මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලයක් පිහිටුවනු ලැබේ.

අභියාචන මණ්ඩලයේ සාමාජිකයෝ.

81. අභියාචන මණ්ඩලය සභාපතිවරයකුගෙන්, උප සභාපතිවරයකුගෙන් හා තවත් සාමාජිකයකුගෙන් සමන්විත වන අතර ඒ සියලු දෙනාම අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නා හ.

අභියාචන මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය.

82. (1) සභාපතිවරයා ඇතුළුව අභියාචන මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම, ඔහු කලින් තම ධුරය අතහැර ගිය හොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට ගණන් ගනු ලබන වර්ෂ පහක කාලයක් ධුරය දරන අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුව හොත් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය :

එසේ වුවද තමාගේ ධුර කාලය ඉකුත්වීමට පෙර යම් සාමාජිකයකු තම ධුරය අත්හැර ගිය හොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා ද කලින් ධුරය අත්හැර ගිය හොත් මිස, ඒ අනුප්‍රාප්තිකයා විසින් තම පූර්ව ගාමියාගේ ඉතිරිව තිබූ ධුර කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(2) අමාත්‍යවරයා වෙත යවනු ලබන තම අත්සන යටතේ වූ ලිපියක් මගින් අභියාචන මණ්ඩලයේ සාමාජිකයකුට තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය. එහෙත් ඒ ඉල්ලා අස්වීම භාර ගන්නා තුරු ඔහු තවදුරටත් තම ධුරයේ සිටිය යුතු ය.

(3) රෝගාතුර වීම නිසා හෝ වෙනත් දුර්වලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙන යම් හේතුවක් නිසා හෝ අභියාචන මණ්ඩලයේ යම් සාමාජිකයකුට තම ධුරයේ කටයුතු ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වුවහොත් ඒ සාමාජිකයා වෙනුවට කටයුතු කිරීමට සුදුසු තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(4) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හෝ දීමනා අභියාචන මණ්ඩලයේ සභාපතිවරයාට සහ අනෙකුත් සාමාජිකයන්ට ගෙවනු ලැබිය යුතු ය.

අභියාචන මණ්ඩලයේ කටයුතු.

83. (1) අභියාචන මණ්ඩලයේ සියලු ම රැස්වීම්වල මුලසුන ඒ මණ්ඩලයේ සභාපතිවරයා විසින් දැරිය යුතු අතර සභාපතිවරයා පැමිණ නොසිටි විටක දී උප සභාපතිවරයා මුලසුන දැරිය යුතු ය.

(2) අභියාචන මණ්ඩලයේ රැස්වීමක් සඳහා අවශ්‍ය ගණ පූරණය සාමාජිකයන් දෙදෙනකුගෙන් සමන්විත වන්නේ ය.

(3) අභියාචන මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම පිළිබඳ පරිපාටිය ඒ මණ්ඩලය විසින් සාදනු ලබන රීති මගින් නියම කරනු ලැබිය යුතු ය.

අභියාචන මණ්ඩලයේ කාර්ය මණ්ඩලය.

84. (1) අභියාචන මණ්ඩලයේ කාර්ය මණ්ඩලය ලේකම්වරයකුගෙන් හා මණ්ඩලයේ කටයුතු නිසි ලෙස හා කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි ඒ මණ්ඩලය සලකන වෙනත් නිලධරයන්ගෙන් හා සේවකයන්ගෙන් සමන්විත වන අතර ඒ සියලු දෙනාම කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයෙන් හෝ උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයෙන් හෝ සපයා දිය යුතු ය.

(2) අභියාචන මණ්ඩලයේ කාර්ය මණ්ඩලය ඒ අභියාචන මණ්ඩලයේ විනය පාලනයට යටත් වන්නේ ය.

(3) (අ) 82 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිශ්චය කරනු ලැබූ පරිදි අභියාචන මණ්ඩලයේ සාමාජිකයන්ට ගෙවීම් කිරීම ;

(ආ) අභියාචන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ වැටුප් හා වේතන ගෙවීම ; සහ

(ඇ) අභියාචන මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා ඒ මණ්ඩලයට අවශ්‍ය පහසුකම් සැලැස්වීම

කොමිෂන් සභාවේ කාර්ය වන්නේ ය.

මෙ පනත යනාදිය යටතේ නැතහොත් අභියාචන මණ්ඩලයේ විධානය මත කරනු ලැබූ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

85. (1) (අ) මේ පනත යටතේ හෝ යම් උචිත සාධන පත්‍රයක් යටතේ හෝ අභියාචන මණ්ඩලය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරනු ලැබූ ලෙස සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් අභියාචන මණ්ඩලයට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ යම් උචිත සාධන පත්‍රයක් යටතේ හෝ අභියාචන මණ්ඩලයේ විධානය මත හෝ අභියාචන මණ්ඩලයේ සාමාජිකයකු විසින් නැතහොත් එහි කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරනු ලැබූ ලෙස සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නො විය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියෙහි අභියාචන මණ්ඩලය විසින් හෝ අභියාචන මණ්ඩලයට විරුද්ධව හෝ පැවරෙන සිවිල් හෝ අපරාධ නඩුවක් සම්බන්ධයෙන් අභියාචන මණ්ඩලයට දරන්නට

සිදුවන යම් කිසි වියදමක් වෙතොත් එය කොමිෂන් සභාවේ අර මුදලින් ගෙවිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අභියාචන මණ්ඩලයට ගෙවනු ලබන හෝ අභියාචන මණ්ඩලය විසින් අය කර ගනු ලබන යම් ගාස්තුවක් වෙතොත් එය යට කී අරමුදලට බැර කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් කිසි තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ උචිත සාධන පත්‍රයක් යටතේ හෝ අභියාචන මණ්ඩලයේ විධාන මත කරන ලද නැතහොත් කරනු ලැබූ ලෙස සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කවර වූ හෝ අධිකරණයක පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඔහු විසින් ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දේ යයි ඒ අධිකරණය පිළිගනිතහොත්, ඔහුට දරන්නට සිදුවන යම් කිසි වියදමක්, ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකර ගන්නා ලද්දේ නම් මිස, කොමිෂන් සභාවේ අර මුදලින් ඒ වියදම ඔහුට ගෙවනු ලැබිය යුතු ය.

(4) අභියාචන මණ්ඩලයට විරුද්ධව ගෙනෙනු ලබන නඩුවක දී අභියාචන මණ්ඩලයේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළට හෝ විරුද්ධව රිට් බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය.

86. අභියාචන මණ්ඩලයට පහත සඳහන් බලතල, කාර්ය සහ කර්තව්‍ය ඇති අතර ඒ මණ්ඩලය විසින් ඒවා ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ හැකි ය:—

(අ) කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට සහ උසස් අධ්‍යාපන ආයතනවලට පත් කිරීම් හෝ උසස් කිරීම් කරනු ලැබූ අවස්ථාවේ බලපැවැත් වූ බඳවා ගැනීමේ පරිපාටිවලට හා පත් කිරීමේ ක්‍රමවලට පටහැනිව කරනු ලැබුවේ යයි කියනු ලබන පත් කිරීම් හා උසස් කිරීම් පිළිබඳව විමර්ශන පැවැත්වීම ;

(ආ) සේවයෙන් පහ කරනු ලැබූ, අනිවාර්යයෙන් විශ්‍රාම ගන්වනු ලැබූ හෝ අන්‍යාකාරයකින් දඬුවම් කරනු ලැබූ, කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවකයන් විසින්, සේවයෙන් පහ කිරීමට, අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීමට හෝ ඒ අන්‍යාකාර දඬුවමට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචන සලකා බැලීම ;

(ඇ) පරණ විශ්වවිද්‍යාලයේ සේවකයන්ට මේ පනතේ 142 වන වගන්තිය යටතේ ගෙවිය යුතු වන්දි සම්බන්ධයෙන් පරණ විශ්වවිද්‍යාලයේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක හෝ සේවකයන්ව සිටි කොමිෂන් සභාවේ සේවකයන්ගෙන් ලැබෙන අභියාචන සලකා බැලීම ;

(ඈ) ඒ අභියාචන සලකා බැලීමෙන් පසු හෝ ඒ විමර්ශන පැවැත්වීමෙන් පසු එළඹ ඇති තීරණ, අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාවේ සභාපතිවරයාට හෝ අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බලමණ්ඩලයට දැන්වීම.

87. අභියාචන මණ්ඩලය විසින් 86 වන වගන්තිය යටතේ තම බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී ගනු ලබන තීරණයක් අවසානාත්මක වන අතර එ් තීරණයේ හේතුවෙන් ප්‍රතිකර්ම යෙදීමට සිදුව ඇති අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් හෝ අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බලමණ්ඩලය විසින් එ් තීරණය ක්‍රියාත්මක කළ යුතු ය. අභියාචන මණ්ඩලයේ තීරණයක් අවසානාත්මක බව.

88. අභියාචන මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට හා ඉටු කිරීමට අවශ්‍ය යයි අභියාචන මණ්ඩලය විසින් සලකනු ලබන සියලු කාරණා සම්බන්ධයෙන් අභියාචන මණ්ඩලය විසින් නියමාවලි සාදනු ලැබිය හැකි ය. නියමාවලි සෑදීමට අභියාචන මණ්ඩලයට ඇති බලය.

XII වන කොටස

විශ්වවිද්‍යාලවල අර්ථසාධක අරමුදල

89. මේ පනතේ මේ කොටසෙහි— මේ පනතේ මේ කොටසෙහි අර්ථ නිරූපණය.

"විශ්‍රාම ගැනීමේ වයස" යන්න—

(අ) උසස් අධ්‍යාපන ආයතනයක ආචාර්ය තනතුරක් දරන දායකයකු සම්බන්ධයෙන් යෙදෙන විට, වයස අවුරුදු හැට පහ ඉන් අදහස් වේ ; තව ද

(ආ) උසස් අධ්‍යාපන ආයතනයක වෙන යම් තනතුරක් දරන්නා වූ හෝ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු වූ දායකයකු සම්බන්ධයෙන් යෙදෙන විට, අවස්ථාවෝචිත පරිදි, එ් උසස් අධ්‍යාපන ආයතනයේ හෝ කොමිෂන් සභාවේ හෝ ඔහු සේවයෙහි යෙදී සිටීම නතර වන වයස ඉන් අදහස් වේ ;

"දායකයා" යන්නෙන් අර්ථ සාධක අරමුදලෙහි දායකයකු වන, කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයෙහි යම් සාමාජිකයෙක් අදහස් වේ ;

"ඉපැයීම්" යන්නෙන් 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතෙහි නිර්වචනය කරනු ලැබූ ඉපැයීම් අදහස් වේ ;

"අරමුදල" යන්න—

(අ) කොමිෂන් සභාව සම්බන්ධයෙන් යෙදෙන විට මේ පනතේ 10 වන වගන්තිය යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාවේ අරමුදල ඉන් අදහස් වේ ;

(ආ) උසස් අධ්‍යාපන ආයතනයන් සම්බන්ධයෙන් යෙදෙන විට මේ පනතේ 99 වන වගන්තිය යටතේ පිහිටුවන ලද, විශ්වවිද්‍යාල අරමුදල ඉන් අදහස් වේ.

" අර්ථ සාධක අරමුදල " යන්නෙන් මේ පනතේ මේ කොටස යටතේ කොමිෂන් සභාව විසින් පිහිටුවනු ලැබූ අර්ථ සාධක අරමුදල අදහස් වේ ;

" වැටුප " යන්නෙන් යම් දායකයකු දරන ස්ථිර තනතුරෙහි හෝ පත්වීමේ පඩිනඩි අදහස් වන අතර නියමාවලි මගින් ඔහුගේ වැටුපෙහි කොටසක් ලෙස ප්‍රකාශ කරනු ලැබිය හැකි යම් දීමනා ද එයට ඇතුළත් වේ ;

" ආචාර්යවරයා " යන්නට පුස්තකාලයාධිකාරිවරයා, නියෝජ්‍ය පුස්තකාලයාධිකාරිවරයා හා සහකාර පුස්තකාලයාධිකාරිවරයා ඇතුළත් වෙති.

විශ්වවිද්‍යාලවල අර්ථ සාධක අරමුදල පිහිටුවීම.

90. විශ්වවිද්‍යාලවල අර්ථ සාධක අරමුදල යනුවෙන් නම් කෙරෙන හා හඳුන්වනු ලබන අර්ථ සාධක අරමුදලක් කොමිෂන් සභාව විසින් පිහිටුවිය යුතු ය.

අර්ථ සාධක අරමුදල විධිමත් කිරීම.

91. අර්ථ සාධක අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම හා එහි කළමනාකාරිත්වය සඳහා ද අර්ථ සාධක අරමුදලට ආනුෂංගික හෝ සම්බන්ධ මේ පනතෙහි ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා නොමැති සියලු කාරණා සඳහා ද කොමිෂන් සභාව විසින් නියමාවලි සාදනු ලැබිය හැකි ය. ඒ නියමාවලි 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ නියමයන්ට අනුකූල විය යුතු ය.

අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවීම.

92. (1) නියමාවලි මගින් නියම කරනු ලබන අවස්ථාවල දී හැර කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු විසින් ම ඒ කාර්ය මණ්ඩලයෙහි තමා සේවයෙහි යොදවනු ලැබූ දිනයෙහි සිට සිය ඉපයීම්වලින් සියයට දහයක ප්‍රමාණයකට සමාන මුදලක් මාස්පතා සිය වැටුපෙන් කරනු ලබන එකසමාන අඩු කිරීම් මගින් අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු ය ; තව ද ඒ අතර එයට අතිරේකව, කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන ආයතන විසින් ඒ සෑම දායකයකු වෙනුවෙන් ඒ දායකයාගේ ඉපැයීම්වලින් සියයට පහළොවකට සමාන මුදලක් හෝ මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන අන් කිසි මුදලක්, කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයේ අරමුදලින් අර්ථ සාධක අරමුදලට දායක මුදල් වශයෙන් ඒ හා සමග ම ගෙවිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් අර්ථ සාධක අරමුදල සඳහා පොදු ගිණුමක් ද ඒ අර්ථ සාධක අරමුදලෙහි එක් එක් දායකයා වෙනුවෙන් වෙනම ගිණුමක් ද ආරම්භ කොට පවත්වා ගෙන යා යුතු ය. දායකයකු විසින් අර්ථ සාධක අරමුදලට ගෙවනු ලබන සියලු දායක මුදල් ද එම දායකයා වෙනුවෙන් කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන ආයතනය විසින් අර්ථ සාධක අරමුදලට ගෙවනු ලබන සියලු දායක මුදල් ද එම දායකයා වෙනුවෙන් අර්ථ සාධක අරමුදලෙහි වෙන්ව පවත්වා ගෙන යන ගිණුමකට බැර කළ යුතු ය.

(3) දායකයකුගේ ගිණුමෙහි බැරට ඇති මුදලට ඒ දායකයා කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයේ සේවයෙහි යෙදී සිටීම නතර වන දිනය වන තෙක්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසු අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන අනුපාතිකය අනුව වූ මිශ්‍ර පොලිය, ඒ වෙනුවෙන් සාදනු ලබන යම් නියමාවලියක විධිවිධානවලට යටත්ව, එකතු වන්නේ ය. තව ද එකී දිනයෙහි දී ඒ ගිණුම අවසන් කළ යුතු ය.

අර්ථ සාධක අරමුදලින් ගෙවීම.

93. (1) 92 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන සලස්වනු ලැබූ පරිදි යම් දායකයකුගේ ගිණුම අවසන් කරනු ලැබූ විට කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින්, 94 වන වගන්තියෙහි විධිවිධානවලට යටත්ව, අර්ථ සාධක අරමුදලේ ඒ දායකයාගේ ගිණුමෙහි බැරට ඇති සම්පූර්ණ මුදල ඒ මුදලට එකතු වී ඇති පොලිය ද සමග ඒ දායකයාට ගෙවිය යුතු ය.

(2) දායකයකු ඔහුගේ විශ්‍රාම ගැනීමේ වයස සම්පූර්ණ වීමට පෙර රෝගාතුර වීම හෝ අබලතාව හෝ ඔහු නියුක්තව සිටි ධුරය නැති කිරීම හෝ හේතු කොට ගෙන කොමිෂන් සභාව විසින් නැතහොත් උසස් අධ්‍යාපන ආයතනය විසින් සේවයෙහි යොදවනු ලැබීම නතර වුවහොත් හෝ ඔහු කොමිෂන් සභාවේ නැතහොත් උසස් අධ්‍යාපන ආයතනයේ සේවයෙන් ස්වේච්ඡාවෙන් අස්වුවහොත්, කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, ඔහු එසේ සේවයෙහි නියුක්තවීම අවසන් වූ දිනයෙහි දී හෝ ඔහු කොමිෂන් සභාවේ නැතහොත් උසස් අධ්‍යාපන ආයතනයේ සේවයෙන් ස්වේච්ඡාවෙන් අස් වූ දිනයෙහි දී අර්ථ සාධක අරමුදලේ ඔහුගේ ගිණුමෙහි බැරට ඇති සම්පූර්ණ මුදල ඒ මුදලට එකතු වී ඇති පොලිය ද සමග, 94 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ දායකයාට ගෙවිය යුතු ය.

(3) දායකයකු ඔහුගේ විශ්‍රාම ගැනීමේ වයස සම්පූර්ණ කිරීමට පෙර කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයේ සේවයෙන් පහ කරනු ලැබූ හෝ අනිවාර්යයෙන් විශ්‍රාම ගන්වනු ලැබූ විට, අර්ථ සාධක අරමුදලේ ඔහුගේ ගිණුමෙහි බැරට ඇති සම්පූර්ණ මුදල, අවස්ථාවෝචිත පරිදි, ඔහු සේවයෙන් පහ කරනු ලැබීමේ හෝ අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීමේ දිනය දක්වා ඒ මුදලට එකතු වී ඇති පොලිය ද සමග 94 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් ඒ දායකයාට ගෙවිය යුතු ය.

(4) දායකයකු කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයේ සේවයේ යෙදී සිටිය දී මිය ගිය විට කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින්, අර්ථ සාධක අරමුදලෙහි ඒ දායකයාගේ ගිණුමෙහි බැරට එකතු වී ඇති සම්පූර්ණ මුදල ඒ මුදලට එකතු වී ඇති පොලිය ද සමග, 94 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මිය ගිය දායකයාගේ බුදලයට හෝ ඒ මුදල ලබා ගැනීමට නීත්‍යනුකූලව හිමිකම් ඇති තැනැත්තාට හෝ තැනැත්තන්ට ගෙවිය යුතු ය.

අර්ථ සාධක අරමුදලින් ගෙවීමට පෙර කරනු ලබන අඩු කිරීම.

94. දායකයකු කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවයෙහි යොදවා ගනු ලැබ සිටි කාලය තුළ යම් අවස්ථාවක ඔහුගේ වංක භාවය හෝ නොසැලකිල්ල හේතු කොට ගෙන ඒ කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන ආයතනය විසින් දරන ලද යම් පාඩුවක හෝ හානියක මුදල සහ දායකයා විසින්, අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාවෙන් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් හෝ ආණ්ඩුවෙන් හෝ ලබා ගත් යම් ණය මුදලක් වෙනුවෙන් ගෙවිය යුතු යම් මුදලක් ද, මේ කොටසෙහි ඉහතින් වූ විධිවිධාන කුමක් වුවද එමෙන් ම වෙන යම් අයිතිවාසිකමකට හෝ ප්‍රතිකර්මයකට හානියක් නොමැතිව ද, අර්ථසාධක අරමුදලෙහි ඒ දායකයාගේ ගිණුමෙහි බැරට ඇති මුදලට ප්‍රථම වැය බරක් වන්නේ ය. තව ද 93 වන වගන්තියේ විධිවිධාන අනුව යම් ගෙවීමක් කරනා අවස්ථාවේ ඒ මුදල අඩු කර ගත හැකි ය.

නොගෙවනු ලැබූ අර්ථසාධක අරමුදලට ඇතැම් අවස්ථාවල දී මිශ්‍ර පොලිය එකතු විය යුතු බව.

95. අර්ථ සාධක අරමුදලේ දායකයකුගේ බැරට ඇති සම්පූර්ණ මුදල ඔහුගේ ගිණුම අවසන් කරනු ලැබූ දින සිට මාස තුනක කාල සීමාවක් ඇතුළත ඔහුට නොගෙවා ඇති අවස්ථාවක, මේ කොටසෙහි ඉහතින් වූ විධිවිධාන කුමක් වුව ද එමෙන් ම වෙන යම් අයිතිවාසිකමකට හෝ ප්‍රතිකර්මයකට හානියක් නොමැතිව ද ඔහුගේ බැරට ඇති මුදලට 92 (3) වන වගන්තියේ කාර්යය සඳහා නිශ්චය කරනු ලැබූ අනුපාතිකය අනුව මිශ්‍ර පොලිය, ඔහුගේ ගිණුමෙහි බැරට ඇති සම්පූර්ණ මුදල ඔහුට ගෙවනු ලබන මාසයට ඉහතින් වූ මාසයේ අන්තිම දිනය දක්වා, එකතු වන්නේ ය :

එසේ වුව ද ඒ මුදල ඒ දායකයාට ගෙවීම දායකයාගේ වරදක් නිසා ප්‍රමාද වූ අවස්ථාවල එකී පොලිය නොගෙවිය යුතු ය.

දායකයාගේ ඇතැම් වත්කම්, තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදවීමේ දී තහනමට හැනීමෙන් නිදහස් බව.

96. මේ පනත හැර වෙන යම් ලිඛිත නීතියක කවර විධිවිධානයක් තිබුණ ද, අර්ථ සාධක අරමුදලෙහි දායකයකුගේ බැරට ඇති මුදල් යම් අධිකරණයක තීන්දු ප්‍රකාශයක් හෝ විධානයක් හෝ ක්‍රියාවේ යෙදවීමේ ලා තහනමට ඇල්ලීම, තහනමට ගැනීම හෝ තහනම් කිරීම කවර අවස්ථාවක දී වත් නොකළ යුතු ය.

විශ්‍රාම වැටුප් ක්‍රමයක් හා වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් අරමුදලක් පිහිටුවීම.

97. මේ කොටස යටතේ කොමිෂන් සභාව විසින් පිහිටුවනු ලැබූ අර්ථ සාධක අරමුදලට විකල්ප වශයෙන් හෝ ඊට අමතරව, අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසු, විශ්‍රාම වැටුප් ක්‍රමයක් හා වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් අරමුදලක් පිහිටුවනු ලැබිය හැකි ය. ඒ විශ්‍රාම වැටුප් ක්‍රමය හා වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම හා එහි කළමනාකාරිත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලි සාදනු ලැබිය හැකි ය.

XIII වන කොටස

මුදල් විධිවිධාන

මුදල් වර්ෂය.

98. උසස් අධ්‍යාපන ආයතනයක මුදල් වර්ෂය ආණ්ඩුවේ මුදල් වර්ෂය ම වන්නේ ය.

විශ්වවිද්‍යාල අරමුදල.

99. (1) විශ්වවිද්‍යාල අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් එක් එක් උසස් අධ්‍යාපන ආයතනයක තිබිය යුතු අතර පහත සඳහන් මුදල් එයට ගෙවිය යුතු ය:—

(අ) යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන අනුව උසස් අධ්‍යාපන ආයතනයට ගෙවිය යුතු වූ ගාස්තු ;

(ආ) පරිත්‍යාගවලින් ලැබෙන ආදායම ;

(ඇ) උසස් අධ්‍යාපන ආයතනවලට දෙන ආධාර මුදල් වශයෙන් පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරනු ලබන්නා වූ ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වැය කරනු ලබන්නා වූ ද මුදල් ;

(ඈ) උසස් අධ්‍යාපන ආයතනයට අයිති වූ ද කවර ප්‍රභවයකින් හෝ අත් කර ගනු ලැබුවා වූ ද වෙනත් සියලු මුදල්.

(2) විශ්වවිද්‍යාල අරමුදලට ගෙවනු ලබන එක් එක් මුදල් ප්‍රමාණය පිළිබඳ විස්තර ඒ ගෙවීම කළ දින සිට එක් මාසයක් ඇතුළත, උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විසින් කොමිෂන් සභාවේ දැනගැනීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

උසස් අධ්‍යාපන ආයතන සඳහා ආධාර වශයෙන් දෙනු ලබන ප්‍රතිපාදන.

100. (1) එක් එක් මුදල් වර්ෂය ආරම්භ වීමෙන් පසු හැකි තාක් ඉක්මණින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින්, උසස් අධ්‍යාපන ආයතනයකට ආධාර වශයෙන් දෙනු ලබන මුදලක් හෝ මුදල් පාර්ලිමේන්තුව විසින් වාර්ෂික විසර්ජන පනත මගින් හෝ පරිපූරක සම්මතයක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ ප්‍රතිපාදනය කරනු ලබන මුදල් ඒ උසස් අධ්‍යාපන ආයතනයට ගෙවිය යුතු ය.

(2) ඉහතින් වූ උපවගන්තිය යටතේ උසස් අධ්‍යාපන ආයතනයකට ගෙවනු ලබන සියලුම මුදල් මේ පනත මගින් හෝ යම් උචිත සාධන පත්‍රයක් මගින් හෝ බලය දෙනු ලැබූ කාර්ය සියල්ල නැතහොත් ඉන් යම් කාර්යයක් සඳහා ඒ උසස් අධ්‍යාපන ආයතනය විසින් යෙදවිය යුතු ය ; නැතහොත් වැය කළ යුතු ය.

මූල්‍යාධිකාරිවරයාගේ හෝ භාණ්ඩාගාරිකගේ කාර්යය.

101. (අ) පාලක බලමණ්ඩලය විසින් කලින් කල නියම කරනු ලබන පිළිවෙලට හා ආකාරයට විශ්වවිද්‍යාලයේ හෝ විවෘත විශ්වවිද්‍යාලයේ හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ ගණන් තැබීම ;

(ආ) විශ්වවිද්‍යාල අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් භාර ගැනීම සහ ඒ මුදල් නිසි ගණන් ශීර්ෂයන්ට බැර කිරීම ;

(ඇ) බලය දෙනු ලැබූ සියලු ගෙවීම් කිරීම ; සහ

(ඇ) පාලක බල මණ්ඩලය සඳහා කොමිෂන් සභාවට අවශ්‍ය ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු, ඉදිරි මුදල් වර්ෂය සඳහා වාර්ෂික මුදල් විසර්ජන හා 105 වන වගන්තිය යටතේ වූ යම් පරිපූරක ඇස්තමේන්තු පිළියෙළ කිරීම

අවස්ථාවෝචිත පරිදි විශ්වවිද්‍යාලයක, විවෘත විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක, මූල්‍යාධිකාරිවරයාගේ හෝ භාණ්ඩාගාරිකගේ කාර්යය වන්නේ ය:

එසේ වුව ද අවස්ථාවෝචිත පරිදි විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලයේ හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ ගණන්වල, නිශ්චිත කාර්ය සඳහා කරනු ලබන ප්‍රතිපාදනවලින් හෝ නිශ්චිත අරමුණු සඳහා වූ පරිත්‍යාගවලින් ලැබෙන ආදායම සම්බන්ධයෙන් වෙනම ගණන් පෙන්වීම් කළ යුතු අතර, විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලයේ හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ සාමාන්‍ය කාර්ය සඳහා හෝ ඒ ප්‍රතිපාදන හෝ පරිත්‍යාග කරනු ලැබුවේ පිළිවෙළින් යම් කාර්ය හෝ අරමුණු සඳහා ද ඒ කාර්ය හෝ අරමුණු නොවන කරුණු සඳහා ඒ ආදායමෙන් කිසිදු ගෙවීමක් නොකළ යුතු ය.

ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු හා වාර්ෂික විසර්ජන, පාලක බලමණ්ඩලය විසින් සලකා බැලිය යුතු බව.

102. 101 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ පිළියෙළ කරනු ලැබූ, අවස්ථාවෝචිත පරිදි විශ්වවිද්‍යාලයක, විවෘත විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු සහ වාර්ෂික විසර්ජන, නියමාවලි මගින් නියම කරනු ලබන දිනයට පෙර පාලක බලමණ්ඩලය විසින් සලකා බැලිය යුතු ය. ඒ පාලක බලමණ්ඩලය විසින් අවස්ථාවෝචිත පරිදි විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලයේ හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ ඒ මුදල් ඇස්තමේන්තු සහ විසර්ජන සුදුසු යයි හැඟෙන වෙනස් කිරීම් කර අවසන් වරට සම්පූර්ණ වූ වර්ෂය සඳහා වූ ගණන් සමග, ඒවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු හා වාර්ෂික විසර්ජන, කොමිෂන් සභාව විසින් සලකා බැලිය යුතු බව.

103. අවස්ථාවෝචිත පරිදි විශ්වවිද්‍යාලයක, විවෘත විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු සහ වාර්ෂික විසර්ජන, කොමිෂන් සභාව විසින් සලකා බැලිය යුතු අතර එයට සුදුසු යයි හැඟෙන පරිදි, ඒ ඇස්තමේන්තු හා විසර්ජන කොමිෂන් සභාව විසින් යෝජනා සම්මතියෙන් පිළිගැනීම හෝ සංශෝධනය කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

මුදල් මාරු කිරීම.

104. ඉහතින් වූ වගන්තිය යටතේ සම්මත කර ගනු ලැබූ යම් යෝජනා සමග අවස්ථාවෝචිත පරිදි විශ්වවිද්‍යාලයක, විවෘත විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු සහ වාර්ෂික විසර්ජන, කොමිෂන් සභාව විසින් ඒ විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලයේ හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ පාලක බලමණ්ඩලය වෙත ආපසු යැවිය යුතු අතර, එවිට ඒ

බලමණ්ඩලය, කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ හෝ සංශෝධන කරනු ලැබූ ඇස්තමේන්තු හා විසර්ජන භාර ගත යුතු ය:

එසේ වුව ද 100 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව ඒ පාලක බලමණ්ඩලය විසින් එක් වැය ශීර්ෂයක් සඳහා වෙන් කරනු ලැබූ මුදල් වෙනත් යම් ශීර්ෂයකට මාරු කළ හැකි ය:

එසේම තවදුරටත් එකී සෑම මාරු කිරීමක් ම ඉන්පසු හැකිතාක් ඉක්මණින්, අවස්ථාවෝචිත පරිදි, ඒ විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලයේ හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ ප්‍රධාන විධායක නිලධරයා විසින් කොමිෂන් සභාව වෙත වාර්තා කළ යුතු ය.

පරිපූරක ඇස්තමේන්තු.

105. අවශ්‍ය වූ විට හා බලාපොරොත්තු නොවූ වියදම් දැරීම පිණිස අවස්ථාවෝචිත පරිදි විශ්වවිද්‍යාලයක හෝ විවෘත විශ්වවිද්‍යාලයක හෝ මූල්‍යාධිකාරිවරයා විසින් නැතහොත් විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක භාණ්ඩාගාරික විසින් පරිපූරක වැය ඇස්තමේන්තු පිළියෙළ කිරීම ද ඒ ඇස්තමේන්තු ඒ විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලයේ හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ පාලක බලමණ්ඩලය විසින් සම්මත කිරීම ද කවර විටෙක වුවත් නීත්‍යනුකූල වන්නේ ය:

එසේ වුව ද ඒ පරිපූරක ඇස්තමේන්තු ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික විසර්ජන සමග අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා කොමිෂන් සභාව වෙත යැවිය යුතු ය:

එසේම තවදුරටත් ඒ පරිපූරක ඇස්තමේන්තු පාර්ලිමේන්තුව විසින් මුදල් වර්ෂය සඳහා සම්මත කරන ලද ප්‍රතිපාදනයට වැඩි නොවිය යුතු අතර, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ලැබීමෙන් පසු අමාත්‍යවරයා විසින් දෙනු ලබන පූර්ව අනුමතය නොමැතිව පුනරාවර්තන ස්වභාවයේ කිසිම මූල්‍ය වගකීමක් ඇති කර නොගත යුතු ය.

වාර්ෂික ගණන් හා සංඛ්‍යා ලේඛන ප්‍රකාශ.

106. (1) කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන පිළිවෙලට හා ආකාරයට සහ එසේ නියම කරනු ලබන විස්තර ඇතුළත් කොට සිය ආයතනයේ කටයුතුවලට අදාළ වාර්ෂික ගණන් හා සංඛ්‍යා ලේඛන පිළිබඳ ප්‍රකාශයක් එක් එක් උසස් අධ්‍යාපන ආයතනය විසින් පිළියෙළ කළ යුතු ය.

(2) උසස් අධ්‍යාපන ආයතනයක ගණන් පොත් ඒ ආයතනයේ කාර්යාලයෙහි තැබිය යුතු ය.

ගණන් විගණනය කිරීම.

107. (1) (අ) එක් එක් උසස් අධ්‍යාපන ආයතනය විසින් එහි ගණන් විගණකාධිපතිවරයා ලවා වර්ෂයක් පාසා විගණනය කරවා ගත යුතු ය. ඒ ගණන් විගණනය කිරීමෙහි ලා තමාට සහාය වීම පිණිස තමාගේ විධානය හා පාලනය යටතේ ක්‍රියා කරන සුදුසුකම් ලත් යම් විගණකවරයකුගේ හෝ විගණකවරයන්ගේ සේවය විගණකාධිපතිවරයා විසින් ලබා ගත හැකි ය.

(ආ) උසස් අධ්‍යාපන ආයතනයක එක් එක් මුදල් වර්ෂයේ ගණන් විගණනය කිරීම සඳහා ඒ මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු මාස හතරක් ඇතුලත ඒ ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) විගණකාධිපතිවරයාට සහ උසස් අධ්‍යාපන ආයතනයක ගණන් විගණනය කිරීමෙහි ලා ඔහුට සහාය වන යම් තැනැත්තකුට ගණන් විගණනය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි විගණකාධිපතිවරයා සලකන ඒ ආයතනයේ සියලු පොත්, වාර්තා, ඔප්පු, ගිවිසුම්, වවුචර සහ වෙනත් ලේඛන බැලීමට ඉඩ තිබිය යුතු අතර, ඒ කාර්යය සඳහා සපයන ලෙස නියම කරනු ලැබිය හැකි තමන් දන්නා තොරතුරු ඒ ආයතනය විසින් හා එහි නිලධරයන් විසින් ඔවුන්ට සැපයිය යුතු ය.

(3) උසස් අධ්‍යාපන ආයතනයක ගණන් විගණනය කිරීමෙහි ලා විගණකාධිපතිවරයා විසින් දරනු ලබන වියදම් පියවීමේ කාර්යය සඳහා මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයක් ඒ ආයතනයේ විශ්වවිද්‍යාල අරමුදලින් විගණකාධිපතිවරයාට ගෙවිය යුතු ය. විගණකාධිපතිවරයා විසින් උසස් අධ්‍යාපන ආයතනයකින් ලබන ලද යම් පාරිශ්‍රමිකයක් ඒ විගණන කාර්යය සඳහා ඔහු විසින් සේවයෙහි යොදවනු ලැබූ යම් සුදුසුකම් ලත් විගණකවරයකුට හෝ විගණකවරයන්ට ගෙවන ලද යම් මුදලක් ඉන් අඩු කර ගැනීමෙන් පසු ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

(4) මේ වගන්තියෙහි කාර්ය සඳහා "සුදුසුකම් ලත් විගණකවරයා" යන යෙදුමෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන් ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි ගණකාධිකාරි සමාගමක් ; හෝ

අදහස් වේ.

(5) උසස් අධ්‍යාපන ආයතනයක ගණන් විගණකාධිපතිවරයා විසින් විගණනය කිරීම කෙරෙහි හා ඒ සම්බන්ධයෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතු ය.

(6) (අ) විගණකාධිපතිවරයා විසින්, ඔහුගේ මතය අනුව, ගණන් වල ඇති, නීති විරෝධී හෝ නීතියට පටහැනි කිසිම කරුණකට ඉඩ නොදිය යුතු අතර ඒ ගෙවීම කරන හෝ ඒ සඳහා බලය දෙන නිලධරයා, ආචාර්යවරයා හෝ සේවකයා විෂයෙහි එය අධිභාර කළ යුතු ය. ඒ නිලධරයා, ආචාර්යවරයා හෝ සේවකයා විසින් ගණන් පෙන්විය යුතුව තිබුණු නමුදු එසේ ගණන් නොපෙන්වන ලද යම් මුදලක් ඒ නිලධරයා, ආචාර්ය වරයා හෝ සේවකයා කෙරෙහි වැය බර කළ යුතු ය. තවද විගණකාධිපතිවරයා විසින් එවැනි එක් එක් අවස්ථාවේ දී ඒ තැනැත්තාගෙන් අය විය යුතු මුදල සහතික කළ යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකුට, ආචාර්යවරයකුට හෝ සේවකයකුට විරුද්ධව යම් අධිභාරයක් හෝ ඉඩ නොදීමක් පිළි බඳව සහතික කිරීමට පෙර විගණකාධිපතිවරයා විසින්, ඒ යෝජිත අධිභාරය හෝ ඉඩ නොදීම සම්බන්ධ යෙන් ඒ තැනැත්තාට නිවේදනය කොට ඒ අධිභාරය හෝ ඉඩ නොදීමට විරුද්ධව කරුණු ඉදිරිපත් කිරීමේ හෝ කරුණු කියා සිටීමේ අයිතිවාසිකම පිළිබඳව ඒ තැනැත්තාට දන්වා, ඒ දැන්වීම යැවීමේ දින සිට දින දහහතරකට නොඅඩු දිනයක ඒ කරුණු කියා සිටීම සම්බන්ධයෙන් විභාග කිරීම හා පරීක්ෂා කිරීම සඳහා වේලාවක් හා ස්ථානයක් නියම කළ යුතු ය. තවද ඒ විභාගය හා පරීක්ෂණය අවසන් කිරීමෙන් පසු විගණකාධිපතිවරයා විසින්, ඒ කරුණු සටහන් කොට ඒ සම්බන්ධයෙන් තම තීරණයට හේතු දක්වමින් තීරණයක් ගත යුතු අතර, ඒ තීරණය හා ඊට හේතු ඒ තැනැත්තා වෙත හා අවස්ථාවෝචිත පරිදි විශ්වවිද්‍යාලයේ හෝ විවෘත විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා වෙත හෝ විශ්වවිද්‍යාලීය විද්‍යායතනයේ ලේකම්වරයා වෙත දැන්විය යුතු ය.

(ඇ) විගණකාධිපතිවරයාගේ තීරණයෙන් අතෘප්ත යම් තැනැත්තකු විසින්, ඒ තීරණය ඒ තැනැත්තා වෙත දැන්වීමෙන් පසු දින දහහතරක් ඇතුළත, එයට විරුද්ධව කොමිෂන් සභාව වෙත අභියාචනා කළ හැකි ය :

එසේ වුව ද විගණකාධිපතිවරයා විසින් යෝජිත අධිභාරය හෝ ඉඩ නොදීම පිළිබඳව දැනුම් දෙනු ලැබීමෙන් පසු විගණකාධිපතිවරයා ඉදිරියෙහි (ආ) ඡේදය යටතේ ඒ අධිභාරය හෝ ඉඩ නොදීම සම්බන්ධයෙන් පැවැත්වෙන යම් පරීක්ෂණයකට හෝ විභාගයකට පැමිණීම හෝ සහභාගිවීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින යම් තැනැත්තකුට මේ ඡේදය යටතේ කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමට හිමිකම් නොමැත්තේ ය.

(ඈ) (ඇ) ඡේදය යටතේ යම් අභියාචනයක් ලැබීමෙන් පසු කොමිෂන් සභාව විසින් ඒ අභියාචනය සැලකිල්ලට භාජන කොට—

(i) අභියාචනයෙහි දැක්වෙන කාරුණු අනුව ඒ අධිභාරය හෝ ඉඩ නොදීම ලිහිල් කිරීම යුක්ති සහගත හා සාධාරණ බව කොමිෂන් සභාව සලකන්නේ නම්, එසේ කරන ලෙස නියම කිරීම ; හෝ

(ii) ඒ අධිභාරයේ හෝ ඉඩ නොදීමේ ප්‍රමාණය වෙනස් කිරීම හෝ ස්ථිර කිරීම ; හෝ

(iii) ඒ අධිභාරය හෝ ඉඩ නොදීම සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් දරන්නට සිදු වූ වියදම් පිළිබඳව නියමයක් කිරීම හා ඒ තැනැත්තා වෙත හා අවස්ථාවෝචිත පරිදි අදාළ විශ්වවිද්‍යාලයේ හෝ විවෘත විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා වෙත හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ ලේකම්වරයා වෙත සහ විගණකාධිපතිවරයා වෙත ඒ තීරණය දැන්වීම

කළ යුතු ය.

(ඉ) යම් තැනැත්තකුට විරුද්ධව වූ අධිභාරයක් හෝ ඉඩ නොදීමක් විගණකාධිපතිවරයා විසින් සහතික කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ සහතිකය හෝ (ඈ) ඡේදයේ (ii) වන අනුඡේදය යටතේ කොමිෂන් සභාව විසින් මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් වෙනස් කරන ලද පරිදි වූ ඒ සහතිකය, එහි ඇතුළත් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පිළිගත යුතු සාක්ෂියක් වන්නේ ය.

(ඊ) (i) (ඇ) ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් අභියාචනයක් ස්ථිර කර ඇති අවස්ථාවක ; හෝ

(ii) (ඇ) ඡේදයේ අතුරු විධානය යටතේ අභියාචනය කිරීමේ අයිතියක් යම් තැනැත්තකුට නැති අවස්ථාවක,

අයකර ගත යුතු ලෙස, එවැනි යම් සහතික කිරීමකින් විධානය කරනු ලැබූ මුදල, ඒ සම්බන්ධ ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඒ අධිභාරය කරනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත නැතහොත් කොමිෂන් සභාවේ තීරණය දැනුම් දෙනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත ගෙවීම කරනු නොලැබූ හෝ ගෙවීමේ එකඟවීමකට එළඹෙනු නොලැබූ හෝ අවස්ථාවක, ඒ අධිභාරය හෝ ඉඩ නොදීම සහතික කරනු ලැබුවේ යම් තැනැත්තකුට විරුද්ධව ද ඒ තැනැත්තාට විරුද්ධව, උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විසින් හෝ ඒ නිලධරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ එසේ අය කර ගත හැකි ලෙස සහතික කරනු ලැබූ මුදල අය කර ගැනීම සඳහා නඩුවක් නිසි අධිකරණ බලය ඇති අධිකරණයක පැවරිය යුතු ය.

108. (1) විගණකාධිපතිවරයා විසින් එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ ගණන් පරීක්ෂා කොට— විගණකාධිපතිවරයාගේ වාර්තාව.

(අ) තමාට අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් තමා විසින් ලබා ගන්නා ලද්දේ ද නැද්ද යන්න ප්‍රකාශ කරමින් ;

(ආ) වාර්තාවේ සඳහන් ගණන් ඒ උසස් අධ්‍යාපන ආයතනයේ මුදල් පිළිබඳව සත්‍ය වූත් සාධාරණ වූත් තත්ත්වයක් පිළිබිඹු වන පරිදි නිසි ආකාරයට පිළියෙළ කර ඇත්තේ ද යන්න සඳහන් කරමින් ; සහ

(ඇ) ඒ උසස් අධ්‍යාපන ආයතනයේ කටයුතු හා ගණන් පිළිබඳව වූ යම් පරීක්ෂණයක දී පාර්ලිමේන්තුවට වැදගත් විය හැකි යයි තමා අදහස් කරන ඒ ගණන්වල යම් කරුණකට අවධානය යොමු කරවමින්

වාර්තාවක් සැපයිය යුතු ය.

(2) විගණකාධිපතිවරයා විසින් උසස් අධ්‍යාපන ආයතනයක් සම්බන්ධ තම වාර්තාව ඒ උසස් අධ්‍යාපන ආයතනය වෙත සහ කොමිෂන් සභාව වෙත යැවිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් විගණකාධිපතිවරයාගේ වාර්තාව ඒ උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බලමණ්ඩලය විසින් සලකා බැලිය යුතු අතර ඒ සලකා බැලීමෙන් පසු උසස් අධ්‍යාපන ආයතනය විසින් ඒ වාර්තාව උසස් අධ්‍යාපන ආයතනය වෙත සහ කොමිෂන් සභාව වෙත එවීමෙන් පසු මාස තුනක් ඇතුළත, ඒ වාර්තාවෙහි පෙන්නුම් කරන ලද කරුණු සම්බන්ධයෙන් ගන්නා ලද හෝ ගැනීමට යෝජිත පියවර විගණකාධිපතිවරයා වෙත දැන්විය යුතු ය.

විගණනය කරනු ලැබූ ගණන් පළ කිරීම.

109. උසස් අධ්‍යාපන ආයතනයක එක් එක් මුදල් වර්ෂය සඳහා වූ ගණන් විගණනය කිරීමෙන් පසු, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

වාර්ෂික ගණන් හා විගණකාධිපතිවරයාගේ වාර්තාව අමාත්‍යවරයා වෙත යැවිය යුතු බව.

110. එක් එක් වර්ෂය සම්බන්ධයෙන් වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත එක් එක් උසස් අධ්‍යාපන ආයතනය විසින්, එහි පාලක බලමණ්ඩලයේ යම් අදහසක් වේනොත් එය සමග ඒ වාර්තාව ද ඊට අදාළ වන ගණන් ප්‍රකාශය ද අමාත්‍යවරයා වෙත සහ කොමිෂන් සභාව වෙත යැවිය යුතු ය. අමාත්‍යවරයා විසින් ඒවායේ පිටපත් ඒ ගණන් හා වාර්තාව අදාළ වන වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන වර්ෂය අවසානවීමට පෙර පාර්ලිමේන්තුව ඉදිරියේ සභාගත කිරීමට සැලැස්විය යුතු අතර එයින් උද්ගත වන යම් ප්‍රශ්නවලට ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා පාර්ලිමේන්තුවේ මහජන ගිණුම් කාරක සභාව ඉදිරියෙහි පෙනී සිට පිළිතුරු දිය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනතේ ඇතැම් විධිවිධාන අදාළ වන බව.

111. 1971 අංක 38 දරන මුදල් පනතෙහි 13 වන වගන්තියේ (3) වන, (4) වන හා (7) වන උපවගන්තිවල විධිවිධාන ද 15 වන වගන්තියෙහි විධිවිධාන ද, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, යම් උසස් අධ්‍යාපන ආයතනයක ගණන් විගණනයට සහ ඒ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

XIV වන කොටස

ශිෂ්‍ය සභා හා සංගම්

ශිෂ්‍ය සභාව.

112. (1) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයට ඒ උසස් අධ්‍යාපන ආයතනයේ තත් කාලයෙහි ශිෂ්‍යයන්ව සිටින තැනැත්තන් අතුරින් තෝරා පත් කර ගනු ලබන ශිෂ්‍ය නියෝජිතයන්ගෙන් සමන්විත ශිෂ්‍ය සභාවක් තිබිය යුතු ය.

(2) ශිෂ්‍ය සභාවට කරනු ලබන තෝරා පත් කර ගැනීමක් සඳහා වූ සෑම ඡන්ද විමසීමක් ම එක් එක් අධ්‍යයන වර්ෂය ආරම්භයේ දී අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විසින් නම් කරනු ලබන තැනැත්තා හෝ තැනැත්තන් විසින් පැවැත්විය යුතු ය. ඒ ඡන්ද විමසීම්වල දී ඡන්දය දීම රහස් ඡන්දය මගින් විය යුතු ය.

(3) ශිෂ්‍ය සභාවක ධුර කාලය, එය තෝරා පත් කරනු ලැබුවේ යම් අධ්‍යයන වර්ෂයක දී ද ඒ අධ්‍යයන වර්ෂය අවසානයේ දී අවසන් වන්නේ ය

ශිෂ්‍ය සභාවේ නිලධරයෝ.

113. (1) එක් එක් ශිෂ්‍ය සභාව විසින්, සභාපතිවරයකු, උප සභාපතිවරයකු, ලේකම්වරයකු හා කණිෂ්ඨ භාණ්ඩාගාරිකයකු තෝරා පත් කළ යුතු අතර ඔවුහු ශිෂ්‍ය සභාවේ නිලධරයෝ වන්නාහ.

(2) එක් එක් ශිෂ්‍ය සභාවට ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකයකු විය යුත්තේ ය. ඔහු ශිෂ්‍ය සභාව විසින් නම් කරනු ලබන ආචාර්යවරයකු විය යුතු අතර ඔහුගේ නම් කිරීම ඒ සභාව අයත් උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විසින් අනුමත කරනු ලැබ තිබිය යුතු ය.

(3) එක් එක් ශිෂ්‍ය සභාව විසින්, එහි කටයුතු කරගෙන යාමේ කාර්යය සඳහා, නියමාවලි මගින් නියම කරනු ලබන ස්ථාවර කමිටු වක් හෝ කමිටු පත් කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද යම් ශිෂ්‍ය සභාවක සභාපතිවරයා හෝ ලේකම්වරයා එකී ස්ථාවර කමිටුවක හෝ කමිටුවල සාමාජිකයෙක් නොවන්නේ ය.

ශිෂ්‍ය සභාව බාහිර සංවිධානවලට අනුබද්ධ නොවිය යුතු බව.

114. ශිෂ්‍ය සභාවක් ඒ සභාව අයත් උසස් අධ්‍යාපන ආයතනයෙන් බාහිර කිසිම සංවිධානයක් හෝ මණ්ඩලයක් සමග අනුබද්ධ නො විය යුතු ය.

ඇතැම් සමිති, සමාජ හා වෙනත් සංගම් පිළිගැනීම.

115. (1) උසස් අධ්‍යාපන ආයතනයක, ශාස්ත්‍රීය හෝ සමාජයීය අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ කාර්යය සඳහා ම පිහිටුවනු ලැබුවා වූද සම්පූර්ණ සාමාජික සංඛ්‍යාව ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ශිෂ්‍යයන්ගෙන් පමණක් සමන්විත වන්නා වූ ද, යම් ශිෂ්‍ය සමිතියක්, සමාජයක් හෝ වෙනත් සංගමයක් ඒ උසස් අධ්‍යාපන ආයතනය විසින්, කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, පිළිගත හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පිළිගන්නා ලද සමිති, සමාජ හෝ වෙනත් සංගම් ලියාපදිංචි කිරීමේ ක්‍රමය ද ඒවායේ කාර්තව්‍ය ද ඒවායේ නිලධරයන් පත් කර ගැනීම සඳහා ඡන්ද විමසීම් පැවැත්විය යුතු ආකාරය ද ඒ නිලධරයන්ගේ කාර්ය හා කර්තව්‍ය ද 117 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බලමණ්ඩලය විසින්, අතුරු ව්‍යවස්ථා මගින් නියම කළ හැකි ය.

පාලක බල මණ්ඩලය විසින්, අනුමත කරන ලද කටයුතු සඳහා ශිෂ්‍ය සභාවලට, සමිතිවලට, සමාජවලට හා වෙනත් ආයතනවලට මුදල් වෙන් කර දීම.

116. ශිෂ්‍ය සභාවට හෝ 115 වන වගන්තිය යටතේ පිළිගනු ලැබූ යම් සමිතියකට, සමාජයකට හෝ වෙනත් සංගමයකට, ඒවායේ අනුමත කරන ලද කටයුතුවලට අවශ්‍ය යයි අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බලමණ්ඩලය විසින් සලකනු ලබන මුදල්, ඒ බල මණ්ඩලය විසින් කලින් කල වෙන් කර දෙනු ලැබිය හැකි ය.

ශිෂ්‍ය සභාවක සංයුතිය හා එහි නිලධරයන්ගේ කාර්යය හා කර්තව්‍ය කොමිෂන් සභාව විසින් නියම කළ යුතු බව.

117. පහත සඳහන් කරුණු කොමිෂන් සභාව විසින් නියමාවලි මගින් නියම කළ යුතු ය :—

(i) ශිෂ්‍ය සභාවේ කාර්ය හා කර්තව්‍ය ;

(ii) එක් එක් ශිෂ්‍ය සභාව සමන්විත වන ශිෂ්‍ය නියෝජිතයන් සංඛ්‍යාව හා ඔවුන් තෝරා පත් කර ගැනීමේ ක්‍රමය ;

(iii) ශිෂ්‍ය සභාවක් විසින් පත් කළ හැකි ස්ථාවර කමිටුව හෝ කමිටු සහ ඒ කමිටුවේ හෝ කමිටුවල කාර්ය හා කර්තව්‍ය ;

(iv) ශිෂ්‍ය සභාවේ සභාපතිවරයාගේ, උප සභාපතිවරයාගේ ලේකම්වරයාගේ හා කණිෂ්ඨ භාණ්ඩාගාරිකගේ කාර්ය හා කාර්තව්‍ය ;

(v) 116 වන වගන්තිය යටතේ ශිෂ්‍ය සභාවට හා යම් සමිතියකට, සමාජයකට හෝ වෙනත් සංගමයකට වෙන් කර දෙනු ලැබූ මුදල් පාවිච්චි කළ හැකි කාර්යය හෝ කාර්ය ; සහ

(vi) ශිෂ්‍ය සභාවේ හා යම් සමිතියක, සමාජයක හෝ වෙනත් සංගමයක ගිණුම් තබා ගත යුතු හා විගණනය කළ යුතු ආකාරය හා පිළිවෙළ.

ශිෂ්‍ය සභාවක්, සමිතියක්, සමාජයක් හෝ වෙනත් සංගමයක් තාවකාලිකව තහනම් කිරීම හෝ විසුරුවා හැරීම.

118. (1) යම් උසස් අධ්‍යාපන ආයතනයක යම් ශිෂ්‍ය සභාවක්, සමිතියක්, සමාජයක් හෝ වෙනත් සංගමයක් උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ මතය අනුව ඒ ආයතනයේ හොඳ නමට අහිතකර හෝ හානිකර අයුරින් ක්‍රියා කරනහොත් හෝ මේ පනතට හෝ යම් ලිඛිත නීතියකට පටහැනිව ක්‍රියා කරත හොත්, ඒ ප්‍රධාන විධායක නිලධරයා විසින් ඒ සභාව හෝ සමිතිය, සමාජය හෝ වෙනත් සංගමය තාවකාලිකව තහනම් කිරීම හෝ විසුරුවා හැරීම කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් ශිෂ්‍ය සභාවක් විසුරුවා හැර ඇති අවස්ථාවක, ප්‍රධාන විධායක නිලධරයා විසින්, 112 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, අලුත් ශිෂ්‍ය සභාවක් තෝරා පත් කර ගැනීමේ කාර්යය සඳහා දිනයක් නියම කළ හැකි ය. ඒ ශිෂ්‍ය සභාව තෝරා පත් කර ගනු ලද්දේ යම් අධ්‍යයන වර්ෂයක් තුළ දී ද ඒ අධ්‍යයන වර්ෂයේ අවසානය තෙක් ඒ ශිෂ්‍ය සභාව නිල දැරිය යුතු ය.

XV වන කොටස

නිවාස හා නගර සංවර්ධන ආඥාපනත අදාළ කිරීම

උසස් අධ්‍යාපන ආයතනයේ භූමි සීමා තුළ හෝ ඒ ආසන්නයෙහි වූ ප්‍රදේශ වලට 268 වන අධිකාරය අදාළ වීම.

119. (1) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතෙහි කුමක් සඳහන් ව ඇත ද, උසස් අධ්‍යාපන ආයතනයක භූමි සීමා ඇතුළත පහසුකම් ආරක්ෂා කර ගැනීම පිණිස අවශ්‍යානුකූල යයි අමාත්‍යවරයා සලකනහොත්, එකී ආඥාපනත අන්‍යාකාරයකින් අදාළ නො වන උසස් අධ්‍යාපන ආයතනයක භූමි සීමා තුළ හෝ ඒ ආසන්නයෙහි යම් කිසි ප්‍රදේශයක් කෙරෙහි, ඒ ප්‍රදේශය පළාත් පාලන ආයතනයක සීමාවලට ඇතුළත් ප්‍රදේශයක් වුවාක් මෙන් එකී ආඥාපනතේ II වන කොටසෙහි I වන පරිච්ඡේදය මේ වගන්තියේ (2) වන උපවගන්තියෙහි සඳහන් වෙනස් කිරීම්වලට යටත්ව, අදාළ වන බව, කොමිෂන් සභාවේ නිර්දේශය හා පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින් ප්‍රකාශ කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ යම් නිවේදනයක් පළ කරනු ලැබූ විට පහත සඳහන් වෙනස් කිරීම්වලට යටත්ව එකී පරිච්ඡේදය ඒ අනුව අදාළ වන්නේ ය :—

(i) "සභාපතිවරයා" යන වචනය එහි යම් තැනක යෙදේ ද ඒ සෑම තැනකම ඒ වෙනුවට "ප්‍රධාන විධායක නිලධරයා" යන වචන ආදේශ කළ යුතු ය;

(ii) එහි 7 වන වගන්තිය වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කළ යුතු ය :—

" අනුමතය හෝ කැමැත්ත ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථා.

7. උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන **විධායක නිලධරයා විසින්—**

(අ) යම් ගොඩනැගිල්ලක යම් **සැලැස්මක්,** ඇඳීමක් හෝ මැඩ විස්තරයක් අනුමත කිරීම ; හෝ

(ආ) ගොඩනැගිල්ල හෝ ගොඩනැගිල්ලේ වෙනස් කිරීම්

තමාගේ මතය අනුව උසස් අධ්‍යාපන ආයතනයේ භූමි සීමා තුළ පහසුකම්වලට හානිකර විය හැකි ස්වභාවයේ නම් මිස හෝ ඒ අනුමතය හෝ කැමැත්ත ඉල්ලීම කරන්නා 8 වන වගන්තිය යටතේ කරන ලද යම් නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරිනහොත් මිස, යම් ගොඩනැගිල්ලක යම් වෙනස් කිරීමකට කැමැත්ත දීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය. ";

(iii) එහි 8 වන වගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කළ යුතු ය :—

" (අ) ප්‍රධාන විධායක නිලධරයා විසින් නියම කරනු ලබන ආකෘතියෙහි සහ එසේ නියම කරනු ලබන විස්තර ඇතුළත් සැලසුම්, ඇඳීම් හා වැඩ විස්තර ඉදිරිපත් කිරීම ; " ;

(iv) එහි 8 වන වගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කළ යුතු ය :—

" (ආ) එසේ ඉදිරිපත් කරනු ලැබූ යම් සැලැස්මක්, ඇඳීමක් හෝ වැඩ විස්තරයක් ඒ ආකෘතියට අනුකූල වන පරිදි හෝ එහි ඒ යම් විස්තරයක් ඇතුළත් වන පරිදි එය සංශෝධනය කිරීම ; " ;

(v) එහි 8 වන වගන්තියේ (ඇ) ඡේදයෙහි " ආඥාපනත " යන වචනය වෙනුවට " මේ පරිච්ඡේදය " යන වචන ආදේශ කළ යුතු ය ;

(vi) එහි 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කළ යුතු ය :—

" (ඇ) මේ පරිච්ඡේදයේ කවර වූ හෝ විධිවිධානයක් කඩ කරමින් යම් ගොඩනැගිලි ඉදි කිරීමේ කටයුතු කිරීම ; " ;

(vii) එහි 13 වන වගන්තියේ (2) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කළ යුතු ය :—

" (2) යම් තැනැත්තකු මේ වගන්තිය යටතේ වරදකරු වකු කරනු ලැබූ යම් අවස්ථාවක, මහෙස්ත්‍රාත් වරයා විසින්, ප්‍රධාන විධායක නිලධරයාගේ

ඉල්ලීම පිට, ආඥාවෙහි නියමිත කාලය ඇතුළත ප්‍රස්තුත ගොඩනැගිල්ල කඩා දැමීමට හෝ උසස් අධ්‍යාපන ආයතනයේ භූමි සීමා තුළ පහසුකම් වලට හානියක් නොවන පරිදි ඒ ගොඩනැගිල්ල වෙනස් කිරීමට ඒ තැනැත්තාට හෝ ගොඩනැගිල්ලෙහි අයිතිකරුට හෝ ඒ දෙදෙනාට ම නියම කරමින් විධානාත්මක ආඥාවක් කළ හැකි අතර ඒ විධානාත්මක ආඥාව අනුව ක්‍රියා කර නොමැති අවස්ථාවක ඒ ගොඩනැගිල්ල කඩා දැමීමට, වෙනස් කිරීමට හෝ ආඥාව අනුව ක්‍රියා කිරීම සහතික කෙරෙන ආකාරයකට ඒ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් අන්‍යාකාරයකට කටයුතු කිරීමට ප්‍රධාන විධායක නිලධරයාට බලය දිය හැකි ය. එසින් දැරීමට සිදුවන වියදම්, මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කිරීමෙන් පසු ඔහු විසින් නියම කරන ලද දඩයක ආකාරයෙන්ම අයකරගත යුතු වාක් මෙන්ම අයකර ගැනීමෙන් පසු එය උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා වෙත ගෙවිය යුතු ය.";

(viii) එහි 15 වන වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් උපවගන්තිය ආදේශ කළ යුතු ය :—

"(1) මේ ආඥාපනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසු ඉදි කරනු ලැබූ ගොඩනැගිල්ලක් ඉදි කිරීම අතින්, ජලාපවහනය අතින් හා අන් සියලු ආකාරයෙන් උසස් අධ්‍යාපන ආයතනයක භූමි සීමා තුළ පහසුකම්වලට හානියක් නොවන බවට ප්‍රධාන විධායක නිලධරයා විසින් සහතිකයක් නිකුත් කරනු ලබන තුරු ඒ ගොඩනැගිල්ල, භාරකරුවකු විසින් හැර, පදිංචියට නො ගත යුතු ය.";

(ix) එහි 16 වන වගන්තියෙහි අභියාචනා විනිශ්චය අධිකාරය යන සඳහන ඒ ප්‍රදේශය පිහිටියා වූ දිස්ත්‍රික්කයෙහි අධිකරණ බලය දරන දිසා අධිකරණය පිළිබඳ සඳහනක් ලෙස සැලකිය යුතු ය.

(3) මේ වගන්තියෙහි විධිවිධාන යටතේ උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධරයා වෙත පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීම ඒ ආයතනයේ පාලක බලමණ්ඩලයේ අනුමතයට යටත් විය යුතු අතර, උසස් අධ්‍යාපන ආයතනයේ භූමි සීමා තුළ පහසුකම්වලට හානි පැමිණීමේ හේතුව පිට එකී ප්‍රදේශය තුළ යම් ගොඩනැගිල්ලක යම් සැලැස්මක්, ඇඳීමක් හෝ වැඩ විස්තරයක් අනුමත කිරීම හෝ යම් වෙනස් කිරීමකට කැමැත්ත දීම ඒ ප්‍රධාන විධායක නිලධරයා විසින් ප්‍රතික්ෂේප කරනහොත් ඒ ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රතිඵල වශයෙන් යම් පාඩුවක් හෝ හානියක් විඳීමට සිදු වන යම් තැනැත්තකුට උසස් අධ්‍යාපන ආයතනය විසින් වන්දි ගෙවිය යුතු ය ; තවද එසේ වන්දි ගෙවීම හෝ ප්‍රමාණවත් වන්දියක් ගෙවීම උසස් අධ්‍යාපන ආයතනය විසින් පැහැර හැරීම නිසා අනාපත්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ ප්‍රදේශය පිහිටි

දිස්ත්‍රික්කයෙහි අධිකරණ බලය දරන දිසා අධිකරණය වෙත අභියාචනා කළ හැකි අතර එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් දිසා අධිකරණය දෙන තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය.

XVI වන කොටස

ආණ්ඩුවේ නිවාස (සන්තකය නැවත ලබා ගැනීමේ) පනත අදාළ කිරීම

120. (1) 1969 අංක 7 දරන ආණ්ඩුවේ නිවාස (සන්තකය නැවත ලබා ගැනීමේ) පනතෙහි විධිවිධාන— 1969 අංක 7 දරන පනත විශ්වවිද්‍යාල නිවාසවලට අදාළ කිරීම.

(අ) (2) වන උපවගන්තියෙහි දැක්වෙන වෙනස් කිරීම්වලට යටත්ව විශ්වවිද්‍යාල නිවාසවලට අදාළ වන්නේ ය; තවද

(ආ) නැනැත්තන් විසින් විශ්වවිද්‍යාල නිවාසවල පදිංචිව සිටීමේ ව්‍යංජිත කොන්දේසියක් වූ ලෙස හා වන ලෙස සෑම කල්හි ම සලකනු ලැබිය යුතු ය.

(2) ආණ්ඩුවේ නිවාස (සන්තකය නැවත ලබා ගැනීමේ) පනතෙහි විධිවිධාන විශ්වවිද්‍යාල නිවාසවලට අදාලවීමේ දී පහත සඳහන් පරිදි වෙනස් කරනු ලැබේ :—

(i) ඒ පනතෙහි "ආණ්ඩුවේ නිවාස" යන වචන යම් තැනක යෙදේද ඒ වෙනුවට ඒ සෑම තැනක ම "විශ්වවිද්‍යාල නිවාස" යන වචන ආදේශ කළ යුතු ය;

(ii) එහි 9 වන වගන්තියෙහි—

(අ) "නියම බලධරයා" යන්නෙහි නිර්වචනය වෙනුවට පහත සඳහන් නිර්වචනය ආදේශ කළ යුතු ය :—

"නියම බලධරයා" යන්නෙන් කොමිෂන් සභාවේ ලේකම්වරයා හෝ මේ පනතේ කාර්ය සඳහා නියම බලධරයා වශයෙන් ක්‍රියා කිරීමට කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් බලය දෙනු ලැබූ, අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරිවරයා හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක ලේකම්වරයා හෝ අදහස් වේ ; තව ද

(ආ) එහි "ආණ්ඩුවේ නිවාස" යන්නෙහි නිර්වචනය වෙනුවට පහත සඳහන් නිර්වචනය ආදේශ කළ යුතු ය :—

"විශ්වවිද්‍යාල නිවාස" යන්නෙන්, නැවතී සිටීමේ කාර්ය සඳහා යොදා ගනු ලැබූ හෝ පාවිච්චි කරනු ලැබූ ද කොමිෂන් සභාව හෝ විශ්වවිද්‍යාලයක් හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් විසින් නැතහොත්

වෙනුවෙන් පවරනු ලැබූ ද යම් ගොඩනැගිල්ලක්, කාමරයක් හෝ වෙනත් ස්ථානයක් අදහස් වන අතර ඒ ගොඩනැගිල්ල, කාමරය හෝ ස්ථානය පිහිටි ඉඩම හෝ ස්ථානය එයට ඇතුළත් වේ.

XVII වන කොටස

පොදු විධිවිධාන

කොමිෂන් සභාවේ, අභියාචනා මණ්ඩලයේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක, බලමණ්ඩලයක හෝ වෙනත් මණ්ඩලයක සාමාජිකයන් වීමට නුසුදුස්සන්.

121. යම් තැනැත්තෙක්—

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නොවන්නේ නම්; හෝ

(ආ) දණ්ඩනීය වරදක් සම්බන්ධයෙන් වරදකරු වී සිටී නම්; හෝ

(ඇ) කවර කාලයක බලපවත්නා යම් නීතියක් යටතේ සිහි විකලව සිටින බව නිර්ණය කරනු ලැබ හෝ ප්‍රකාශ කරනු ලැබ සිටී නම්; හෝ

(ඈ) තමාගේ සේවය පිළිබඳ ගිවිසුම හැර යම් උසස් අධ්‍යාපන ආයතනයක් විසින් හෝ ඒ වෙනුවෙන් කර ගන්නා වූ යම් ගිවිසුමක් යටතේ තමා විසින් සෘජුව ම හෝ තමා වෙනුවෙන් හෝ තම ප්‍රයෝජනය හෝ ප්‍රතිලාභය පිණිස යම් තැනැත්තකුගේ මාර්ගයෙන් අන් අයුරකින් යම් අයිතියක් හෝ ලාභයක් සතුව සිටී නම් හෝ භුක්ති විඳී නම්

ඒ තැනැත්තා කොමිෂන් සභාවට, අභියාචනා මණ්ඩලයට හෝ උසස් අධ්‍යාපන ආයතනයක යම් බලමණ්ඩලයකට හෝ වෙනත් යම් මණ්ඩලයකට පත් කරනු ලැබීමට හෝ එහි සාමාජිකයකු වීමට සුදුස්සෙක් නොවන්නේ ය.

කොමිෂන් සභාවේ සහ අභියාචනා මණ්ඩලයේ සාමාජිකයන් හා කාර්ය මණ්ඩලය ද උසස් අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලය ද රජයේ සේවකයන් වශයෙන් සලකනු ලැබීම.

122. කොමිෂන් සභාවේ සහ අභියාචනා මණ්ඩලයේ සියලු සාමාජිකයන් හා කාර්ය මණ්ඩලය ද එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයේ සියලු සාමාජිකයන් ද දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාව, අභියාචනා මණ්ඩලය සහ එක් එක් උසස් අධ්‍යාපන ආයතනය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වීම.

123. කොමිෂන් සභාව, අභියාචනා මණ්ඩලය සහ එක් එක් උසස් අධ්‍යාපන ආයතනය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර ඒ පනතෙහි විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

124. විශ්වවිද්‍යාලවලට සහ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනවලට පොදු සම්බන්ධතාවක් ඇති කාරණා සලකා බැලීමේ කාර්ය සඳහා ද ඒ කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාවට උපදෙස් දීම සඳහා ද උප කුලපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුවක් පිහිටුවනු ලැබේ.

උප කුලපති වරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව.

125. උසස් අධ්‍යාපන ආයතනයක යම් බලමණ්ඩලයකට හෝ වෙනත් මණ්ඩලයකට යම් තැනැත්තකු යථා පරිදි තෝරා පත් කරනු ලැබී ද, පත් කරනු ලැබී ද, නම් කරනු ලැබී ද, අනිරේකව යොදවාගනු ලැබී ද, නැතහොත් ඔහු ඒ බලමණ්ඩලයේ හෝ වෙනත් මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් සිටීමට හිමිකම් ලබා තිබේ ද යන්න ගැන යම් ප්‍රශ්නයක් පැන නැගුනහොත් ඒ ප්‍රශ්නය කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු අතර ඒ පිළිබඳ කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වන්නේ ය.

තෝරා පත් කිරීම, පත් කිරීම යනාදියෙහි වලංගු භාවය පිළිබඳ ප්‍රශ්න.

126. කොමිෂන් සභාවේ, අභියාචනා මණ්ඩලයේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක යම් බලමණ්ඩලයක හෝ වෙනත් මණ්ඩලයක කිසිම ක්‍රියාවක්, යෝජනා සම්මතයක් හෝ ක්‍රියා මාර්ගයක්, එහි සාමාජිකයන් අතර පුරප්පාඩුවක් හෝ පුරප්පාඩු තිබීමේ හෝ එහි සාමාජිකයන් පත් කිරීමේ යම් දෝෂයක් හෝ දෝෂ ඇතිවීමේ හේතුවෙන් හෝ එහි යම් සාමාජිකයකු හෝ සාමාජිකයන් 121 වන වගන්තිය යටතේ නුසුදුස්සකු හෝ නුසුදුස්සන් වීමේ හේතුවෙන් පමණක් අවලංගු නො වන්නේ ය.

පුරප්පාඩු හෝ යම් දෝෂ තිබීමේ හේතුවෙන්, යෝජනා හෝ කටයුතු අවලංගු නොවන බව.

127. කොමිෂන් සභාව හෝ අභියාචනා මණ්ඩලය හෝ යම් උසස් අධ්‍යාපන ආයතනයක් විසින්, තම සාමාජිකයන් කිසිවකුට මුදල් පාරිතෝෂිකයක් නොවන යම් ප්‍රසාද ලාභයක් හෝ ත්‍යාගයක් දීම හෝ ඔවුන් අතර යම් මුදලක් බෙදා දීම, මේ පනතට හෝ යම් උචිත සාධක පනතකට අනුකූල වන පරිදි හැර, නො කළ යුතු ය.

ත්‍යාග ආදිය.

128. (1) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන කුමක් වුව ද විශ්වවිද්‍යාලයක් හෝ විවෘත විශ්වවිද්‍යාලයක් හෝ 1968 අංක 16 දරන පනත යටතේ පිහිටුවනු ලැබූ බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය හෝ නොවන කිසිම තැනැත්තකු, ආයතනයක්, සංස්ථාවක් හෝ වෘත්තීය හෝ වෙනත් මණ්ඩලයක් විසින් යම් තැනැත්තකු හෝ තැනැත්තන් වෙත යම් උපාධියක් හෝ කවර හෝ අන් අධ්‍යයන ශාස්ත්‍රීය විශිෂ්ටතාවයක් ප්‍රදානය කිරීම හෝ පිරිනැමීම නො කළ යුතු ය:

එසේ වුවද වෘත්තීය මණ්ඩල හෝ පර්යේෂණ ආයතන විසින් ඒ විශ්වවිද්‍යාලය සමග කරගනු පිළියෙළ කර ගැනීමෙන් සහ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කළ හැකි ය.

(2) යම් තැනැත්තකු, ආයතනයක්, සංස්ථාවක්, වෘත්තීය හෝ වෙනත් මණ්ඩලයක් විසින් (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරනු ලැබූ අවස්ථාවක ඒ තැනැත්තා හෝ ඒ ආයතනයේ, සංස්ථාවේ, වෘත්තීය හෝ වෙනත් මණ්ඩලයේ කළමනාකාරිත්වය පිළිබඳ වග කිව යුතු පාලක බලමණ්ඩලය, අධිකාරිය, අධ්‍යක්ෂ වරයා හෝ අන් තැනැත්තා හෝ තැනැත්තන් වරදකරුවන් වන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙසිය පනහක දඩයකට ඔවුන් යටත් විය යුතු ය.

විශ්වවිද්‍යාලය නො වන කිසිම තැනැත්තකු හෝ මණ්ඩලයක් විසින් උපාධි ප්‍රදානය නො කළ යුතු බව.

වෙනත් ආයතන උසස් අධ්‍යාපන ආයතනයකට මාරු කිරීම.

129. (1) ආණ්ඩුව විසින් පවත්වාගෙන යනු ලබන හා පාලනය කරන යම් ආයතනයක්, ශාස්ත්‍රාලයක් හෝ විද්‍යාලයක් එහි යම් චංචල දේපළක් සමග අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් උසස් අධ්‍යාපන ආයතනයක් වෙත පැවරිය හැකි අතර ඒ ආයතනයේ, ශාස්ත්‍රාලයේ හෝ විද්‍යාලයේ යම් නිශ්චල දේපළ, ඉඩම් විෂයය භාර අමාත්‍යවරයා විසින් කරනු ලබන එබඳු ම නියමයක් මගින් ඒ උසස් අධ්‍යාපන ආයතනය සතු කළ හැකි ය.

(2) එකී නියමයක් පළ කරනු ලැබීමෙන් පසු ඒ ආයතනයේ, ශාස්ත්‍රාලයේ හෝ විද්‍යාලයේ චංචල හා නිශ්චල දේපළ නියමයෙහි සඳහන් දින සිට උසස් අධ්‍යාපන ආයතනය සතු වන්නේ ය.

“විශ්වවිද්‍යාලය” යන වචනය භාවිත කිරීම පිළිබඳ සීමා කිරීම.

130. (1) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, මේ වගන්තියේ කාර්ය සඳහා නියම කරනු ලබන දිනයක හෝ ඉන් පසු, උසස් අධ්‍යාපන ආයතනයක් නොවන වෙන යම් අධ්‍යාපන ආයතනයක්, “විශ්වවිද්‍යාලය” යන වචනය ඇතුළත් නමකින් හෝ නමක් යටතේ පිහිටුවීම හෝ පවත්වාගෙන යාම නො කළ යුතු ය.

(2) යම් අධ්‍යාපන ආයතනයක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කිරීමක් සිදු වූ අවස්ථාවක ඒ ආයතනයේ පාලක බලමණ්ඩලයේ එක් එක් සාමාජිකයා හෝ ඒ ආයතනයේ අයිතිකරු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නියම කරනු ලැබූ දිනයෙන් පසුව එහි නාමය හෝ නාමයෙහි කොටසක් වශයෙන් “විශ්වවිද්‍යාලය” යන වචනය පාවිච්චි කරනු ලැබූ එක් එක් දිනය සඳහා රුපියල් සියයක දඩයකට ඔහු යටත් වන්නේ ය.

(3) මේ වගන්තියේ (1) වන හා (2) වන උපවගන්ති 1968 අංක 16 දරන පනත යටතේ පිහිටුවනු ලද බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයට අදාළ නොවන්නේ ය.

XVIII වන කොටස

විශේෂ විධිවිධාන

උසස් අධ්‍යාපන ආයතනයක භූමි භාගයට ඇතැම් තැනැත්තන් ඇතුල්වීම තහනම් කිරීම.

131. (1) උසස් අධ්‍යාපන ආයතනයක භූමි භාගයට යම් තැනැත්තකුගේ පැමිණීම ඒ ආයතනයේ පාලක බල මණ්ඩලයේ මතය අනුව නුසුදුසු වන අවස්ථාවක ඒ ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විසින්, කරුණු ඉදිරිපත් කිරීමට ඒ තැනැත්තාට අවස්ථාවක් සලස්වා දීමෙන් පසු, ඒ තැනැත්තා වෙත භාර දෙනු ලබන ඒ නිලධරයාගේ අත්සන යටතේ වූ ලිපියක් මගින් ඒ තැනැත්තා, ඒ භූමි භාගයට හෝ ඒ ලිපියෙහි නිශ්චිතව සඳහන් යම් කොටසකට ඇතුල්වීම හා එහි නතරව සිටීම, ඒ පාලක බලමණ්ඩලයේ කැමැත්ත ඇතිව, තහනම් කළ හැකි ය. ඒ තහනම ඒ ප්‍රධාන විධායක නිලධරයා විසින් ඒ පාලක බල මණ්ඩලයේ කැමැත්ත ඇතිව ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තෙක් බල පවත් වන්නේ ය.

(2) සහතිකයේ නම් කරනු ලැබූ යම් තැනැත්තකු උසස් අධ්‍යාපන ආයතනයක භූමි භාගයට හෝ එහි නිශ්චිතව සඳහන් කොටසකට ඇතුල්වීම හෝ එහි නතරව සිටීම (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව තහනම් කර ඇති බවට උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධරයාගේ අත්සන යටතේ වූ සහතිකයක්, ඒ සහතිකයෙහි ප්‍රකාශ කරනු ලැබූ කරුණු සම්බන්ධයෙන් සාක්ෂි වශයෙන් යම් අධිකාරයක් විසින්, පටහැනි තත්ත්වය ඔප්පු කරන තෙක්, භාර ගැනීම හා පිළි ගැනීම කළ යුතු ය.

(3) උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධරයා විසින් නිකුත් කරනු ලැබූ හා අත්සන් කරනු ලැබූ සහතිකයක් ලෙස සැලකෙන ලේඛනයක් සාක්ෂි වශයෙන් පිළිගත යුතු අතර පටහැනි තත්ත්වය ඔප්පු කරනු ලබන තෙක් එය ඒ නිලධරයා විසින් (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

132. උසස් අධ්‍යාපන ආයතනයක භූමි භාගයට හෝ එහි යම් කොටසකට ඇතුල්වීම හෝ එහි නතර වී සිටීම 131 වන වගන්තියේ විධිවිධාන යටතේ තහනම් කරනු ලැබූ තැනැත්තකු, සැහෙන හේතුවක් නොමැතිව ඒ භූමි භාගයට හෝ එහි කොටසකට ඇතුල් වුවහොත් හෝ එහි නතර වී සිටියහොත්, ඔහු වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූවිට ඒ භූමි භාගයට හෝ එහි කොටසකට ඔහු ඇතුල්වූ හෝ එහි නතර වී සිටි එක් එක් දිනය හෝ ඉන් කොටසක් සම්බන්ධයෙන් රුපියල් සියයක දඩයකට ඔහු යටත් වන්නේ ය. තහනමට අකීකරුවීමේ වරදට දණ්ඩනය.

133. 131 වන වගන්තිය යටතේ වූ වරදක් ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පරිපාලන පනතෙහි අර්ථානුකූලව සංඥෙය වූ ද ඇප දිය හැකි වූ ද වරදක් වන්නේ ය. 131 වන වගන්තිය යටතේ වූ වැරදි සංඥේය වන හා ඇප දිය හැකි වන බව.

XIX වන කොටස

ලිඛිත ව්‍යවස්ථා, අතුරු ව්‍යවස්ථා, නියෝග හා රීති

134. (1) මේ පනතේ හා එය යටතේ කරනු ලැබූ නියමයන්හි හා සාදනු ලැබූ නියමාවලිවල විධිවිධානවලට යටත්ව, විශ්වවිද්‍යාලයක උත්තර මණ්ඩලය විසින් පහත සඳහන් කරුණු සියල්ල හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් ලිඛිත ව්‍යවස්ථා සාදනු ලැබිය හැකි ය :— ලිඛිත ව්‍යවස්ථා.

(අ) අන්‍යාකාර විධිවිධාන සලසා නොමැති අවස්ථාවක යම් බලමණ්ඩලයක හෝ වෙනත් යම් මණ්ඩලයක පුරප්පාඩු පිරවීම හා යම් බලමණ්ඩලයක් හෝ වෙනත් යම් මණ්ඩලයක් කැඳවීම ;

(ආ) පිරිනැමිය යුතු උපාධි, අභිඥාන පත්‍ර, සහතික හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා නිශ්චය කිරීම ;

(ඇ) සම්මාන උපාධි පිරිනැමීම ;

(ඈ) කවර ආකාරයකින් හෝ සපයනු ලබන මුදල්වලින් හෝ දේපලවලින් අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ජාතු දක්ෂිණා ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග ඇති කිරීම හා ප්‍රදානය කිරීම ;

(ඉ) ලිඛිත ව්‍යවස්ථා සෑදීමට මේ පනතෙහි විධිවිධාන යටතේ බලය පැවරී හෝ නියමිතව ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ සියලු කාරණා ;

(ඊ) මේ පනතෙහි විධිවිධාන යටතේ ලිඛිත ව්‍යවස්ථා මගින් නියම කළ යුතු හෝ නියම කල හැකි සියලු කාරණා.

(2) උත්තර මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ විට සෑම ලිඛිත ව්‍යවස්ථාවක් ම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර එහි සඳහන් දිනයක් ඒ ලිඛිත ව්‍යවස්ථාව වලංගු වන්නේ ය.

අතුරු ව්‍යවස්ථා.

135. (1) මේ පනතෙහි හා එය යටතේ කරනු ලැබූ නියමයන්හි හා සාදනු ලැබූ නියමාවලිවල හා ලිඛිත ව්‍යවස්ථාවල විධිවිධානවලට යටත්ව, උසස් අධ්‍යාපන ආයතනයක පාලක බලමණ්ඩලය විසින් පහත සඳහන් කාරණා සියල්ල හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සාදනු ලැබිය හැකි ය :—

(අ) සියලු ම උපාධි, අභිඥාන පත්‍ර, සහතික හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සඳහා නියම කරන ලබන අධ්‍යයන පාඨමාලා ;

(ආ) උපාධි, අභිඥාන පත්‍ර, සහතික හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සඳහා නියම කරනු ලැබූ අධ්‍යයන පාඨමාලාවලට හා විභාග වලට ශිෂ්‍යයන් ඇතුල් කර ගත යුත්තේ හා ඒ ශාස්ත්‍රීය විශිෂ්ඨතා සඳහා සුදුසුකම් ලැබිය යුත්තේ යම් කොන්දේසි වලට යටත්ව ද ඒ කොන්දේසි ;

(ඇ) අධ්‍යයන පාඨමාලා, විභාග හා නිවාස සඳහා ද උපාධි, අභිඥාන පත්‍ර, සහතික හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා පිරිනමනු ලැබීම සඳහා ද අය කළ යුතු ගාස්තු ;

(ඈ) ශිෂ්‍යයන්ගේ පදිංචිය පිළිබඳ කොන්දේසි සහ ඔවුන්ගේ විනය ;

(ඉ) අන්‍යාකාර විධිවිධාන සලස්වා නොමැති අවස්ථාවක, යම් බල මණ්ඩලයක හෝ වෙනත් මණ්ඩලයක සංයුතිය, බලතල, කාර්ය හා කර්තව්‍ය සහ සාමාජිකත්වය පිළිබඳ නියමයන් ;

(ඊ) විවිධ බලමණ්ඩලවලට හා වෙනත් මණ්ඩලවලට නියෝජිත යන් තෝරා පත් කිරීමට සම්බන්ධ සියලු කාරණා ;

(උ) පරීක්ෂකවරයන් පත් කිරීමේ කොන්දේසි හා ක්‍රමය ද ඔවුන්ගේ කාර්ය හා කර්තව්‍ය ද විභාග පැවැත්වීම හා විභාග වල තත්ත්වයන් පවත්වා ගෙන යාම ;

(ඌ) අතුරු ව්‍යවස්ථා සෑදීමට මේ පනතෙහි හෝ මේ පනත යටතේ සාදන ලද නියමාවලි හා ලිඛිත ව්‍යවස්ථාවල විධි විධාන යටතේ බලය පැවරී හෝ නියමිතව ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ සියලු කාරණා ; සහ

(එ) මේ පනතෙහි හෝ මේ පනත යටතේ සාදන ලද නියමාවලි වල හා ලිඛිත ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ අතුරු ව්‍යවස්ථා මගින් නියම කළ යුතු හෝ නියම කළ හැකි සියලු කාරණා.

(2) යම් උසස් අධ්‍යාපන ආයතනයක අවස්ථාවෝචිත පරිදි සනාතන සභාව හෝ ශාස්ත්‍රීය කමිටුව විසින් අතුරු ව්‍යවස්ථාවේ කෙටුම්පතක් පිළියෙළ කොට ඒ ආයතනයේ පාලක බලමණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද්දේ නම් මිස, ඒ පාලක බලමණ්ඩලය විසින් ඒ ආයතනයේ ඉගැන්වීමට හෝ විභාගවලට අදාළ හෝ ඒ හා සම්බන්ධ යම් කාරණයක් සම්බන්ධයෙන් කිසිදු අතුරු ව්‍යවස්ථාවක් නොසෑදිය යුතු ය.

(3) උසස් අධ්‍යාපන ආයතනයක පාලක බලමණ්ඩලය විසින් සාදනු ලබන අතුරු ව්‍යවස්ථාවක් එහි නිශ්චිතව සඳහන් දිනයක වලංගු වන්නේ ය.

136. මේ පනතෙහි හා මේ පනත යටතේ කරන ලද නියමයන්හි හා සාදන ලද නියමාවලිවල, ලිඛිත ව්‍යවස්ථාවල හා අතුරු ව්‍යවස්ථා වල විධිවිධානවලට යටත්ව යම් ශාස්ත්‍රීය කරුණක් සඳහා සහ බලපවත්නා නියෝගයක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා උසස් අධ්‍යාපන ආයතනයක අවස්ථා වෝචිත පරිදි සනාතන සභාව විසින් හෝ ශාස්ත්‍රීය කමිටුව විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

මේ වගන්තියෙහි "ශාස්ත්‍රීය කාරණය" යන්නෙන් ඒ සනාතන සභාවේ හෝ ශාස්ත්‍රීය කමිටුවේ පාලනයට හා සාමාන්‍ය විධානයට යටත් යම් කාරණයක් අදහස් වේ.

137. (1) මේ පනතෙහි හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන වලට යටත් ව, කොමිෂන් සභාව, අභියාචනා මණ්ඩලය සහ උසස් අධ්‍යාපන ආයතනයක යම් බලමණ්ඩලයක් හෝ වෙනත් මණ්ඩල යක් විසින්— රීති.

(අ) මේ පනතේ හෝ යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන යටතේ, රීති මගින් නියම කළ යුතු හෝ නියම කළ හැකි සියලු කාරණා සම්බන්ධයෙන් ද ;

(ආ) රීති සෑදීමට මේ පනතේ හෝ යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන යටතේ නියමිතව හෝ බලය පැවරී ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ සියලු කාරණා සම්බන්ධ යෙන් ; හා

(ඇ) ප්‍රශ්නයක් කොමිෂන් සභාවට, අභියාචනා මණ්ඩලයට හෝ උසස් අධ්‍යාපන ආයතනයක යම් බලමණ්ඩලයකට හෝ වෙනත් මණ්ඩලයකට අදාළ වූත් මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් විධිවිධාන සලස්වා නැත්තා වූත් සෙසු සියලු කාරණා සම්බන්ධයෙන් ද

රීති සාදනු ලැබිය හැකි ය.

(2) කොමිෂන් සභාව, අභියාචන මණ්ඩලය හෝ උසස් අධ්‍යාපන ආයතනයක යම් බලමණ්ඩලයක් හෝ වෙනත් මණ්ඩලයක් විසින් සාදනු ලැබූ යම් රීතියක් ඒ කොමිෂන් සභාව, අභියාචන මණ්ඩලය, බලමණ්ඩලය හෝ ඒ වෙනත් මණ්ඩලය විසින් සාදනු ලබන එවැනි ම රීතියකින්-සංශෝධනය කිරීම, එයට යමක් එකතු කිරීම, එය වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

XX වන කොටස

පරිච්ඡින්න කිරීම හා සංක්‍රාන්තික විධිවිධාන

1972 අංක 1 දරන පනත පරිච්ඡින්න කිරීම.

138. 1972 අංක 1 දරන ලංකා විශ්වවිද්‍යාලය පනත, මේ පනතෙහි මේ කොටස ක්‍රියාත්මක වන දිනයෙහි සිට මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

1972 අංක 1 දරන පනත පරිච්ඡින්න කිරීමෙන් පසු ඇතැම් විධිවිධාන අදාළ වන බව.

139. (1) 1972 අංක 1 දරන ලංකා විශ්වවිද්‍යාලය පනත පරිච්ඡින්න කිරීමේ දී මෙහි පහත I වන තීරුවෙහි නිශ්චය කොට දක්වා ඇති එක් එක් මණ්ඩපය මේ පනතේ 21 වන වගන්තිය යටතේ වූ නියමයක් මගින් පිහිටුවන ලද්දා වූ ද II වන තීරුවෙහි ඊට අනුරූපව දක්වා ඇති නාම හා අභිධානය දරන්නා වූ ද විශ්වවිද්‍යාලයක් ලෙස සැලකිය යුතු අතර ඒ අනුව මේ පනතේ සියලු විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ ඒ විශ්වවිද්‍යාලයට සහ ඒ ඒ විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් අදාළ විය යුතු ය :—

I වන තීරුව		II වන තීරුව
කොළඹ	...	කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.
පේරාදෙණිය	...	පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.
විද්‍යෝදය	...	ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.
විද්‍යාලංකාර	...	කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.
කටුබැද්ද	...	මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.
යාපනය	...	යාපනය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

(2) ඒ ඒ මණ්ඩපයේ සෑම පීඨයක් ම ඒ ඒ විශ්වවිද්‍යාලයේ පීඨයක් ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(3) ඒ ඒ පීඨයේ සෑම අධ්‍යයන අංශයක් ම ඒ ඒ විශ්වවිද්‍යාලයේ පීඨයෙහි අධ්‍යයන අංශයක් ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

1972 අංක 1 දරන පනත යටතේ පිහිටුවනු ලැබූ ආයතන මේ පනත යටතේ පිහිටුවනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

140. (1) 1972 අංක 1 දරන ලංකා විශ්වවිද්‍යාලය පනත පරිච්ඡින්න කළ කල්හි, ඒ පනත යටතේ පිහිටුවා ඇති හෝ පිහිටුවා ඇතැයි සැලකෙන හා ඒ පනත පරිච්ඡින්න කරන තෙක් පැවති සෑම ආයතනයක් ම කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන උසස් අධ්‍යාපන ආයතනයකට අනුබද්ධ කළ යුතු අතර ඒ ආයතනය පිහිටුවනු ලැබුවේ යම් ලිඛිත ව්‍යවස්ථාවක් යටතේ ද ඒ ලිඛිත ව්‍යවස්ථාව අනුව හැකිතාක් දුරට ඒ උසස් අධ්‍යාපන ආයතනය යටතේ වූ ආයතනයක් වශයෙන් එය තවදුරටත් ක්‍රියාකාරීව පැවතිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා, ඉහත කී පනත යටතේ එක් එක් ආයතනය සම්බන්ධයෙන් සාදන ලද රීති ව්‍යවස්ථා මේ පනතේ 18 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් සාදන ලද නියමවලි ලෙස සැලකිය යුතු ය.

(3) එකී පරිවර්තනය කිරීමෙන් අවුරුද්දක් ඇතුළත කොමිෂන් සභාව විසින් ඒ ආයතනයේ සැකැස්ම හා සංයුතිය නිශ්චය කළ යුතු ය.

141. මේ පනතේ හා යම් උචිත සාධක පත්‍රයක විධිවිධානවලට යටත්ව, මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීමේ දින සිට පහත සඳහන් විධිවිධාන අදාළ වන්නේ ය:— 1972 අංක 1 දරන පනත පරිවර්තනය කිරීමේ බලපෑම.

(1) මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීමේ දිනයට පෙර දින යෙහි පරණ විශ්වවිද්‍යාලයෙහි සේවයෙහි නියුක්තව සිටින හා ඒ දිනයෙහි දී තම තමන්ගේ විශ්‍රාම ගැනීමේ වයස සම්පූර්ණ වී නොමැති සියලු ම ආචාර්යවරයන්, නිලධරයන් හා වෙනත් සේවකයන් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන්නා වූ උසස් අධ්‍යාපන ආයතනයෙහි නියුක්ත ආචාර්යවරයන්, නිලධරයන් හා වෙනත් සේවකයන් ලෙස සැලකිය යුතු අතර හැකි තාක් දුරට පරණ විශ්වවිද්‍යාලයේ සේවයෙහි දී ඔවුන්ට තිබුණු තත්ත්වය ම ඇතිව හා එහි දී භුක්ති විඳි වැටුප් හෝ වේතන, සේවය අවසාන කිරීමේ දීමනා හෝ වෙනත් ප්‍රතිලාභ පිළිබඳ නියමයන් ඇතුළත් නියමයන් ම පිට ඔවුන් සිය ධුරය දැරිය යුතු ය.

(2) මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත කොමිෂන් සභාව විසින්, මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීමේ දිනයට පෙර දිනයෙහි පරණ විශ්වවිද්‍යාලයේ සේවයෙහි යෙදී සිටි ඒ විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයන්, නිලධරයන් හා වෙනත් සේවකයන් දැරූ පත්වීම් සමාලෝචනය කළ හැකි අතර අතිරික්තව ඇති බව සොයාගනු ලැබූ තනතුරු අහෝසි කිරීමට නියම කිරීම ද පත් කිරීම් කරනු ලැබූ අවස්ථාවේ බලපැවැත් වූ බඳවා ගැනීමේ පරිපාටිය කඩ කරමින් ඔවුන්ගේ ඒ ඒ තනතුරුවලට පත් කරනු ලැබූ තැනැත්තන්ගේ සේවය ඔවුන්ට යථා පරිදි දෙනු ලැබූ දැන්වීමකින් පසු අවසන් කිරීම ද කළ හැකි ය.

(3) මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීමේ දිනයට කලින් පරණ විශ්වවිද්‍යාලය විසින් හෝ එය සමග හෝ එය සඳහා හෝ දරන ලද සියලු ණය, බැඳීම් හා වගකීම් ද, ලියා අත්සන් කරනු ලැබූ හෝ ඇති කර ගත් සියලු ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම් හා වෙනත් සාධන පත්‍ර ද, ඉටු කිරීමට බැඳී සිටි සියලු කාරණා හා දේ ද මේ පනත යටතේ පිහිටුවන ලද උසස් අධ්‍යාපන ආයතනයක් විසින් හෝ එය සමග හෝ එය සඳහා හෝ දරන ලද, ලියා අත්සන් කරන ලද, ඇතිකර ගන්නා ලද හෝ ඉටු කිරීමට බැඳී සිටින ණය, බැඳීම්, ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර,

එකඟවීම්, සාධන පත්‍ර, කාරණා හෝ දේ ලෙස සැලකිය යුතු ය. ඒ ණය, බැඳීම්, ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම් හෝ වෙනත් සාධන පත්‍ර අදාළ වන උචිත උසස් අධ්‍යාපන ආයතනය කවරේදැයි ඒ හා සම්බන්ධ පාර්ශ්වකරුවන්ට කොමිෂන් සභාව විසින් දැනුම් දිය යුතු ය.

(4) (අ) මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීමේ දිනයට කලින් පරණ විශ්වවිද්‍යාලය විසින් හෝ එයට විරුද්ධව කවර වූ හෝ අධිකරණයක නැතහොත් විනිශ්චය අධිකාරයක පවරනු ලැබ ඇති සියලුම සිවිල් නඩු, අපරාධ නඩු, අභියාචන හෝ වෙනත් සිවිල් හා අපරාධ නඩු කටයුතු, කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාවට විරුද්ධව හෝ පවරනු ලැබ ඇති ලෙස සැලකිය යුතු ය.

(ආ) එවැනි සිවිල් නඩුවක්, අපරාධ නඩුවක්, අභියාචනයක් හෝ වෙනත් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් පවරනු ලැබ ඇති අවස්ථාවක, ඒ සිවිල් නඩුව, අපරාධ නඩුව, අභියාචනය හෝ වෙනත් නඩු කට යුත්ත අදාළ වන්නේ යම් උසස් අධ්‍යාපන ආයතන යකට ද ඒ උචිත උසස් අධ්‍යාපන ආයතනය ආදේශ කිරීමේ ආඥාවක් කරන ලෙස කොමිෂන් සභාව විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි අතර අධිකරණය සුදුසු යයි සලකන යම් ආඥාවක් අධිකරණය විසින් කළ යුතු ය. මේ ඡේදයේ විධි විධාන යටතේ ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, ආදේශ කිරීම සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ ඇති විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ ඉල්ලීමට අදාළ විය යුතු ය.

(5) (අ) මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීමේ දිනයට කලින්, පරණ විශ්වවිද්‍යාලයට පක්ෂව හෝ විරුද්ධව, නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් කරන ලද සියලු තීන්දු ප්‍රකාශ හෝ ආඥා කොමිෂන් සභාවට පක්ෂව හෝ විරුද්ධව කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(ආ) අධිකරණයක් විසින් එවැනි තීන්දු ප්‍රකාශ හෝ ආඥා කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ තීන්දු ප්‍රකාශය හෝ ආඥාව අදාළ වන්නේ යම් උසස් අධ්‍යාපන ආයතනයකට ද ඒ උචිත උසස් අධ්‍යාපන ආයතනය ආදේශ කිරීමේ ආඥාවක් කරන ලෙස කොමිෂන් සභාව විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි අතර අධිකරණය සුදුසු යයි සලකන යම් ආඥාවක් අධිකරණය විසින් කළ යුතු ය. මේ ඡේදයේ විධි විධාන යටතේ ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක, ආදේශ කිරීම සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ ඇති විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ ඉල්ලීමට අදාළ විය යුතු ය.

(6) පරණ විශ්වවිද්‍යාලයේ විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල, මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වන දිනය වන විට ඒ සඳහා ඇති පොලිය ද සමග, මේ පනත යටතේ පිහිටුවනු ලබන විශ්වවිද්‍යාලවල අර්ථ සාධක අරමුදලට මාරු කළ යුතු අතර මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වන දින යට පෙර දිනයේ විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලේ දායකයකු වූ සෑම තැනැත්තකු ද පරිච්ඡින්න කරනු ලැබූ 1972 අංක 1 දරන පනත යටතේ ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගන්නා තෙක් අරමුදලෙහි දායකයකුව සිටියා වූ සෑම තැනැත්තකු ද විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලේ දායක යකු ලෙස සැලකිය යුතු ය. 1972 අංක 1 දරන ලංකා විශ්ව විද්‍යාලය පනත යටතේ පිහිටුවන ලද අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවීම ඒ පනත යටතේ තමා ස්වේච්ඡාවෙන් විශ්‍රාමගත් දිනයේ සිට නතර කර ඇති යම් දායකයකු, මේ පනත යටතේ විශ්වවිද්‍යාලවල අර්ථ සාධක අරමුදලේ දායක යකු බවට පත් අවස්ථාවක ඒ අරමුදලේ ඒ තැනැත්තාගේ බැරට ඇති මුදලට ඒ පනතේ 46 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ තීරණය කරනු ලබන අනුපාති කය අනුව මිශ්‍ර පොලිය, ඔහු එසේ විශ්‍රාමගත් දිනයේ සිට මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වූ දිනය තෙක් වූ කාලය සඳහා, එකතු වුවාක් සේ සැලකිය යුතු ය. ඒ අනුව විශ්වවිද්‍යාලවල අර්ථ සාධක අරමුදලේ ඒ තැනැත්තාගේ ගිණුමට ඒ මුදල බැර කළ යුතු ය.

(7) පරණ විශ්වවිද්‍යාලය සතු කරන ලද හෝ ඒ විශ්වවිද්‍යාලය විසින් නීත්‍යනුකූලව මිලට ගන්නා ලද හෝ අත් කර ගන්නා ලද හෝ ඒ විශ්වවිද්‍යාලයට බදු දෙන ලද හෝ ඒ විශ්වවිද්‍යාලයට කැමැත්තක් කර ගැනීමට දෙන ලද හෝ වෙන යම් ක්‍රමයකින් ඒ විශ්වවිද්‍යාලයට පවරන ලද හෝ පරණ විශ්වවිද්‍යාලය සඳහා භාරයක් විශයෙන් තබා ගන්නා ලද හෝ මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වන දිනයෙහි එහි සන්තකයෙහි හෝ පාලනයෙහි පැවති චංචල, නිශ්චල සියලු දේපළ, භාරවලට ද අය කිරීම්වලට ද වගකීම්වලට ද අයිතිය තබා ගැනීම්වලට ද පරවශතාවලට ද නැතහොත් වෙනත් බැඳීම්වලට ද යටත් ව හා ඒ දින යෙහි ඒවාට අයත් ව, අනුබද්ධව හෝ අදාළ ව පවතින නියම හා කොන්දේසි පිට කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන උසස් අධ්‍යාපන ආයතනය සන්තක යෙහි හෝ ඒ කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන ආයතනය වෙනුවෙන් භාරයක් විශයෙන් පැවතිය යුතු ය.

පරණ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ මාරු කරනු ලැබූ නිලධරයන්ට අදාළ විශේෂ විධිවිධාන.

142. (1) මේ පනතෙහි හෝ යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන වලට යටත්ව, පරණ විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයන්ට, නිලධරයන්ට හා වෙනත් සේවකයන්ට පහත සඳහන් විධිවිධාන මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීමේ දිනයෙන් පසු අදාළ වන්නේ ය :—

(අ) ආචාර්යවරයා, නිලධරයා හෝ වෙනත් සේවකයා විසින් දරන ලද තනතුර හෝ ධුරය 141 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ අහෝසි කරනු ලැබූ විට, ඒ ආචාර්යවරයා, නිලධරයා හෝ වෙනත් සේවකයා අනුයුක්ත වූ උසස් අධ්‍යාපන ආයතනය විසින් රක්ෂාව නැතිවීම සම්බන්ධයෙන් ඔහුට වන්දි ගෙවිය යුතු ය. අදාළ උසස් අධ්‍යාපන ආයතනය විසින් ඒ වන්දිය නිශ්චය කළ යුතු ය.

(ආ) පරණ විශ්වවිද්‍යාලයේ යම් ආචාර්යවරයකු, නිලධරයකු හෝ වෙනත් සේවකයකු විසින්, විශ්‍රාම ගැනීමට ඇති තම අදහස පිළිබඳ යටත් පිරිසෙයින් මාස දෙකක ලිඛිත දැන්වීමක් මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීමේ දින යේ සිට වර්ෂ දෙකක් ඇතුළත, තමා අනුයුක්තව සිටින උසස් අධ්‍යාපන ආයතනයට දීමෙන් පසු ඒ ආයතනයේ සේවයෙන් විශ්‍රාම ගත හැකිය :

එසේ වුව ද මේ ඡේදය—

(i) තම පත්වීම ස්ථිර කරනු නොලැබූ ආචාර්යවරයකුට, නිලධරයකුට හෝ වෙනත් සේවකයකුට ; හෝ

(ii) ඉගෙනීම හෝ වෙන යම් කාර්යයක් සඳහා නිවාඩු ලබාගෙන නිශ්චිත කාලයක් උසස් අධ්‍යාපන ආයතනයකට, පරණ විශ්වවිද්‍යාලයට හෝ 1966 අංක 20 දරන උසස් අධ්‍යාපන පනත යටතේ පිහිටු වන ලදැයි සැලකෙන විශ්වවිද්‍යාලයකට සේවය කිරීමට ගිවිසුමකින් බැඳී සිටින යම් ආචාර්යවරය කුට, නිලධරයකුට හෝ වෙනත් සේවකයකුට ; හෝ

(iii) වයස අවුරුදු පනස් පහ සම්පූර්ණ කර ඇති නිලධරයකුට හෝ සේවකයකුට

අදාළ නොවන්නේ ය.

(2) පරණ විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයකු, නිලධරයකු හෝ වෙනත් සේවකයකු මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ විශ්‍රාම ගත් අවස්ථාවක, 141 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඔහුගේ තනතුර අහෝසි කරනු ලැබුවේ නම් ඔහුට ගෙවිය හැකිව තිබූ වන්දි මුදල, අදාළ උසස් අධ්‍යාපන ආයතනය විසින් පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම දීමනාවක් වශයෙන් ඔහුට දිය යුතු අතර ඒ පාරිතෝෂිකය හෝ විශ්‍රාම දීමනාව නිශ්චය කිරීමේ කාර්යය සඳහා පරණ විශ්වවිද්‍යාලය යටතේ හෝ එහි පූර්වගාමී ආයතන එකක් හෝ ඊට වැඩි ගණනක් යටතේ වූ ඔහුගේ සේවය විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී ඔහු සේවය කළ උසස් අධ්‍යාපන ආයතනයට කරන ලද සේවයක් ලෙස සැලකිය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (2) වන උප වගන්තිය යටතේ තමාට ගෙවිය යුතු වන්දි මුදල ගැන අතෘප්තියට පත් යම් ආචාර්යවරයකු, නිලධරයකු හෝ එවතාත් සේවකයකු විසින් අභියාචනා මණ්ඩලය වෙත අභියාචනා කළ හැකි අතර අභියාචනා මණ්ඩලයේ ඒ සම්බන්ධයෙන් වූ තීරණය අවසානාත්මක වන්නේ ය.

143. මේ පනතේ වෙන යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු කටයුතු පිළියෙළ කිරීමට හා සියලු ක්‍රියා මාර්ග ගැනීමට හැකි වනු පිණිස පහත සඳහන් විධිවිධාන අදාළ වන්නේ ය:— මේ පනත යටතේ උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවනු ලබන තෙක් බලපාන විශේෂ විධිවිධාන.

(අ) කොමිෂන් සභාව ජනාධිපතිවරයා විසින් පත් කළ යුතු අතර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන දිනයක සිට එය කටයුතු කිරීම ආරම්භ කළ යුතු ය.

(ආ) කොමිෂන් සභාවේ ප්‍රථම ලේකම්වරයා කොමිෂන් සභාව විසින් පත් කළ යුතු අතර, එසේ පත් කරනු ලැබූ විට—

(i) කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන දිනයක සිට ඔහු කටයුතු කිරීම ආරම්භ කළ යුතු ය ; තව ද

(ii) මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් ඔහු වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය කොමිෂන් සභාව සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම ඔහු විසින් කළ යුතු ය.

(ඇ) පරණ විශ්වවිද්‍යාලයේ යම් නිලධරයකු හෝ වෙනත් සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ හා ඒ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධරයාගේ කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා, කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් විශ්‍රාම වැටුප්වලට හෝ අර්ථ සාධක අරමුදලට අදාළ නියමයන් හා කොන්දේසි ඇතුළුව කොමිෂන් සභාව හා ඒ ප්‍රධාන විධායක නිලධරයා විසින් ගිවිසගන්නා නියමයන් හා කොන්දේසි පිට ඔහු ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කර ගනු ලැබිය හැකි ය.

(ඈ) 139 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ලෙස සැලකෙන සෑම විශ්වවිද්‍යාලයක ම ප්‍රථම උප කුලපතිවරයා ජනාධිපතිවරයා විසින් පත් කළ යුතු අතර, එසේ පත් කරනු ලැබූ විට—

(i) ඔහු මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීමේ දින සිට කටයුතු කිරීම ආරම්භ කළ යුතු ය ;

(ii) මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් ඔහු වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය තමා පත්ව සිටින

විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම ඔහු විසින් කළ යුතු ය ;

(iii) ඔහු පත්ව සිටින විශ්වවිද්‍යාලයෙහි බලමණ්ඩල මේ පනත යටතේ යථා පරිදි පිහිටුවනු ලබන තුරු ඒ සියලුම බලමණ්ඩලවල හෝ ඉන් යම් බලමණ්ඩලයක බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම ඔහු විසින් කළ හැකි ය ;

(iv) ඔහු කලින් ධුරය අත්හැර ගියහොත් මිස, 34 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, ඔහුගේ පත්වීමේ දින සිට ගණන් ගනු ලබන අවුරුදු තුනක කාලයක් ඔහු ධුරය දරන අතර එකී කාල සීමාවට ඉක්බිතිව ම එළඹෙන වැඩිපුර අවුරුදු තුනක කාල සීමාවක් සඳහා 34 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය.

(ඉ) 139 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ලෙස සැලකෙන ඒ ඒ විශ්වවිද්‍යාලයේ ප්‍රථම ලේඛකාධිකාරිවරයා කොමිෂන් සභාව විසින් පත් කළ යුතු අතර, එසේ පත් කරනු ලැබූ විට මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් තමා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය තමා අනුයුක්තව සිටින විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම ඔහු විසින් කළ යුතු ය.

(ඊ) 139 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ලෙස සැලකෙන ඒ ඒ විශ්වවිද්‍යාලයේ ප්‍රථම මූල්‍යාධිකාරිවරයා කොමිෂන් සභාව විසින් පත් කළ යුතු අතර, එසේ පත් කරනු ලැබූ විට මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් ඔහු වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය ඔහු පත්ව සිටින විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම ඔහු විසින් කළ යුතු ය.

මේ පනත යටතේ විශ්වවිද්‍යාලයක් පිහිටුවනු ලබන තුරු විශේෂ විධිවිධාන.

144. මේ පනතේ වෙනත් විධිවිධානයක කුමක් සඳහන්ව ඇත ද විශ්වවිද්‍යාලය පිහිටුවීමේ දිනයෙන් පසු හැකිතාක් ඉක්මණින් එහි කාර්ය ආරම්භ කිරීමට හා එහි අරමුණු ක්‍රියාත්මක කිරීමට ඒ විශ්වවිද්‍යාලයට හැකි වනු පිණිස මේ පනත යටතේ විශ්වවිද්‍යාලයක් පිහිටුවනු ලබනතුරු සංක්‍රාන්තික කාලය තුළ අවශ්‍ය සියලු කටයුතු පිළියෙළ කර ගැනීමේ හා ක්‍රියා මාර්ග ගැනීමේ කාර්ය සඳහා පහත සඳහන් විධිවිධාන අදාළ වන්නේ ය :—

(අ) විශ්වවිද්‍යාලයේ ප්‍රථම උප කුලපතිවරයා ජනාධිපතිවරයා විසින් පත් කළ යුතු අතර, එසේ පත් කරනු ලැබූ විට—

(i) මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් ඔහු වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම ඔහු විසින් කළ යුතු ය;

(ii) ඔහු පත්ව සිටින විශ්වවිද්‍යාලයෙහි බලමණ්ඩල යථා පරිදි පිහිටුවනු ලබන තුරු ඒ සියලු ම බලමණ්ඩල වල හෝ ඉන් යම් බලමණ්ඩලයක බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම ඔහු විසින් කළ හැකි ය.

(iii) ඔහු කලින් ධුරය අත්හැර ගියහොත් මිස, 34 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, ඔහු පත් කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන අවුරුදු තුනක කාලයක් ඔහු ධුරය දරන අතර ඉහත කී කාල සීමාවට ඉක්බිතිව ම එළඹෙන වැඩිපුර අවුරුදු තුනක කාල සීමාවක් සඳහා 34 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය.

(ආ) විශ්වවිද්‍යාලයේ ප්‍රථම ලේඛකාධිකාරිවරයා කොමිෂන් සභාව විසින් පත් කළ යුතු අතර, එසේ පත් කරනු ලැබූ විට මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් ඔහු වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම ඔහු විසින් කළ යුතු ය.

(ඇ) විශ්වවිද්‍යාලයේ ප්‍රථම මූල්‍යාධිකාරිවරයා කොමිෂන් සභාව විසින් පත් කළ යුතු අතර එසේ පත් කරනු ලැබූ විට මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් ඔහු වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම ඔහු විසින් කළ යුතු ය.

මේ වගන්තියේ කාර්යය සඳහා "සංක්‍රාන්තික කාලය" යන්නෙන්, විශ්වවිද්‍යාලයක් පිහිටුවීම සඳහා මේ පනත යටතේ විශ්වවිද්‍යාල නියමයක් පළ කරනු ලැබූ දිනයෙන් ආරම්භව ඒ නියමය ක්‍රියාත්මක වන දිනයෙන් අවසන් වන කාල සීමාව අදහස් වේ.

145. 139 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ලෙස සැලකෙන විශ්වවිද්‍යාලයක කාර්ය ආරම්භ කිරීම සඳහා වූ හෝ 21 වන, 22 වන, 23 වන හා 24 වන වගන්ති යටතේ උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීම සඳහා වූ මූලික කටයුතු පිළියෙළ කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින්, කොමිෂන් සභාවේ නිර්දේශය පිට හා ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, යම් විශේෂ හෝ බලාපොරොත්තු නොවූ අවස්ථා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීමේ කාර්යය සඳහා හෝ මේ පනතින් කිසිම විධිවිධානයක් හෝ කිසිම ඵලදායී විධිවිධානයක් සලස්වා නොමැති යම් දුෂ්කරතා ඉවත් කිරීම.

ප්‍රශ්නයක් හෝ යම් කාරණයක් නිශ්චය කිරීමේ හෝ සකස් කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි තමා සලකන සියලු විධාන සාමාන්‍යයෙන් හෝ යම් විශේෂ නඩුවක් සම්බන්ධයෙන් හෝ නිකුත් කළ හැකි ය.

කොමිෂන් සභාවේ බලතලවලට අදාළ විශේෂ විධිවිධාන.

146. මේ පනතේ 139 වන වගන්තියෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීමේ දිනයෙන් ආරම්භ වන වර්ෂ දෙකක කාල සීමාව තුළ පහත සඳහන් කටයුතු සියල්ල හෝ ඉන් යම් කටයුත්තක් කිරීමට කොමිෂන් සභාවට බලය ඇත්තේ ය :—

(අ) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ සැකැස්ම හා සංයුතිය නිශ්චය කිරීම ;

(ආ) ඒ එක් එක් උසස් අධ්‍යාපන ආයතනයට පැවරිය යුතු පීඨය හෝ පීඨ හා එහි අධ්‍යයන අංශ නිශ්චය කිරීම හා ඒවා පැවරීම ;

(ඇ) ඒ එක් එක් උසස් අධ්‍යාපන ආයතනයෙහි සලස්වනු ලැබිය යුතු හෝ ඉගැන්විය යුතු විෂය හෝ විෂය ක්ෂේත්‍ර නිශ්චය කිරීම ; සහ

(ඈ) පරණ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය, ශිෂ්‍යයන්, උප කරණ, ඉඩම්, ගොඩනැගිලි හා වෙනත් පහසුකම් ඒ උසස් අධ්‍යාපන ආයතන අතර මාරු කිරීම හෝ නැවත බෙදා වෙන් කිරීම.

XXI වන කොටස

අර්ථ නිරූපණය

අර්ථ නිරූපණය

147. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"අතුරු ව්‍යවස්ථාව" යන්නෙන්, මේ පනත යටතේ උසස් අධ්‍යාපන ආයතනයක පාලක බලමණ්ඩලය විසින් සාදනු ලැබූ අතුරු ව්‍යවස්ථාවක් අදහස් වේ ;

"අනධ්‍යයන කාර්ය මණ්ඩලය" යන්නෙන්, ආචාර්යවරයන් නොවන උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයෝ අදහස් වෙති ;

"ආචාර්යවරයා" යන්නෙන්, මහාචාර්යවරයෙක්, සහාය මහාචාර්යවරයෙක්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක්, කථිකා චාර්යවරයෙක් හා සහකාර කථිකාචාර්යවරයෙක් සහ යම් තනතුරක් දරන තැනැත්තෙක් ආචාර්යවරයකු වශයෙන් නියමාවලි මගින් නියම කරනු ලැබ ඇත්ද ඒ තැනැත්තා ද අදහස් වේ ;

"උචිත සාධන පත්‍රය" යන්නෙන්, මේ පනතේ විධිවිධාන අනුව කරනු ලැබූ යම් නියමයක්, සාදනු ලැබූ නියමාවලියක්, ලිඛිත ව්‍යවස්ථාවක්, අනුරූ ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් අදහස් වේ;

"උසස් අධ්‍යාපන ආයතනය" යන්නෙන්, මේ පනත යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ ලෙස සැලකෙන විශ්ව විද්‍යාලයක්, මණ්ඩපයක්, විවෘත විශ්වවිද්‍යාලයක් හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් අදහස් වේ;

"ජනාධිපතිවරයා" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා අදහස් වේ;

"පරණ විශ්වවිද්‍යාලය" යන්නෙන්, 1972 අංක 1 දරන ලංකා විශ්වවිද්‍යාලය පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය අදහස් වේ;

"පරිපාලන කාර්ය මණ්ඩලය" යන්නෙන්, ආචාර්යවරයන් නොවන්නා වූ ද වර්ෂයකට රුපියල් නම දහසකට නො අඩු මූලික වැටුපක් නැතහොත් මේ පනත යටතේ කලින් කල කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන වෙනත් ඉහළ මූලික වැටුපක් සහිත තනතුරු දරන්නා වූ ද උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ අදහස් වෙති;

"පාලක බලමණ්ඩලය" යන්නෙන්—

(i) විශ්වවිද්‍යාලයක් සම්බන්ධයෙන් වූ විට, ඒ විශ්ව විද්‍යාලයේ පාලක සභාව අදහස් වේ;

(ii) විවෘත විශ්වවිද්‍යාලයක් සම්බන්ධයෙන් වූ විට, ඒ විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභාව අදහස් වේ; තව ද

(iii) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් සම්බන්ධයෙන් වූ විට, ඒ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ කළමනාකාර මණ්ඩලය අදහස් වේ;

"පිළිගත් ආයතනය" යන්නෙන්, 25 වන වගන්තිය යටතේ පිළිගනු ලැබූ ආයතනයක් අදහස් වේ;

"ප්‍රධාන විධායක නිලධරයා" යන්නෙන්—

(i) විශ්වවිද්‍යාලයක් සම්බන්ධයෙන් වූ විට ඒ විශ්ව විද්‍යාලයේ උප කුලපතිවරයා අදහස් වේ;

(ii) විවෘත විශ්වවිද්‍යාලයක් සම්බන්ධයෙන් වූ විට ඒ විවෘත විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා අදහස් වේ ; තවද

(iii) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් සම්බන්ධයෙන් වූ විට ඒ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ අධ්‍යක්ෂවරයා අදහස් වේ ;

"නියමය" යන්නෙන්, අමාත්‍යවරයා විසින් මේ පනත යටතේ කරනු ලැබූ නියමයක් අදහස් වේ;

"නියමාවලිය" යන්නෙන්, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් හෝ අභියාචන මණ්ඩලය විසින් සාදන ලද නියමාවලියක් අදහස් වේ ;

"නියෝගය" යන්නෙන්, මේ පනත යටතේ, උසස් අධ්‍යාපන ආයතනයක අවස්ථාවෝචිත පරිදි සනාතන සභාව හෝ ශාස්ත්‍රීය කමිටුව විසින් සාදන ලද නියෝගයක් අදහස් වේ ;

"රීතිය" යන්නෙන්, මේ පනත යටතේ කොමිෂන් සභාව, අභියාචන මණ්ඩලය හෝ උසස් අධ්‍යාපන ආයතනයක බලමණ්ඩලයක් හෝ වෙනත් මණ්ඩලයක් විසින් සාදනු ලැබූ රීතියක් අදහස් වේ ;

"ලිඛිත ව්‍යවස්ථාව" යන්නෙන්, මේ පනත යටතේ විශ්වවිද්‍යාලයක උත්තර මණ්ඩලය විසින් සාදනු ලැබූ ලිඛිත ව්‍යවස්ථාවක් අදහස් වේ ;

"විශ්වවිද්‍යාලය" යන්නෙන්, මේ පනත යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ ලෙස සැලකෙන විශ්වවිද්‍යාලයක් අදහස් වේ ;

"වෙනත් සේවකයා" යන්නෙන්, උසස් අධ්‍යාපන ආයතනයක ආචාර්යවරයකුගේ හෝ නිලධරයකුගේ තනතුරක් නොවන තනතුරක් දරන යම් තැනැත්තෙක් අදහස් වේ.

NATIONAL LIBRARY OF SRI LANKA
N L S L

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 80 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.

191429

1985-4-24
ශ්‍රී ලංකා SRI LANKA

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

1985 අංක 7 දරන
විශ්වවිද්‍යාල (සංශෝධන) පනත

NATIONAL LIBRARY OF SRI LANKA

[සභාතිකය ඉදිරිපත් කළේ 1985 පෙබරවාරි මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1985 පෙබරවාරි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II. වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැකිය

මිල : රු. 2.70 යි

තැපැල් ගාස්තුව : රු. 1.80 යි

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියෙහි (6) වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උප වගන්ති ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) කොමිෂන් සභාවේ සභාපතිවරයා කොමිෂන් සභාවේ සියලුම රැස්වීම්වල මුලසුන දරන්නේ ය. කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි විටක, ඒ රැස්වීමේ මූලසුන උපසභාපතිවරයා විසින් දරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය සාමාජිකයන් සතර දෙනකුගෙන් සමන්විත වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මතු දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) සභාපතිවරයා, කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයා සහ ගිණුම් නිලධරයා වන්නේ ය ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "15 වන, 16 වන සහ 18 වන වගන්ති යටතේ" යන යෙදුම වෙනුවට "16 වන සහ 18 වන වගන්ති යටතේ" යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (4) වන උප වගන්තියෙහි "සභාපතිවරයා" යන වචනය වෙනුවට, "සභාපතිවරයා සහ උපසභාපතිවරයා" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට, පහත දැක්වෙන පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ උපසභාපතිවරයා.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) කොමිෂන් සභාවේ වාර්තා සහ දේපළ භාරය පිළිබඳව වගකිවයුතු වූ සහ කොමිෂන් සභාවේ සහකාර ගිණුම් නිලධරයා විය යුතු වූ ද ලේකම්වරයෙක් ; සහ" ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය එහි (3) වන උප වගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2) 9 වන වගන්තියේ (5) වන උපවගන්තියෙහි විධිවිධාන යටතේ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට පත් කරන ලද නිලධරයන් සහ සේවා නියුක්තයන් නොවන කොමිෂන් සභාවේ නිලධරයන් සහ

සේවා නියුක්තයන්ට සහ ඔවුන් සම්බන්ධයෙන් 74 වන සහ 75 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියෙහි (5) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "යම් නිලධරයකු හෝ වෙනත් සේවකයකු" යන වචන වෙනුවට "යම් ආචාර්යවරයකු, නිලධරයකු හෝ වෙනත් සේවකයකු" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) "ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ" යන වචන වෙනුවට, "ඒ ආචාර්යවරයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ" යන වචන ආදේශ කිරීමෙන්.

8. 9 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියෙහි 9අ සහ 9ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියෙහි 9 අ සහ 9 ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

"කොමිෂන් සභාවේ තනතුරක් දරන්නකු විසින් සේවයෙන් පහ කිරීම, අනිවාර්ය විශ්‍රාම ගැන්වීම හෝ වෙනත් දඬුවමකට විරුද්ධව අභියාචනය කිරීම.

9අ. විෂමාචාරය, අකාර්යක්ෂමතාව හෝ කාර්ය පැහැර හැරීම සම්බන්ධයෙන් තනතුරෙන් පහ කරනු ලැබූ හෝ අනිවාර්යයෙන් විශ්‍රාම ගන්වනු ලැබූ හෝ අන්‍යාකාරයෙන් දඬුවම් කරනු ලැබූ, කොමිෂන් සභාවේ සෑම තනතුරක් දරන්නකු විසින් ම ඒ සේවයෙන් පහ කිරීමට හෝ විශ්‍රාම ගැන්වීමට හෝ වෙනත් දඬුවමකට විරුද්ධව විශ්වවිද්‍යාල සේවා අභියාචන මණ්ඩලය වෙත අභියාචනා කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ මුද්‍රාව.

9ආ. (1) කොමිෂන් සභාවේ මුද්‍රාව, කොමිෂන් සභාවේ ලේකම්වරයා භාරයේ තිබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ මුද්‍රාව, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවේ ලේකම්වරයා සහ යම් සාමාජිකයකු ඉදිරිපිට දී හැර, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට කොමිෂන් සභාවේ මුද්‍රාව නොතැබිය යුතු අතර, ඒ දෙදෙනාම ඔවුන් පැමිණි බවට සාක්ෂි වශයෙන් සාධන පත්‍රයේ හෝ ලේඛනයේ අත්සන් තැබිය යුතු ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (ix) වන, (x) වන සහ (xi) වන ඡේද ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

(ix) උසස් අධ්‍යාපන ආයතනවල කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පරිපාටි සහ පත් කිරීමේ ක්‍රම සකස් කිරීම සහ කාර්ය මණ්ඩලයේ විවිධ ශ්‍රේණි හා ඒ එක් එක් ශ්‍රේණියට ඇතුළත් වන සංඛ්‍යා කලින් කල නිශ්චය කිරීම;

(x) (අ) මේ පනත හෝ යම් උචිත සාධන පත්‍රයක් යටතේ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවන ලදැයි සැලකෙන එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ ව්‍යුහය සහ සංයුතිය ;

(ආ) ඒ එක් එක් උසස් අධ්‍යාපන ආයතනයට පැවරිය යුතු පීඨය හෝ පීඨ සහ ඒවායේ අධ්‍යයන අංශ ; සහ

(ඇ) ඒ එක් එක් උසස් අධ්‍යාපන ආයතනයෙහි සලස්වනු ලැබිය යුතු හෝ ඉගැන්විය යුතු විෂය හෝ අධ්‍යයන විෂය ක්ෂේත්‍ර

කලින් කල නිශ්චය කිරීම ;

(xi) (x) වන ඡේදයේ විධිවිධාන යටතේ කරන ලද යම් නිශ්චය කරනු ලැබීමක ප්‍රතිඵලයක් වශයෙන් අවශ්‍ය විය හැකි පරිදි යම් උසස් අධ්‍යාපන ආයතනයක ආචාර්යවරයකුගේ තනතුරක් නොවන යම් තනතුරක් දරන්නකු, ශිෂ්‍යයන්, උපකරණ සහ වෙනත් පහසුකම් මාරු කිරීම හෝ නැවත බෙදා වෙන් කිරීම ;

(xii) යම් උසස් අධ්‍යාපන ආයතනයක ශිෂ්‍යයන්ගේ විනයට, ශාස්ත්‍රීය, මූල්‍යමය හෝ පොදු පරිපාලනයට අදාළ වන්නා වූ යම් කරුණු විමර්ශනය කිරීම හෝ විමර්ශනය කිරීමට සැලැස්වීම හා ඒ පිළිබඳව පිළියම් යෙදීම ; සහ

(xiii) මේ පනතෙහි නිශ්චිතව සඳහන් බලතල ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ද 3 වන වගන්තියෙහි දැක්වෙන අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා ද අවශ්‍ය වන වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඇ) (අ) ඡේදය යටතේ කරන ලද නියමයකට අනුකූලව කොමිෂන් සභාව වෙත වාර්තාවක් ලැබුණු විටක, සම්බන්ධිත උසස් අධ්‍යාපන ආයතනයේ කටයුතු අතුරෙන් යම් කටයුත්තකට හෝ පරිපාලනයට යොමුව අවශ්‍ය යයි තමා සලකනා යම් පිළියම් යෙදීමක් කිරීමට අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවට විධාන කරනු ලැබිය හැකි ය." ; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "ජාතික ප්‍රතිපත්තියට පටහැනි හෝ හානිකර හෝ බවට අමාත්‍යවරයා සෑහීමට පත්වූ අවස්ථාවක, ඒ තත්ත්වය පාලනය කිරීම සඳහා අවශ්‍ය යයි තමා සලකනා සියලු පියවර ගැනීමට අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවට විධාන කළ හැකි ය."

යන වචන වෙනුවට, "ජාතික ප්‍රතිපත්තියට පටහැනි හෝ හානිකර හෝ බවට නැතහොත් ඒ ආයතනයේ කටයුතු අවුල් විය හැකි බවට අමාත්‍යවරයා සෑහීමට පත් වූ අවස්ථාවක, ඒ තත්ත්වය පාලනය කිරීම සඳහා අවශ්‍ය යයි තමා සලකන සියලු පියවර ගැනීමට අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවට විධාන කළ හැකි ය." යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

11. 24 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 24අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"උසස් අධ්‍යාපනය සඳහා ආයතනයක් හෝ මධ්‍යස්ථානයක් පිහිටුවීම.

24අ. (1) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාව විමසා, (මෙහි මින් මතු "උසස් අධ්‍යාපන ආයතන නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින්—

(අ) නියමයෙහි සඳහන් කරනු ලබන අධ්‍යයන ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය ලබා දීමේ, දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා අවස්ථාවෝචිත පරිදි, උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතනයක් හෝ මධ්‍යස්ථානයක් පිහිටුවනු ලැබිය හැකි ය;

(ආ) අවස්ථාවෝචිත පරිදි, උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතනයට හෝ ඒ මධ්‍යස්ථානයට නාමයක් හා අභිධානයක් දිය හැකි ය;

(2) අවස්ථාවෝචිත පරිදි, උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතනයක හෝ මධ්‍යස්ථානයක ව්‍යුහය, බලතල, කාර්ය හා කර්තව්‍ය නියමාවලි මගින් නියම කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

12. 25 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය, ප්‍රධාන ප්‍රඥප්තියේ 25අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"උපාධි ප්‍රදාන ආයතන පිළිගැනීම.

25අ. මේ පනතේ වෙන යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුව ද, 70අ. වගන්තියේ විධිවිධානවලට යටත්ව, අමාත්‍යවරයා විසින්, (මෙහි මින් මතු "උපාධි ප්‍රදාන ආයතන නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින්, ඒ නියමයෙහි සඳහන් කරනු ලබන යම් අධ්‍යයන ක්ෂේත්‍රවල අධ්‍යයන පාඨමාලාවන්හි උසස් අධ්‍යාපනය සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා වූ උපාධි ප්‍රදාන ආයතනයක් වශයෙන් මේ පනතේ 21 වන, 22 වන, 23 වන, 24 වන, 24අ සහ 25 වන වගන්තිවල සඳහන් ආයතනයක් නොවන යම් ආයතනයක්, ඒ නියමයෙහි සඳහන් යම් කොන්දේසිවලට යටත්ව පිළිගනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) "විවෘත විශ්වවිද්‍යාල නියමයක් සහ විශ්වවිද්‍යාලයීය විද්‍යායතන නියමයක්" යන වචන වෙනුවට, "විවෘත විශ්වවිද්‍යාල නියමයක්, විශ්වවිද්‍යාලයීය විද්‍යායතන නියමයක්, උසස් අධ්‍යාපන ආයතන නියමයක් සහ උපාධි ප්‍රදාන ආයතන නියමයක්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "23 වන සහ 24 වන" යන යෙදුම වෙනුවට, "23 වන, 24 වන, 24 අ සහ 25 අ" යන යෙදුම ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

(1) (අ) විශ්වවිද්‍යාල නියමයක්, මණ්ඩප නියමයක්, විවෘත විශ්වවිද්‍යාල නියමයක්, විශ්ව විද්‍යාලයීය විද්‍යායතන නියමයක් හෝ උසස් අධ්‍යාපන ආයතන නියමයක් අමාත්‍යවරයා විසින් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කළ හැකි ය.

(ආ) 25අ වගන්තිය යටතේ කරන ලද උපාධි ප්‍රදාන ආයතන නියමයක් අමාත්‍යවරයා විසින් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කළ හැකි ය.".

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "23 වන හෝ 24 වන" යන යෙදුම වෙනුවට "23 වන, 24 වන, 24අ හෝ 25අ" යන යෙදුම ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (ඕ) ඡේදයෙහි "ඇති කිරීම" යන වචන වෙනුවට "ඇති කිරීම සඳහා කොමිෂන් සභාවට නිර්දේශ කිරීම" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය "පැමිණ සිටින විට ඔහු උත්තර මණ්ඩලයේ සෑම රැස්වීමක ම" යන වචන වෙනුවට, "ඔහු" යන වචනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය පහත දැක්වෙන පරිදි, මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

"(1) (අ) විශ්ව විද්‍යාලයක උප කුලපතිවරයා, ඒ විශ්ව විද්‍යාලයේ පාලක සභාව විසින් නිර්දේශිත නම් තුනකින් යුත් මූල මණ්ඩලයකින් කොමිෂන්

සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් අවුරුදු තුනක කාලයක් සඳහා පත් කරනු ලැබිය යුතු ය.

(ආ) විශ්ව විද්‍යාලයක උප කුලපතිවරයා, කොමිෂන් සභාව විමසීමෙන් පසු ජනාධිපතිවරයා විසින් ධුර යෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.".

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "ඔහු නිල බල යෙන්" යන වචනවල සිට "රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය" යන වචන තෙක් වූ සියලුම වචන වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"ඔහු නිල බලයෙන් පාලක සභාවේ සහ සනාතන සභා වේ යන සභා දෙකෙහිම සාමාජිකයෙක් සහ සභාපති වරයා ද වන්නේ ය.";

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(6) (අ) පාලක සභාව විසින් අනුමත කරන ලද, විශ්ව විද්‍යාලයට අදාළ ප්‍රතිපත්ති හා පියවර ක්‍රියාත්මක කිරීම සහ ඒ ප්‍රතිපත්තිවලට යටත්ව විශ්ව විද්‍යාල යේ පරිපාලනය ද ඇතුළු විශ්වවිද්‍යාලය මෙහෙය වීම, අධීක්ෂණය සහ පාලනය සඳහා ; සහ

(ආ) විශ්ව විද්‍යාලයක් තුළ විනය පවත්වා ගෙන යාම සඳහා

උප කුලපතිවරයා වගකිව යුතු ය ; සහ";

(4) ඒ වගන්තියේ (8) වන සහ (9) වන උපවගන්ති ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(8) නිවාඩු පිට සිටීම, රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැ රව සිටීම හෝ වෙනයම් හේතුවක් නිසා හෝ තම ධුරයේ කටයුතු ඉටු කිරීමට උප කුලපතිවරයාට තාවක ලිකව නොහැකිවුවහොත්, නියෝජ්‍ය උප කුල පතිවරයකු සිටින්නේ නම් ඔහු විසින්, ඒ කාර්ය ඉටු කරනු ලැබිය යුතු ය. නියෝජ්‍ය උප කුලපතිවර යකු නොමැති අවස්ථාවක, එසේ කටයුතු කිරීමට නොහැකි වූ දින සිට දින හතක කාලයක් තුළ දී, එම ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා සුදුසු යයි කොමිෂන් සභාවට හැඟෙන වැඩ පිළිවෙලක් කොමිෂන් සභාව විසින් යෙදිය යුතු ය.

(9) උප කුලපති ධුරයෙහි යම් පුරප්පාඩුවක් ඇති වුව හොත් මේ වගන්තියේ ඉහතින්ම වූ විධිවිධාන යටතේ ස්ථිර පත්වීමක් කරන තුරු—

(අ) නියෝජ්‍ය උප කුලපතිවරයකු සිටින්නේ නම්, ඔහු විසින්, උප කුලපති ධුරයේ කාර්ය ඉටු කරනු ලැබිය යුතු ය, නැතහොත්,

(ආ) නියෝජ්‍ය උප කුලපතිවරයකු නොමැති අවස්ථාවක, ඒ පුරප්පාඩුව ඇති වූ දින සිට දින හතක් ඇතුළත, ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා සුදුසු යයි කොමිෂන් සභාවට හැඟෙන වැඩපිළිවෙලක් කොමිෂන් සභාව විසින් යෙදිය යුතු ය.

(10) (1) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉල්ලා අස්වන හෝ එසින් ඉවත් කරනු ලබන හෝ වෙන යම් ආකාරයකින් ධුරය අවසන් කරන උප කුලපතිවරයකු, නැවත පත් කරන ලද්දේ නම් මිස, ඔහු විසින් තමා උප කුලපතිවරයකු වශයෙන් පත් කරනු ලැබූ දිනට පෙර දින උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු වූයේ නම්, ඒ ආයතනයේ කාර්ය මණ්ඩලයේ තමාගේ ස්ථිර තන තුරට, තමා හැටපස් වන වර්ෂය සම්පූර්ණ නොකර ඇත් නම් පමණක්, ප්‍රත්‍යාවර්තනය කරනු ලැබිය හැකි ය.".

මේ වගන්තිය ක්‍රියාත්මක කිරීමේදී විශ්වවිද්‍යාල උප කුලපති වරුන් ධුර දැරීම අවසන් කළ යුතු බව.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ කුමක් සඳහන්ව ඇත ද ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවන ලදැයි සැලකෙන සෑම විශ්වවිද්‍යාලයකම, උප කුලපතිවරයා මේ වගන්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට ඒ උප කුලපති ධුරය දැරීම අවසන් වන්නේ ය:

එසේ වුව ද, ධුරය දැරීම එසේ අවසන් වන යම් උප කුලපතිවරයෙක් නැවත පත් කිරීම සඳහා සුදුස්සෙක් වන්නේ ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියෙහි (4) වන සහ (5) වන උපවගන්ති ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උප වගන්ති ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" (4) මණ්ඩපාධිපතිවරයා මණ්ඩප සභාවේ සභාපතිවරයා වන්නේ ය. මණ්ඩපයේ වෙන යම් මණ්ඩලයක යම් රැස්වීමක් කැඳවීමට, එයට සහභාගි වීමට, එහි දී කථා කිරීමට ඔහු හිමිකම් ලබන නමුත්, ඒ වෙනත් මණ්ඩලයේ ඔහු සාමාජිකයකු නම් මිස, එවැනි යම් රැස්වීමක දී ඡන්දය දීමට ඔහු හිමිකම් නොලබන්නේ ය.

(5) මණ්ඩපය ඇතුළත විනය පවත්වා ගෙන යාම සඳහා මණ්ඩපාධිපතිවරයා වගකිව යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ (3) වන උප වගන්තියෙහි " උත්තර මණ්ඩලයේ, පාලක සභාවේ " යන වචන වෙනුවට " පාලක සභාවේ " යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියෙහි (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (2) විශ්වවිද්‍යාලයේ මුදල් පරිපාලනය සඳහා ලේඛකාධිකාරිවර යාගේ විධානයට සහ පාලනයට යටත්ව, මූල්‍යාධිකාරිවරයා වගකිව යුතු අතර, රීති මගින් නියම කරනු ලැබිය හැකි ආකාරයට හා පිළිවෙළට එහි ගණන් ඔහු විසින් පවත් වාගත යු යුතු ය. විශ්ව විද්‍යාලයේ අරමුදල් ඔහු භාරයෙහි තිබිය යුත්තේ ය. ".

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (i) වන ඡේදය අත් හැරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (v) වන ඡේදය වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" (v) පීඨ මණ්ඩලය හෝ පීඨ මණ්ඩල ; සහ ".

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන, 42 වන සහ 43 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන, 42 වන සහ 43 වන වගන්ති ඉවත් කිරීම.

24. (අ) ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (1) මෙහි මින්මතු " පාලක සභාව " යනුවෙන් සඳහන් කරනු ලබන විශ්වවිද්‍යාලයක පාලක සභාව, විශ්ව විද්‍යාලයේ විධායක මණ්ඩලය හා පාලක බල මණ්ඩ ලය වන අතර, එය පහත සඳහන් තැනැත්තන් ගෙන් සමන්විත වන්නේ ය :—

(i) උප කුලපතිවරයා ;

(ii) නියෝජ්‍ය උප කුලපතිවරයෙක් සිටී නම්, ඔහු ;

(iii) මණ්ඩපාධිපතිවරයෙක් සිටී නම්, ඔහු ;

(iv) පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවර යෙක් සිටී නම්, ඔහු

(v) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;

(vi) ස්වකීය සාමාජිකයන් අතුරෙන් සනාතන සභාව විසින් තෝරා ගනු ලැබූ සාමාජිකයන් දෙදෙනෙක්, සහ

(vii) ඉහත සඳහන් (i) වන, (ii) වන, (iii) වන, (iv) වන, (v) වන, සහ (vi) වන ඡේද යටතේ මුළු සාමාජික සංඛ්‍යාවට එකක් එකතු කළ සංඛ්‍යාවට සමාන සාමාජික සංඛ්‍යාවක්. ඒ සාමාජිකයන් සියලු දෙනාම අධ්‍යාපන, වෘත්තීය, වාණිජ, කාර්මික, විද්‍යාත්මක හෝ පරිපාලන ක්ෂේත්‍රයන්හි විශිෂ්ට සේවාවක් ඉටු කර ඇති තැනැත්තන් අතුරෙන් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.".

(2) ඒ වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්ති ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(3) (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පාලක සභාවේ යම් පත් කරනු ලැබූ හෝ තෝරා පත් කරනු ලැබූ සාමාජිකයකු ඔහු කලින් ධුරය අත්හැර ගියහොත් මිස, අවස්ථාවෝචිත පරිදි, ඔහු පත් කරනු ලැබූ හෝ තෝරා පත් කරනු ලැබූ දින සිට තුන් වර්ෂයක කාලයක් ධුරය දරන අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීමට හෝ නැවත තෝරා පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය:

එසේ වුව ද, යම් පත් කරනු ලැබූ හෝ තෝරා ගනු ලැබූ සාමාජිකයකු තම ධුර කාලය ඉකුත් වීමට පෙර තම ධුරය අත්හැර ගියහොත් ඔහුගේ අනුප්‍රාප්තිකයා, ඔහු කලින් ධුරය අත්හැර යියහොත් මිස, තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දරන්නේ ය;

(4) අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත හෝ විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා වෙත අමතන ලද තම අත්සන යටතේ වූ ලිපියක් මගින් පාලක සභාවේ පත් කරනු ලැබූ හෝ තෝරා ගනු ලැබූ යම් සාමාජිකයකුට තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.".

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියේ කුමක් සඳහන්ව ඇත ද, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද්දවූ හෝ පිහිටුවන ලදැයි සැලකෙන හෝ සෑම විශ්වවිද්‍යාලයක ම පාලක සභාවේ පත් කරන ලද හෝ තෝරා ගනු ලැබූ සාමාජිකයන්, මේ වගන්තිය ක්‍රියාත්මක වූ දිනයේ දී එවැනි සාමාජිකයන් වශයෙන් ධුර දැරීම අවසන් වන්නේ ය:

එසේ වුව ද ධුරය දැරීම එසේ අවසන් වන යම් පත් කරන ලද හෝ තෝරා ගනු ලැබූ සාමාජිකයකු අවස්ථාවෝචිත පරිදි, නැවත පත් කිරීම සඳහා හෝ තෝරා ගනු ලැබීම සඳහා හෝ සුදුස්සකු වන්නේ ය.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියෙහි (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (vi) වන ඡේදය වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" (vi) විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම් සලකා බැලීම සහ අවශ්‍ය නම්, සංශෝධනය කර, සම්මත කිරීම සහ ඒ වාර්තාව සහ ඒ ගිණුම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ; " ;

(2) ඒ උපවගන්තියේ (viii) වන ඡේදය ඉවත් කිරීමෙන්.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ, (2) වන සහ (3) වන උපවගන්ති ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :--

" (2) විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය :—

(අ) උප කුලපතිවරයා ;

(ආ) නියෝජ්‍ය උප කුලපතිවරයෙක් සිටී නම්, ඒ නියෝජ්‍ය උප කුලපතිවරයා ;

(ඇ) මණ්ඩප වේනොත්, ඒ එක් එක් මණ්ඩපයේ මණ්ඩපාධිපතිවරයා ;

(ඈ) විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතන හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථාන වේනොත්, ඒ එක් එක් ආයතනයේ හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා ;

(ඉ) පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයෙක් සිටී නම්, ඔහු ;

(ඊ) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;

(උ) එක් එක් අධ්‍යයන අංශයේ ප්‍රධානයා ;

(ඌ) විශ්වවිද්‍යාලයේ සෑම ස්ථිර මහාචාර්යවරයෙක් ම ;

(එ) පුස්තකාලයාධිකාරිවරයා ; සහ

(ඒ) එක් එක් පීඨයේ ස්ථිර ආචාර්යවරයන් විසින් තමන් අතුරෙන් තෝරා පත් කර ගන්නා මේ උපවගන්තියේ ඉහතින්ම වූ ඡේදවල සඳහන් ආචාර්යවරයන් නොවන ආචාර්යවරයන් දෙදෙනෙක්.

(3) තෝරා පත් කරගනු ලැබූ එක් එක් සමාජිකයා තමා තෝරා පත් කරගනු ලැබූ දින සිට ගණන් ගනු ලබන අවුරුදු තුනක කාලසීමාවක් ධුරය දැරිය යුතු ය.

එසේ වුව ද, තෝරා පත්කර ගනු ලැබූ සාමාජිකයකු විශ්‍රාම යන හෝ ඉල්ලා අස්වන හෝ සනාතන සභාවේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණීමේ හේතුවෙන් අන්‍යාකාරයකින් ධුරය හිස් කරන හෝ අවස්ථාවක, (2) වන උපවගන්තියේ (ඒ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව ඔහු වෙනුවට වෙනත් සාමාජිකයකු තෝරා පත් කරනු ලැබිය යුතු ය. තව ද, ඒ වෙනත් සාමාජිකයා, කලින් ධුරය අත්හරින්නේ නම් මිස, ස්වකීය පූර්වගාමියාගේ ධුර කාලයේ ගත නොවූ කාලය සඳහා ඔහු ධුරය දැරිය යුතු ය.";

තව ද

(2) ඒ වගන්තියේ (6) වන උපවගන්තියෙහි—

(අ) (i) වන ඡේදයෙහි "පීඨයෙහි හෝ පීඨවල" යන වචන වෙනුවට, "පීඨ මණ්ඩලයෙහි හෝ පීඨ මණ්ඩලවල" යන වචන;

(ආ) (ii) වන ඡේදයෙහි "පීඨයෙහි හෝ පීඨවල" යන වචන වෙනුවට "පීඨ මණ්ඩලයෙහි හෝ පීඨ මණ්ඩලවල" යන වචන; සහ

(ඇ) (iv) වන ඡේදයෙහි "පීඨයෙහි හෝ පීඨවල" යන වචන වෙනුවට, "පීඨ මණ්ඩලයෙහි හෝ පීඨ මණ්ඩලවල" යන වචන;

ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) විශ්වවිද්‍යාලයක එක් එක් පීඨය, මේ පනතේ විධිවිධාන යටතේ ඒ පීඨයට වෙන් කරන ලද අධ්‍යයන අංශවලින් සමන්විත විය යුතු ය.";

(2) (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, ඒ වගන්තියේ (1අ) උපවගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) විශ්වවිද්‍යාලයක එක් එක් පීඨයට, පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු පීඨ මණ්ඩලයක් තිබිය යුතුය :—

(අ) ඒ පීඨයේ පීඨාධිපතිවරයා;

(ආ) පීඨය සංයුක්ත වන අධ්‍යයන අංශවලට අයත් වූ සියළුම ස්ථිර මහාචාර්යවරයෝ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෝ සහ කථිකාචාර්යවරයෝ;

(ඈ) පීඨයේ ස්ථිර සහකාර කථිකාචාර්යවරුන් විසින් තමන් අතුරෙන් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් ;

(ඇ) (ආ) සහ (ඈ) ඡේදවල සඳහන් තැනැත්තන් හැර පීඨයේ ඉගැන්වීමේ කාර්යයෙහි යෙදී සිටින ස්ථිර කාර්ය මණ්ඩලය විසින් තමන් අතුරෙන් තෝරා පත් කර ගන්නා සාමාජිකයන් දෙදෙනෙක් ;

(ඉ) පීඨයේ ශිෂ්‍යයන් විසින් තමන් අතුරෙන් තෝරා පත් කර ගන්නා ශිෂ්‍යයන් දෙදෙනෙක් ; සහ

(ඊ) පීඨයට අදාළ අධ්‍යයන ක්ෂේත්‍රවල විශිෂ්ඨත්වයක් දරන්නා වූ ද, විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල යෙහි සාමාජිකයන් නොවන්නා වූ ද තැනැත්තන් අතුරෙන් පීඨ මණ්ඩලය විසින් තෝරා පත්කර ගන්නා තැනැත්තන් තිදෙනෙක්.

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "මේ පනතේ විධිවිධානවලට යටත්ව, පීඨයක් විසින්" යන වචන වෙනුවට, "මේ පනතේ විධිවිධානවලට යටත්ව, පීඨ මණ්ඩලයක් විසින්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(4) (i) පීඨාධිපති පීඨ මණ්ඩලයේ සෑම රැස්වීමකම මූලසුන දැරිය යුතු ය ;

(ii) මේ පනතේ 49 වන වගන්තිය යටතේ පීඨාධිපතිවරයකු තෝරා පත් කර ගැනීමට සහ විභාගවලට සහ සම්බන්ධිත කරුණු වලට අදාළ වූ පීඨ මණ්ඩලයේ යම් රැස්වී මක කටයුතුවලින් (1අ) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලැබූ සාමාජිකයන් බැහැර කරනු ලැබිය යුතු අතර, එවැනි යම් රැස්වීමක්, එවැනි බැහැර කිරීමක් නොතකා යථා පරිදි පවත් වනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.";

28. 48 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 48 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"විශ්වවිද්‍යාල පශ්චාත් උපාධි අධ්‍යයන, පීඨ සහ එහි පීඨාධිපති.

48අ. (1) යම් විශ්වවිද්‍යාලයක් විසින්, ඒ විශ්ව විද්‍යාලය ඇතුළත පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ උසස් උපාධි, ඩිප්ලෝමා සහ අධ්‍යයන පාඨමාලා හා විවිධ අධ්‍යාපන අංශවල වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ලබා ගැනීම සඳහා පශ්චාත් උපාධි අධ්‍යයන පීඨ යක් කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව පිහිටුවනු ලැබිය හැකි ය ;

(2) පීඨයේ ව්‍යුහය, බලතල, කාර්ය හා කර්තව්‍ය සහ ඒ පීඨයේ පීඨාධිපතිවරයා පත් කිරීම හෝ තෝරා පත්කර ගැනීම සඳහා වූ කාර්ය පටිපාටිය කොමිෂන් සභාව විසින් නියමාවලි මගින් නිශ්චය කරනු ලැබිය යුතු ය;

(3) පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධරයකු ද ඒ පීඨයේ ශාස්ත්‍රීය හා පරිපාලන ප්‍රධානයා ද විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

29. (අ) ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "යම් පීඨයක් යම් අධ්‍යයන අංශවලින් සමන්විත වන්නේ ද, ඒ අංශවල ප්‍රධානයන් අතුරෙන් ඒ පීඨය විසින්" යන වචන වෙනුවට, "යම් පීඨ මණ්ඩලයක් යම් අධ්‍යයන අංශවලින් සමන්විත වන්නේ ද, ඒ අංශවල ප්‍රධානයන් අතුරෙන් ඒ පීඨ මණ්ඩලය විසින්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "මේ වගන්තියේ (1) වන උපවගන්තිය අනුව නව පීඨාධිපතිවරයකු තෝරා පත්කළ යුතු ය. එසේ තෝරා පත්කර ගනු ලබන තැනැත්තා තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දරන්නේ ය." යන වචන වෙනුවට, "(1) වන උපවගන්තිය අනුව නව පීඨාධිපතිවරයකු තෝරා පත්කළ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) මේ පනතේ කුමක් සඳහන්ව ඇතද මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී ධුරය දරන විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාලයීය ආයතනයක යම් පීඨාධිපතිවරයෙක් ස්වකීය ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දරන්නේ ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "ප්‍රධානයා වන්නේ ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"ප්‍රධානයා වන්නේ ය:

එසේ වුව ද, පාලක සභාව විසින් අධ්‍යයන අංශයේ ප්‍රධානයා පත් කරනු නොලැබූ අවස්ථාවක, තමාගේ පත් වීමේ දින සිට ගණන් බලන ලද මාස එකකට නොවැඩි කාලයක් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ තනතුරෙහි වැඩ බැලීම පිණිස උප කුලපතිවරයා විසින්, මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු හෝ කථිකාචාර්යවරයකු පත් කරනු ලැබිය හැකි ය."; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි " (1) වන උපවගන්තිය අනුව අංශයේ නව ප්‍රධානයකු පත් කළ යුතු ය. එසේ පත් කරනු ලබන තැනැත්තා තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය තුළ ධුරය දරන්නේ ය " යන වචන වෙනුවට, " (1) වන උපවගන්තිය අනුව, නව ප්‍රධානයකු පත් කළ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.".

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තියෙහි (ඊ) ඡේදයේ "ඇති කිරීම;" යන වචනය වෙනුවට, " ඇති කිරීම සඳහා කොමිෂන් සභාවට නිර්දේශ කිරීම;" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම.

32. ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (2) ලේකම්වරයාගේ විධානය සහ පරිපාලනයට යටත්ව, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ මුදල් පරිපාලනය සඳහා භාණ්ඩාගාරික වගකිව යුතු අතර, ඊට් මගින් නියම කරනු ලැබිය හැකි ආකාරයට හා පිළිවෙළට එහි ගණන් ඔහු විසින් පවත්වාගෙන යා යුතුය. විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ අරමුදල් ඔහු භාරයේ තිබිය යුත්තේ ය.".

33. ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තියේ (3) වන ඡේදය වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (3) පීඨ මණ්ඩලය හෝ පීඨ මණ්ඩල; සහ ".

34. (අ) ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය පහත දක්වෙන පිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (1) මෙහි මින්මතු " මණ්ඩලය " යනුවෙන් සඳහන් කරනු ලබන කලමනාකාර මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය:—

(i) අධ්‍යක්ෂවරයා;

(ii) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා;

(iii) ශාස්ත්‍රීය කමිටුව විසින්, එහි සාමාජිකයන් අතුරෙන් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් දෙදෙනෙක්; සහ

(iv) (i) වන, (ii) වන හා (iii) වන ඡේද යටතේ වූ මුළු සාමාජික සංඛ්‍යාවට එකක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාවට සමාන සාමාජික සංඛ්‍යාවක්. ඒ සාමාජිකයන් සියලු දෙනාම අධ්‍යාපන, වෘත්තීය,

වාණිජ, කාර්මික, විද්‍යාත්මක හෝ පරිපාලන ක්ෂේත්‍රයන්හි විශිෂ්ඨ සේවාවක් ඉටු කර ඇති තැනැත්තන් අතුරෙන් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය." ; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි (xvi) වන ඡේදය අන්තර්ගත කිරීමෙන්.".

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියේ කුමක් සඳහන්ව ඇතද, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සෑම විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයකම කළමනාකාර මණ්ඩලයේ පත් කරන ලද සාමාජිකයන්, මේ වගන්තිය ක්‍රියාත්මක කරනු ලැබූ දින සිට එවැනි සාමාජිකයන් වශයෙන් ධුර දැරීම නතර වන්නේ ය :

එසේ වුව ද, එසේ ධුරය දැරීම අවසන් වන යම් සාමාජිකයකු නැවත පත් කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම.

35. ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) ශාස්ත්‍රීය කමිටුව පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය :—

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;

(ඇ) එක් එක් අධ්‍යයන අංශයේ ප්‍රධානයා ;

(ඈ) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ සෑම ස්ථිර මහාචාර්යවරයකුම ;

(ඉ) පුස්තකාලයාධිකාරිවරයා ;

(ඊ) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය අනුබද්ධ කරනු ලැබ ඇත්තේ යම් විශ්වවිද්‍යාලවලට ද, ඒ එක් එක් විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් ඒ සභාවේ සාමාජිකයන් අතුරෙන් නම් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙක් ; සහ

(උ) එක් එක් පීඨයේ ස්ථිර ආචාර්යවරයන් විසින් ඒ පීඨයේ සාමාජිකයන් අතුරෙන් තෝරා පත් කරනු ලබන මේ උපවගන්තියේ ඉහතින්ම වූ ඡේදවල සඳහන් තැනැත්තන් නොවන්නා වූ ආචාර්යවරයන් දෙදෙනෙක්.".

36. ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, (1අ) වශයෙන් බලපැවැත්විය යුතු පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක එක් එක් පීඨය, මේ පනතේ විධිවිධාන සටහනේ ඒ පීඨය වෙත පැවරී ඇති අධ්‍යයන අංශවලින් සමන්විත වන්නේ ය.".

(2) ඒ වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(2) විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක එක් එක් පීඨයට, පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු පීඨ මණ්ඩලයක් විය යුතු ය :—

(අ) ඒ පීඨයේ පීඨාධිපතිවරයා ;

(ආ) පීඨය සමන්විත වන අධ්‍යයන අංශවල තම පත්වීම් ස්ථිර කරනු ලැබූ සියලුම මහාචාර්යවරු, සහාය මහාචාර්යවරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු සහ කථිකාචාර්යවරු ;

(ඇ) පීඨයේ ස්ථිර සහකාර කථිකාචාර්යවරයන් විසින් තමන් අතුරෙන් තෝරා පත් කරගනු ලැබූ එක් සාමාජිකයෙක් ;

(ඈ) (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් තැනැත්තන් හැර පීඨයේ ඉගැන්වීමේ කාර්යයන්හි යෙදී සිටින ස්ථිර කාර්ය මණ්ඩලය විසින් තමන් අතුරෙන් තෝරා පත් කර ගන්නා සාමාජිකයෙක් ;

(ඉ) පීඨයේ ශිෂ්‍යයන් විසින් තමන් අතුරෙන් තෝරා පත් කරගනු ලබන ශිෂ්‍යයන් දෙදෙනෙක් ;

(ඊ) විශ්වවිද්‍යාලයීය ආයතනය අනුබද්ධ වූයේ යම් විශ්වවිද්‍යාලයකට ද, ඒ එක් එක් විශ්වවිද්‍යාලයේ අනුරූපී පීඨ මණ්ඩලය විසින්, නිල බලයෙන් පත් වූ සාමාජිකයන් අතුරෙන් නම් කරන ලද නියෝජිතයන් තිදෙනෙක් ;

(3) (i) පීඨාධිපතිවරයා පීඨ මණ්ඩලයේ සියලුම රැස්වීම්වල මූලසුන දැරිය යුතු ය.

(ii) (2) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ තෝරා පත් කරගනු ලැබූ සාමාජිකයන්, මේ පනතේ 66 වන වගන්තිය යටතේ පීඨාධිපතිවරයා තෝරා පත් කර ගැනීමට හෝ විභාග සහ විභාගවලට සම්බන්ධ කරුණුවලට හෝ අදාළ යම් රැස්වීමක කටයුතුවලින් බැහැර කරනු ලැබිය යුතු අතර, එවැනි යම් රැස්වීමක් ඒ බැහැර කිරීම නොතකා යථා පරිදි පවත්වනු ලැබූ ලෙස සැලකිය යුතු ය.". සහ

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියෙහි "පීඨය" යන වචනය යෙදෙන කවර තැනෙක වුව ද, ඒ වෙනුවට "පීඨ මණ්ඩලය" යන වචන ආදේශ කිරීමෙන්.

8—ඒ 080989 (85/01)

ප්‍රධාන ප්‍රඥප්තියේ 60අ අලුත් වගන්තිය ඇතුලත් කිරීම.

37. 60 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 60අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"144 වන වගන්තියේ ඇතැම් විධි විධාන ප්‍රථම ලේඛකම්වරයාට සහ ප්‍රථම භාණ්ඩාගාරික වරයාට අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු බව.

60අ. 144 වන වගන්තියේ (ආ) සහ (ඇ) ඡේද වල විධිවිධාන, පිළිවෙලින් විශ්වවිද්‍යාලයක ප්‍රථම ලේඛකම්වරයාට සහ භාණ්ඩාගාරිකවරයාට අදාළව හා ඔවුන් සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ IXඅ අලුත් කොටස ඇතුලත් කිරීම.

38. IX වන කොටසට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ IXඅ කොටස වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"IXඅ කොටස

උපාධි ප්‍රදාන ආයතනවල බලතල

උපාධි ප්‍රදාන ආයතනවල බලතල.

70අ. 25අ වගන්තිය යටතේ වූ නියමයක් මගින් පිළිගනු ලැබූ උපාධි ප්‍රදාන ආයතනයකට නිශ්චිත බලධරයාගේ එකඟත්විය ඇතිව පහත දැක්වෙන කටයුතු කිරීම සඳහා බලය ඇත්තේ ය:—

(අ) ශිෂ්‍යයන් ඇතුල්කර ගැනීම සහ ඒ ආයතනය සම්බන්ධයෙන් 25අ වගන්තිය යටතේ කරන ලද නියමයෙහි සඳහන් අධ්‍යයන ක්ෂේත්‍රවල ඉගැන්වීමේ කටයුතු සැලැස්වීම;

(ආ) ඒ අධ්‍යයන ක්ෂේත්‍රවල අධ්‍යයන පාඨමාලා පිළිබඳ ප්‍රවිෂ්ට විය ලැබූ තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්යය සඳහා විභාග පැවැත්වීම;

(ඇ) ඒ අධ්‍යයන ක්ෂේත්‍රවල අධ්‍යයන පාඨමාලා හදාරා විභාග සමත් වූ තැනැත්තන්ට උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සහ පිරිනැමීම;

(ඈ) උපාධි ප්‍රදාන ආයතනයේ අධීක්ෂණය යටතේ සහ නිශ්චිත බලධරයා විසින් සඳහන් කරනු ලැබූ කොන්දේසිවලට යටත්ව පර්යේෂණ කරනු ලැබූ තැනැත්තන්ට උපාධි ප්‍රදානය කිරීම සහ පිරිනැමීම.

නිශ්චිත බලධරයා පත් කිරීම.

70ආ. (1) මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා නිශ්චිත බලධරයා වශයෙන් නමින් හෝ ධූරයෙන් යම් තැනැත්තකු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් පත කරනු ලැබිය හැකි ය.

(2) නිශ්චිත බලධරයා විසින් නිශ්චය කරනු ලබන සාමාජිකයන් යම් සංඛ්‍යාවකගෙන් සමන්විත ස්ථාවර කාරක සභා වෙත හෝ තත් කාර්ය කාරක සභා වෙත නැතහොත්, ඒ බලධරයා විසින් පත් කරනු ලබන යම් නිලධරයකු හෝ සේවකයකු වෙත ස්වකීය බලතල කිසිවක්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව නිශ්චිත බලධරයා විසින් පවරනු ලැබිය හැකි ය.

25අ වගන්තිය යටතේ නියමයක් කිරීමට පෙර අමාත්‍යවරයා විසින් වාර්තාවක් ලබාගත යුතු බව.

70ඇ. (1) ආයතනයක් සම්බන්ධයෙන් 25අ වගන්තිය යටතේ උපාධි ප්‍රදාන ආයතන නියමයක් කිරීමට පෙර, ඒ ආයතනයේ සලස්වන ලද අධ්‍යාපන පහසුකම් ද ඇතුළුව ඒ ආයතනයට අදාළ වාර්තාවක්, අමාත්‍යවරයා විසින් නිශ්චිත බලධරයාගෙන් ලබා ගත යුතු ය.

(2) යම් උපාධි ප්‍රදාන ආයතනයක් විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා වූ සාමාන්‍ය හෝ විශේෂ විධාන, අමාත්‍යවරයා විසින් නිශ්චිත බලධරයා විමසා සෑම ආයතනයක් වෙත ම නිකුත් කරනු ලැබිය හැකි අතර, එවැනි සෑම විධානයකට ම අනුකූලව කටයුතු කිරීම, එවැනි සෑම ආයතනයකම කාර්යය වන්නේ ය.

නිශ්චිත බලධරයාගේ බලතල.

70ඈ. අමාත්‍යවරයාගේ විධානය සහ පාලනයට යටත්ව, නිශ්චිත බලධරයා විසින් පහත දැක්වෙන බලතල ක්‍රියාත්මක කළ යුතු ය:—

(i) උපාධි ප්‍රදාන ආයතනවල අධ්‍යයන පාඨමාලාවලට තැනැත්තන් ඇතුළත් කර ගැනීම සඳහා වූ අවශ්‍යතා නිශ්චය කිරීම;

(ii) එක් එක් උපාධි ප්‍රදාන ආයතනය සම්බන්ධයෙන් 25අ වගන්තිය යටතේ කරන ලද නියමයෙහි සඳහන් යම් අධ්‍යයන ක්ෂේත්‍රවල අධ්‍යයන පාඨමාලාවනට ඒ ඒ ආයතනයෙහි සලස්වා ඇති උපාධි පාඨමාලා, එම අධ්‍යයන පාඨමාලා හදාරන තැනැත්තන් එම ආයතනවල දී ප්‍රවීනත්වය ලබා ඇත්තේ ද යන බව නිශ්චය කිරීම

සඳහා පැවැත්විය යුතු විභාග සහ එම ආයතනවල දී ප්‍රදානය කරනු ලැබිය යුතු උපාධි, අභිඥාන පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා පිළිබඳව ඒ එක් එක් උපාධි ප්‍රදාන ආයතනය විමසා නිශ්චය කිරීම;

(iii) එක් එක් උපාධි ප්‍රදාන ආයතනයට වාර්ෂිකව ඇතුළත් කරනු ලැබිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාව සහ ඒ ඒ ආයතනයේ විවිධ පාඨමාලාවලට ඒ ශිෂ්‍ය සංඛ්‍යාව බෙදා වෙන් කිරීම ඒ ඒ ආයතනය විමසා කලින් කල නිශ්චය කිරීම;

(iv) උපාධි ප්‍රදාන ආයතනවල ආචාර්ය මණ්ඩලයේ සුදුසුකම් නිශ්චය කිරීම;

(v) ඒ උපාධි ප්‍රදාන ආයතනවල සැලැස්විය යුතු පහසුකම් සහ පවත්වාගෙන යා යුතු ශාස්ත්‍රීය මට්ටම් නිශ්චය කිරීම; සහ

(vi) මේ පනත යටතේ ආයතනයේ බලතල ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය වන යම් නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.

මේ පනත යටතේ සහ නිශ්චිත බලධරයාගේ විධානය යටතේ කරනු ලබන ක්‍රියා ආදිය සඳහා ආරක්ෂාව.

70ඉ. (1) (අ) මේ පනත හෝ යම් උචිත සාධන පත්‍රයක් යටතේ නිශ්චිත බලධරයා විසින් සද්භාවයෙන් කරනු ලබන නැතහොත් කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් නිශ්චිත බලධරයාට විරුද්ධව; හෝ

(ආ) මේ පනත හෝ යම් උචිත සාධන පත්‍රයක් යටතේ හෝ නිශ්චිත බලධරයාගේ විධානය මත, නිශ්චිත බලධරයාගේ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් සද්භාවයෙන් කරනු ලබන නැතහොත් කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නො ලැබිය යුතු ය.

(2) නිශ්චිත බලධරයාට විරුද්ධව පවරන ලද්ද වූ යම් නඩුවක දී නිශ්චිත බලධරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළට විරුද්ධව කිසිම පිඩි ආඥාවක් නිකුත් නොකරනු ලැබිය යුතු ය.

39. ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "නියමාවලි මගින් නියම කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටි හා පත් කිරීමේ ක්‍රම අනුව, ඒ ආයතනයේ පාලක බල මණ්ඩලය විසින් කරනු ලැබිය යුතුය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"රීති මගින් නියම කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටි සහ පත් කිරීමේ ක්‍රම අනුව, ඒ ආයතනයේ පාලක බල මණ්ඩලය විසින් කරනු ලැබිය යුතුය:

එසේ වුව ද, 72 වන වගන්තියේ විධිවිධාන නො තකා, යම් උසස් අධ්‍යාපන ආයතනයක පාලක බල මණ්ඩලය විසින් කොමිෂන් සභාවේ අනුමතය ඇතිව, එවැනි යම් ආයතනයක ආචාර්ය තනතුරුවලට, පාලක බල මණ්ඩලය සහ ඒ ආචාර්යවරයා අතර එකඟ වූ යම් නියම හා කොන්දේසි මත යම් කාලයක් සඳහා, ස්ව කීය විෂයයන්ගෙන් දැනටමත් විශිෂ්ඨත්වයක් ලබා ඇති පළපුරුදු තැනැත්තන් පත් කරනු ලැබිය හැකිය."; සහ

(2) ඒ වගන්තියේ "නියමාවලිය" යන වචනය යෙදෙන සෑම තැනක වුව ද, ඒ වෙනුවට "රීති" යන වචන ආදේශ කිරීමෙන්.

40. ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ආචාර්ය තනතුරකට පත් කිරීම.

72(1) ආචාර්ය තනතුරකට කරනු ලබන සෑම පත් කිරීමක් ම ප්‍රථම අවස්ථාවේ දී වර්ෂ තුනක ආධුනික කාලයක් සඳහා වන අතර, එක් අවස් ථාවක එක් වර්ෂයක් බැගින් වර්ෂ තුනක් නො ඉක්මවන වැඩිපුර කාලයකට ඒ කාලය දීර්ඝ කිරීම ඒ ආචාර්යවරයා අනුයුක්ත ව උසස් අධ්‍යා පන ආයතනයේ පාලක බල මණ්ඩලය විසින් කළ හැකි ය:

එසේ වුව ද, පත් කිරීම මහාචාර්ය හෝ පුස්ත කාලයාධිකාරී තනතුරක් වන්නා වූ හා පත්වීම් ලාභියා ඒ උසස් අධ්‍යාපන ආයතනයේ වෙනයම් ආචාර්ය තනතුරක කලින් ස්ථිර කරනු ලැබුවා වූ හෝ අවස්ථාවක, ඒ පත් කිරීම, ප්‍රථම අවස් ථාවේ දී, එක් වර්ෂයක, ආධුනික කාලයකට පම ණක් විය යුතු ය:

එසේම තවදුරටත්, පත් කිරීම මහාචාර්ය හෝ පුස්තකාලයාධිකාරී තනතුරක් නොවන ආචාර්ය තනතුරක් වන්නා වූ සහ පත්වීම්ලාභියා ඒ

උසස් අධ්‍යාපන ආයතනයෙහි වෙනයම් ආචාර්ය තනතුරක කලින් ස්ථිර කරනු ලැබුවා වූ හෝ අවස්ථාවික. ඒ පත් කිරීම, යම් ආධුනික කාලය කට යටත් නො විය යුතු ය.

(2) ආධුනික කාලයක් මත ව සෑම පත් කිරී මක් ම, ඊනී මගින් නියමිත උචිත බඳවා ගැනීම් ක්‍රමයෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි ස්ථිර කිරීම පිළිබඳ නියම හා කොන්දේසිවලට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය සංශෝධනය කිරීම.

41. ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තියේ, "යටත් වන්නේ ය" යන වචන වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"යටත් වන්නේ ය :

එසේ වුව ද, කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන සේවයේ නියුක්ත වූ ද, ස්වකීය පත්වීමෙහි ස්ථිර කරනු ලැබුවා වූ ද, සේවා නියුක්තයකු, අවස්ථාවෝචිත පරිදි, 66අ සහ 144 වන වගන්තියේ විධිවිධාන යටතේ නොවන උසස් අධ්‍යාපන ආයතනයක ලේඛකාධිකාරී, ලේකම්, මූල්‍යාධිකාරී හෝ භාණ්ඩාගාරික තනතුරකට පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ පත්වීම, ප්‍රථම අවස්ථාවේ දී, අවුරුදු එකක කාලයක් සඳහා වැඩ බැලීමේ පත්වීමක් වන අතර, ඉන් පසු උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බල මණ්ඩලය විසින් ස්ථිර කරනු ලැබීමට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය සංශෝධනය කිරීම.

42. ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තියෙහි "කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක හෝ" යන වචන වෙනුවට, "උසස් අධ්‍යාපන ආයතනයක" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

43. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියෙහි "නියමාවලි මගින්" යන වචන වෙනුවට, "ඊනී මගින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

44. ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"අර්ථ නිරූපණය.

79. මේ කොටසෙහි, "ආචාර්යවරයා" යන්නට පුස්තකාලයාධිකාරීවරයා, නියෝජ්‍ය පුස්තකාලයාධිකාරීවරයා, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරීවරයා සහ සහකාර පුස්තකාලයාධිකාරීවරයා ඇතුළත් වන ලෙස සැලකිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය සංශෝධනය කිරීම.

45. ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ආ) ඡේදයෙහි "අනන්‍යාකාරයකින් දඬුවම් කරනු ලැබූ කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවකයන් විසින්, සේවයෙන් පහ කිරීමට, අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීමට හෝ ඒ අනන්‍යාකාර දඬුවමකට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචන සලකා බැලීම." යන වචන වෙනුවට, "විෂමාචාරය, අකාර්යක්ෂමතාවය හෝ රාජකාරි පැහැර හැරීම සම්බන්ධයෙන් අනන්‍යාකාරයකින් දඬුවම් කරනු ලැබූ කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවකයන් විසින්, සේවයෙන් පහ කිරීමට, අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීමට හෝ ඒ අනන්‍යාකාර දඬුවමකට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචන සලකා බැලීම." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (ඈ) ඡේදයෙහි "පාලක බල මණ්ඩලයට" යන වචන වෙනුවට, "ප්‍රධාන විධායක නිලධරයාට" යන වචන ආදේශ කිරීමෙන්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය සංශෝධනය කිරීම.

46. ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තියේ "කොමිෂන් සභාවේ සභාපතිවරයා" යන වචන වෙනුවට, "කොමිෂන් සභාව" යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය සංශෝධනය කිරීම.

47. ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් ඒ වගන්තියට නැවත අංක යෙදීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ නැවත අංක යෙදූ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) මේ පනත යටතේ අභියාචනා මණ්ඩලය විසින් සාදන ලද සෑම නියමාවලියක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය, එහි සඳහන් දිනයේ සිට ක්‍රියාත්මක වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය සංශෝධනය කිරීම.

48. ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) "දායකයා" යන අර්ථකථනය වෙනුවට, පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"දායකයා" යන්නෙන්, අර්ථසාධක අරමුදලෙහි දායකයකු වන, කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක හෝ ආයතනයක කාර්ය මණ්ඩලයෙහි යම් සාමාජිකයෙක් අදහස් වේ.

(ආ) "ආචාර්යවරයා" යන අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන :—

"ආචාර්යවරයා" යන්නට පුස්තකාලයාධිකාරිවරයා, නියෝජ්‍ය පුස්තකාලයාධිකාරිවරයා, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරිවරයා සහ සහකාර පුස්තකාලයාධිකාරිවරයා ඇතුළත් වන සේ සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

49. ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"අර්ථසාධක අරමුදලින් ගෙවීමට පෙර කරනු ලබන අඩු කිරීම.

94. (අ) දායකයකු කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවයෙහි යොදවා ගනු ලැබ සිටි කාලය තුළ යළි අවස්ථාවක, ඔහුගේ වංචනිකභාවය හෝ නොසැලකිල්ල හේතුකොට ගෙන ඒ කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන ආයතනය විසින් දරන ලද යම් පාඩුවක් හෝ හානියක ප්‍රමාණය,

(ආ) අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාවෙන් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් හෝ ආණ්ඩුවෙන් හෝ දායකයා විසින් ලබා ගත් ණය මුදලක් වෙනුවෙන් කළ යුතු ගෙවීම්, සහ

(ඇ) අර්ථසාධක අරමුදලේ තමාගේ බැරට ඇති මුදලට වැය බරක් විය යුතු මුදල ගෙවීමට තමා එකඟ වන විධිවිධාන යටතේ දායකයා විසින් ලියා අත්සන් කරන ලද යම් බැඳුම්කරයක්, ගිවිසුමක් හෝ වෙනත් සාධන පත්‍රයක් යටතේ අයවිය යුතු මුදලක් ද,

මේ කොටසෙහි ඉහතින් ම විධිවිධාන වල කුමක් සඳහන් වුව ද, එමෙන්ම වෙනයම් අයිතිවාසිකමකට හෝ ප්‍රතිකර්මයකට හානියක් නොමැතිව ද, අර්ථසාධක අරමුදලෙහි ඒ දායකයාගේ ගිණුමෙහි බැරට ඇති මුදලට ප්‍රථම වැය බරක් වන්නේ ය; තව ද, 93 වන වගන්තියේ විධිවිධාන අනුව යම් ගෙවීමක් කරන අවස්ථාවේ ඒ ප්‍රමාණය, ගෙවීම සහ අයවිය යුතු මුදල් අඩු කර ගත හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 97 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

50. 97 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 97අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත අදාළ කිරීමෙන් නිදහස් කිරීම.

97අ. 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධාන කොමිෂන් සභාවට හෝ යම් උසස් අධ්‍යාපන ආයතනයකට අදාළ නොවිය යුතු ය.".

51. ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— (ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තිය සංශෝධනය කිරීම.)

(1) "විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක මූලාධිකාරිවරයාගේ හෝ භාණ්ඩාගාරිකගේ" යන වචන වෙනුවට, "විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක මූලාධිකාරිවරයාගේ හෝ භාණ්ඩාගාරිකගේ" යන වචන ආදේශ කිරීමෙන්:

(2) ඒ වගන්තියේ (අ) ඡේදය වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

"(අ) ඒ විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලයේ, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයේ ගිණුම් තැබීම";

(3) ඒ වගන්තියේ (ආ) ඡේදයේ අතුරු ඡේදයෙහි "විවෘත විශ්වවිද්‍යාලය හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය" යන යෙදුම වෙනුවට, ඒ ඡේදයේ ඒ යෙදුම යෙදෙන කවර තැන්හි වුවද, "විවෘත විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානය" යන වචන ආදේශ කිරීමෙන්.

52. ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තියේ "විවෘත විශ්වවිද්‍යාලය හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය" යන යෙදුම යෙදෙන කවර තැන්හි වුවද, ඒ වෙනුවට, "විවෘත විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානය" යන යෙදුම යෙදීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. (ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තිය සංශෝධනය කිරීම.)

53. ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තිය "විවෘත විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක" යන යෙදුම වෙනුවට, "විවෘත විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක" යන යෙදුම ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. (ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තිය සංශෝධනය කිරීම.)

54. ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තියේ "විවෘත විශ්වවිද්‍යාලය හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය" යන යෙදුම දක්වෙන කවර තැන්හි වුව ද, ඒ වෙනුවට, "විවෘත විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනය හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානය" යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. (ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තිය සංශෝධනය කිරීම.)

55. ප්‍රධාන ප්‍රඥප්තියේ 105 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— (ප්‍රධාන ප්‍රඥප්තියේ 105 වන වගන්තිය සංශෝධනය කිරීම.)

(1) "විවෘත විශ්වවිද්‍යාලයක හෝ මූලාධිකාරිවරයා විසින් නැත හොත් විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක භාණ්ඩාගාරික විසින්" යන වචන වෙනුවට, "විවෘත විශ්වවිද්‍යාලයක

හෝ මූල්‍යාධිකාරිවරයා විසින් නැතහොත් විශ්වවිද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක භාණ්ඩාගාරික විසින්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) "එවැනි විශ්වවිද්‍යාලයේ හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ" යන යෙදුම වෙනුවට, "එවැනි විශ්වවිද්‍යාලයේ, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයේ හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයේ" යන යෙදුම ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ XIV වන කොටසෙහි දැක්වෙන ශීර්ෂය ප්‍රතිස්ථාපනය කිරීම.

56. ප්‍රධාන ප්‍රඥප්තියේ XIV වන කොටසෙහි දැක්වෙන "ශිෂ්‍ය සභා සහ සංගම්" යන ශීර්ෂය වෙනුවට, පහත දැක්වෙන ශීර්ෂය මෙයින් ආදේශ කරනු ලැබේ :—

"ශිෂ්‍ය සම්බන්ධිත සභා සහ වෙනත් සංගම්".

ප්‍රධාන ප්‍රඥප්තියේ 112 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

57. ප්‍රධාන ප්‍රඥප්තියේ 112 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ශිෂ්‍ය සම්බන්ධිත සභාව.

112. එක් එක් උසස් අධ්‍යාපන ආයතනයට ඒ උසස් අධ්‍යාපන ආයතනයේ තත්කාලයෙහි පිළිවෙලින් කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් හා ශිෂ්‍යයන්ව සිටින තැනැත්තන් අතුරෙන් නියමාවලියෙන් නියම කරනු ලබන කාර්ය මණ්ඩල හා ශිෂ්‍යයන් යම් සංඛ්‍යාවකගෙන් සමන්විත වන ශිෂ්‍ය සම්බන්ධිත සභාවක් තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය ඉවත් කිරීම.

58. ප්‍රධාන ප්‍රඥප්තියේ 113 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 114 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

59. ප්‍රධාන ප්‍රඥප්තියේ 114 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"වෙනත් සංවිධානයක් හෝ මණ්ඩලයක් සමග අනුබද්ධ වීම.

114. (1) ශිෂ්‍ය සම්බන්ධිත සභාවක් හෝ 115 වන වගන්තිය යටතේ පිළිගත් යම් සමිතියක්, සමාජයක් හෝ වෙනත් සංගමයක් ඒ ශිෂ්‍ය සම්බන්ධිත සභාව, සමිතිය, සමාජය හෝ වෙනත් සංගමය අයත් වන්නේ යම් උසස් අධ්‍යාපන ආයතනයකට ද, ඒ උසස් අධ්‍යාපන ආයතනයෙන් බැහැර යම් සංවිධානයක් හෝ මණ්ඩලයක් සමග අනුබද්ධ වීම නො කළ යුතු ය :

එසේ වුව ද, යම් සංවිධානයක් හෝ මණ්ඩලයක් සමග අනුබද්ධ වීම, ශිෂ්‍ය සම්බන්ධිත සභාවේ හෝ සමිතියේ, සමාජයේ හෝ වෙනත් සංගමයේ පරමාර්ථ වැඩිදුරටත් සක්‍රිය කර ගැනීමට හේතු විය හැකි බව උසස් අධ්‍යාපන ආයතනයේ

ප්‍රධාන විධායක නිලධරයාගේ මතය වන අවස්ථාවක, එසේ අනුබද්ධ වීම සඳහා ඔහු විසින් ලියවිල්ලකින් අනුමතය දිය හැකි ය.".

(2) ශිෂ්‍ය සම්බන්ධිතා සභාවක් හෝ 115 වන වගන්තිය යටතේ පිළිගත් යම් සමිතියක්, සමාජයක් හෝ වෙනත් සංගමයක් යම් දේශපාලන සංවිධානයක් සමඟ අනුබද්ධවීමක් නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තිය සංශෝධනය කිරීම.

60. ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තියෙහි (2) වන උපවගන්තියේ "ඒවායේ නිලධරයන් පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීම් පැවැත්විය යුතු ආකාරය ද, ඒ නිලධරයන්ගේ කාර්ය හා කර්තව්‍ය ද" යන වචන වෙනුවට, "නිලධරයන්ගේ කාර්ය හා කර්තව්‍ය ද" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 116 වන වගන්තිය සංශෝධනය කිරීම.

61. ප්‍රධාන ප්‍රඥප්තියේ 116 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) "ශිෂ්‍ය සභාව" යන යෙදුම වෙනුවට, "ශිෂ්‍ය සම්බන්ධිතා සභාව" යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "ශිෂ්‍ය සභාව" යන යෙදුම වෙනුවට, "ශිෂ්‍ය සම්බන්ධිතා සභාව" යන යෙදුම ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තිය සංශෝධනය කිරීම.

62. ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (ii) වන ඡේදය වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ii) එක් එක් ශිෂ්‍ය සම්බන්ධිතා සභාවේ සංයුතිය,";

(2) ඒ වගන්තියේ (iii) වන හා (iv) වන ඡේද ඉවත් කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ "ශිෂ්‍ය සභාව" යන යෙදුම යෙදෙන සෑම තැන්හි වුව ද, "ශිෂ්‍ය සම්බන්ධිතා සභාව" යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට, පහත දැක්වෙන පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"ශිෂ්‍ය සම්බන්ධිතා සභාවේ සංස්ථාපනය, කාර්ය හා කර්තව්‍ය කොමිෂන් සභාව විසින් නියම කළ යුතු බව.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තිය සංශෝධනය කිරීම.

63. ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) "යම් ශිෂ්‍ය සභාවක් හෝ සමිතියක්" යන වචන වෙනුවට, "යම් සමිතියක්" යන වචන ;

(ආ) "ඒ ආයතනයේ හොඳ නමට අහිතකර හෝ හානිකර අයුරින් ක්‍රියා කරතහොත්" යන වචන වෙනුවට, "ඒ ආයතනයේ හොඳ නමට අහිතකර හෝ හානිකර අයුරින් ක්‍රියා කරතහොත්, ඒ ආයතනයේ නිසියාකාර පරිපාලනයට අවහිර කරතහොත්" යන වචන; සහ

(ඇ) "ඒ සභාව හෝ සමිතිය" යන වචන වෙනුවට, "ඒ සමිතිය" යන වචන

ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනේ "ශිෂ්‍ය සභාවක්, සමිතියක්, සමාජයක් හෝ වෙනත් සංගමයක් තාවකාලිකව තහනම් කිරීම හෝ විසුරුවා හැරීම" යන වචන වෙනුවට, "සමිතියක්, සමාජයක් හෝ වෙනත් සංගමයක් තාවකාලිකව තහනම් කිරීම හෝ විසුරුවා හැරීම" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ XVI වන කොටසෙහි දැක්වෙන ශිර්ෂය ප්‍රතියෝජනය කිරීම.

64. ප්‍රධාන ප්‍රඥප්තියේ XVI වන කොටසෙහි දැක්වෙන "ආණ්ඩුවේ නිවස (සන්තකය නැවත ලබා ගැනීමේ) පනත අදාළ කිරීම" යන ශිර්ෂය වෙනුවට, පහත දැක්වෙන ශිර්ෂය මෙයින් ආදේශ කරනු ලැබේ:—

"ආණ්ඩුවේ නිවාස (සන්තකය නැවත ලබා ගැනීමේ) පනත සහ රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත අදාළ කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තිය සංශෝධනය කිරීම.

65. ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ii) වන ඡේදයෙහි (අ) අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) "නියම බලධරයා" යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාවේ ලේකම්වරයා හෝ විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරීවරයා හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක ලේකම්වරයා හෝ අදහස් වන අතර, ඒ ධුරයේ වැඩබලන යම් තැනැත්තකු ඊට ඇතුළත් වේ; තව ද,

ප්‍රධාන ප්‍රඥප්තියේ 120 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

66. ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තියට, ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය 120අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"1979 අංක 7 දරන පනත විශ්වවිද්‍යාල ඉඩම්වලට අදාළ කිරීම.

120අ. (1) 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ගැනීමේ) පනතේ විධිවිධාන, (2) වන උපවගන්තියේ දැක්වෙන සළු වෙනස් කිරීම්වලට යටත්ව විශ්වවිද්‍යාල ඉඩම්වලට අදාළ විය යුතු ය.

(2) රජයේ ඉඩම් (සන්තකය ආපසු ගැනීමේ) පනත, විශ්වවිද්‍යාල ඉඩම්වලට අදාළ කිරීමෙහි ලා මෙසේ සුළු වශයෙන් වෙනස් කරනු ලැබේ:—

(i) "රජයේ ඉඩම්" යන වචන ඒ පනතේ දැක්වෙන කවර තැන්හි වුව ද, ඒ වචන වෙනුවට, "විශ්වවිද්‍යාල ඉඩම්" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය;

(ii) එහි 18 වන වගන්තියේ—

(අ) "නියම බලධරයා" යන අර්ථකථනය වෙනුවට, පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කරනු ලැබිය යුතු ය:—

"නියම බලධරයා" යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාවේ ලේකම්වරයා හෝ විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරිවරයා හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක ලේකම්වරයා අදහස් වන අතර, ඒ ධුරයේ වැඩ බලන යම් තැනැත්තකු ඊට ඇතුළත් වේ; තව ද,

(ආ) "රජයේ ඉඩම්" යන අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කරනු ලැබිය යුතු ය:—

"විශ්වවිද්‍යාල ඉඩම්" යන්නෙන්, කොමිෂන් සභාවට හෝ උසස් අධ්‍යාපන ආයතනයකට හෝ නීත්‍යානුකූලව හිමිකම් ඇති ඉඩම් හෝ ඒ ඉඩම්වල පිහිටා ඇති යම් ගොඩනැගිලි ඇතුළුව ඒ ඉඩම්වලට සම්බන්ධ වූ හෝ ඊට අදාළ වූ සියලු අයිතිවාසිකම්, සම්බන්ධතා සහ වරප්‍රසාද සමග කොමිෂන් සභාව විසින් හෝ උසස් අධ්‍යාපන ආයතනයක් විසින් සුදුස්සක් කරනු ලැබිය හැකි ඉඩම් අදහස් වේ.".

67. ප්‍රධාන ප්‍රඥප්තියේ 121 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 121 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "කොමිෂන් සභාවට. අභියාචන මණ්ඩලයට" යන වචන වෙනුවට, "කොමිෂන් සභාවට, නිශ්චිත බලධරයාට, අභියාචන මණ්ඩලයට" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "කොමිෂන් සභාවේ, අභියාචන මණ්ඩලයේ" යන වචන වෙනුවට, "කොමිෂන් සභාවේ, නිශ්චිත බලධරයාගේ, අභියාචන මණ්ඩලයේ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය සංශෝධනය කිරීම.

68. ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) "කොමිෂන් සභාවේ සහ අභියාචන මණ්ඩලයේ" යන වචන වෙනුවට, "කොමිෂන් සභාවේ, නිශ්චිත බලධරයාගේ සහ අභියාචන මණ්ඩලයේ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "කොමිෂන් සභාවේ සහ අභියාචන මණ්ඩලයේ" යන වචන වෙනුවට, "කොමිෂන් සභාවේ, නිශ්චිත බලධරයාගේ, අභියාචන මණ්ඩලයේ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තිය සංශෝධනය කිරීම.

69. ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) "කොමිෂන් සභාව, අභියාචන මණ්ඩලය" යන වචන වෙනුවට, "කොමිෂන් සභාව, නිශ්චිත බලධරයා, අභියාචන මණ්ඩලය" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "කොමිෂන් සභාව, අභියාචන මණ්ඩලය" යන වචන වෙනුවට, "කොමිෂන් සභාව, නිශ්චිත බලධරයා, අභියාචන මණ්ඩලය" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 124 වන වගන්තිය සංශෝධනය කිරීම.

70. ප්‍රධාන ප්‍රඥප්තියේ 124 වන වගන්තියේ "විශ්වවිද්‍යාලවලට සහ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනවලට පොදු සම්බන්ධිතවක් ඇති කරුණු සලකා බැලීමේ කාර්ය සඳහා ද ඒ කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාවට උපදෙස් දීම සඳහා ද" යන වචන වෙනුවට, "විශ්වවිද්‍යාලවලට, විවෘත විශ්වවිද්‍යාලවලට හෝ විශ්වවිද්‍යාලයීය විද්‍යායතනවලට පොදු සම්බන්ධතාවක් ඇති කාරණා සලකා බැලීමේ කාර්ය සඳහා ද ඒ කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාවට උපදෙස් දීම සඳහා ද" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තිය සංශෝධනය කිරීම.

71. ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තිය, "කොමිෂන් සභාවේ අභියාචන මණ්ඩලයේ" යන වචන වෙනුවට, "කොමිෂන් සභාවේ, නිශ්චිත බලධරයාගේ, අභියාචන මණ්ඩලයේ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 127 වන වගන්තිය සංශෝධනය කිරීම.

72. ප්‍රධාන ප්‍රඥප්තියේ 127 වන වගන්තිය, "කොමිෂන් සභාව හෝ අභියාචන මණ්ඩලය" යන වචන වෙනුවට "කොමිෂන් සභාව, නිශ්චිත බලධරයා, අභියාචන මණ්ඩලය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

73. 128 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "විවෘත විශ්වවිද්‍යාලයක් හෝ බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය" යන වචන වෙනුවට, "විවෘත විශ්වවිද්‍යාලය, උසස් අධ්‍යාපන මධ්‍යස්ථානය, උප ධි ප්‍රදාන ආයතනය හෝ බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 128 වන වගන්තිය සංශෝධනය කිරීම.

74. ප්‍රධාන ප්‍රඥප්තියේ 134 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 134 වන වගන්තිය ඉවත් කිරීම.

75. ප්‍රධාන ප්‍රඥප්තියේ 137 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 137 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "අභියාචනා මණ්ඩලය" යන වචන වෙනුවට, "අභියාචනා මණ්ඩලය, නිශ්චිත බලධරයා" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි "අභියාචනා මණ්ඩලයට" යන වචන වෙනුවට "අභියාචනා මණ්ඩලයට, නිශ්චිත බලධරයාට" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි

(අ) "අභියාචනා මණ්ඩලය" යන වචන වෙනුවට, "අභියාචනා මණ්ඩලය, නිශ්චිත බලධරයා" යන වචන; සහ

(ආ) "අභියාචනා මණ්ඩලය" යන වචන වෙනුවට, "අභියාචනා මණ්ඩලය, නිශ්චිත බලධරයා" යන වචන ආදේශ කිරීමෙන්.

76. ප්‍රධාන ප්‍රඥප්තියේ 142 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 142 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය එහි (3) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ නැවත අංක කරන ලද (3) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උප වගන්තිය එකතු කිරීමෙන් :—

"(4) යම් තැනැත්තකු—

(i) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශිත රාජ්‍ය සේවයේ තනතුරක් දරන අතරතුර ; හෝ

(ii) පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම නියෝග යටතේ විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශිත පළාත් පාලන සේවයේ තනතුරක් දරන අතරතුර :

'ලංකා විශ්වවිද්‍යාල ආඥාපනත (186 වන අධිකාරය) ඉවත් කිරීමේ දිනට පෙරාතුව ලංකා විශ්වවිද්‍යාලයට හෝ 1966 අංක 20 දරන උසස් අධ්‍යාපන පනත යටතේ යම් විශ්වවිද්‍යාලයකට හෝ පත් කරන ලද අවස්ථාවක දී ඒ තැනැත්තා—

(අ) එකී ආඥාපනත ඉවත් කොට ඒ වෙනුවට ප්‍රති යෝජනා කරන ලද 1966 අංක 20 දරන උසස් අධ්‍යාපන පනත යටතේ පිහිටුවන ලද යම් විශ්ව විද්‍යාලයක එකී තනතුර 99 වන වගන්තිය ප්‍රකාර දිගටම දරමින් සිටියේ නම් සහ 1966 අංක 20 දරන පනත ඉවත් කොට ඒ වෙනුවට ප්‍රති යෝජනය කරන ලද 1972 අංක 1 දරන ලංකා විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද යම් විශ්වවිද්‍යාලයක එකී තනතුර 81 වන වගන්තිය යටතේ දිගටම දරමින් සිටියේ නම් ;

(ආ) 1972 අංක 1 දරන පනත ඉවත් කොට ඒ වෙනුවට, ප්‍රතියෝජනය කරන ලද 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවනු ලැබුවේ යයි සලකනු ලබන යම් විශ්ව විද්‍යාලයක 141 වන වගන්තිය ප්‍රකාර, එකී තනතුර දිගටම දරමින් සිටියේ නම් හෝ දරා ඇත්නම් ; සහ,

(ඇ) ඒ ආඥාපනත හෝ පනත් යටතේ පිහිටුවන ලද යම් අර්ථසාධක අරමුදල් යෝජනා ක්‍රමයකට දායක නොවී සිටියේ නම් ;

මේ පනතේ වෙන යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වී තිබුණ ද, ඒ සෑම විශ්වවිද්‍යාලයක ම එවැනි යම් තැනැත්තකු සේවය කළ මුළු සේවා කාලය විශ්‍රාම වැටුප් හිමි සේවා කාලයක් ලෙස ගණන් ගනු ලැබිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, විශ්‍රාම වැටුප් සංග්‍රහයේ හෝ පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම නියෝගවල කාර්ය සඳහා විශ්‍රාම වැටුප් හිමි තනතුරක් ඒ තැනැත්තා විසින් දරනු ලබන ලෙස හෝ දරා ඇති ලෙස සැලකිය යුතු ය. ඒ අනුව, ඒ සෑම විශ්වවිද්‍යාලයක් විසින් ම, එවැනි යම් තැනැත්තකුගේ විශ්‍රාම වැටුප් වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබූ යම් දායක මුදලක්, අවස්ථාවෝචිත පරිදි, ඒ තනතුර විශ්‍රාම වැටුප් සංග්‍රහය යටතේ හෝ පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම නියෝග යටතේ වූ විශ්‍රාම වැටුප් හිමි තනතුරක්ව තිබුණු වන්නාවූ ආකාරයෙන් ගෙවනු ලැබූ දායක මුදලක් ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්යය සඳහා—

"විශ්ව විද්‍යාලය" යන්නෙන්—

(අ) ලංකා විශ්වවිද්‍යාලයීය ආඥා පනත යටතේ පිහිටුවන ලද ලංකා විශ්වවිද්‍යාලය ;

(ආ) 1966 අංක 20 දරන උසස් අධ්‍යාපන පනත යටතේ පිහිටුවන ලද යම් විශ්වවිද්‍යාලයක් ;

(ඇ) 1972 අංක 1 දරන ලංකා විශ්වවිද්‍යාලය පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලය ; සහ

(ඈ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද යම් උසස් අධ්‍යාපනික ආයතනයක්

අදහස් වේ.".

77. ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "උචිත සාධන පත්‍රය" යන අර්ථකථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

"උපාධි ප්‍රදාන ආයතනය" යන්නෙන්, 25අ වගන්තියේ විධිවිධාන යටතේ පිළිගනු ලැබූ යම් ආයතනයක් අදහස් වේ ;

(2) උසස් අධ්‍යාපන ආයතනය යන අර්ථකථනය වෙනුවට, පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්—

"උසස් අධ්‍යාපන ආයතනය" යන්නෙන්, මේ පනත යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ ලෙස සැලකෙන විශ්වවිද්‍යාලයක්, මණ්ඩපයක්, විවෘත විශ්වවිද්‍යාලයක්, විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක් හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් අදහස් වේ ; තවද

(3) "ඊතිය" යන අර්ථකථනයේ "අසියාවන මණ්ඩලය" යන වචන වෙනුවට, "අභියාචනා මණ්ඩලය, නිශ්චිත බලධරයා" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) "නියෝගය" යන අර්ථකථනයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

"නිශ්චිත බලධරයා" යන්නෙන් මේ පනතේ 70අ වගන්තිය යටතේ නිශ්චිත බලධරයකු වශයෙන් පත් කරන ලද තැනැත්තා අදහස් විය යුතු ය.

(5) ඒ වගන්තියේ දැක්වෙන "පරිපාලන කාර්ය මණ්ඩලය" "අනධ්‍යයන කාර්ය මණ්ඩලය" "වෙනත් සේවකයා" සහ "ලිඛිත ව්‍යවස්ථාව" යන අර්ථකථන අත් හැරීමෙන්.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එලඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.

213874

1988-10-27

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

1988 අංක 24 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 ජූලි මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1988 ජූලි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 30 යි.   තැපැල් ගාස්තුව : ශත 75 යි.

213874

1988 අංක 24 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 ජූලි මස 15 වන දින]

එල්. ඩී.—ඕ. 31/88

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 1988 අංක 24 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

1978 අංක 16 දරන පනතේ 25අ වන වගන්තිය සංශෝධනය කිරීම.

2. මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 25අ වන වගන්තියේ "උපාධි ප්‍රදාන ආයතනයක් වශයෙන් මේ පනතේ 21 වන, 22 වන, 23 වන, 24 වන, 24අ සහ 25 වන වගන්තිවල සඳහන් ආයතනයක් නොවන යම් ආයතනයක්" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "උපාධි ප්‍රදාන ආයතනයක් වශයෙන් යම් ආයතනයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 70ඇ වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 70ඇ වන වගන්තියේ, (1) වන උපවගන්තියේ "ඒ ආයතනයේ සලස්වන ලද අධ්‍යාපන පහසුකම් ද ඇතුළුව ඒ ආයතනයට අදාළ වාර්තාවක්" යන වචන වෙනුවට "ඒ ආයතනයේ සපයනු ලබන අධ්‍යාපන පහසුකම් ද ඇතුළුව ඒ ආයතනයට අදාළ වාර්තාවක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තියේ "උපාධි ප්‍රදාන ආයතනය" යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"'උපාධි ප්‍රදාන ආයතනය' යන්නෙන් 25අ වන වගන්තියේ විධිවිධාන යටතේ පිළිගනු ලැබූ යම් ආයතනයක් අදහස් වේ;'.

[illegible] සියලු කොටස්වල සහ අතිරේකවල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 150 ඒ. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන ජන් එක් වර්ෂය සඳහා එය ලබාගත හැකිය.

213880

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
පොත් සහ ප්‍රවෘත්ති පත්‍ර
රෙජිස්ට්‍රාර් කාර්යාලය
1988-10-07
ශ්‍රී ලංකා

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

1988 අංක 26 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 ජූලි මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1983 ජූලි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි

ɗ 102753—7,710 (88/04

213880

1988 අංක 26 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 ජූලි මස 21 වන දින]

එල්.ඩී.—ඕ. 13/88.

දින්‍ය ලේඛනාගාර දෙපාර්තමේන්තුව
පොත් සහ ප්‍රවෘත්ති පත්‍ර
රෙජිස්ට්‍රාර් කාර්යාලය
1988-10-07

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත, 1988 අංක 26 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින්, අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1985 අංක 7 දරන පනතින් සංශෝධිත, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ XIV වන කොටසෙහි අඩංගු "ශිෂ්‍ය සම්බන්ධතා සහා සහ වෙනත් සංගම්" යන ශීර්ෂ පාඨය වෙනුවට පහත දැක්වෙන ශීර්ෂ පාඨය මෙයින් ආදේශ කරනු ලැබේ:—

1978 අංක 16 දරන පනතේ XIV වන කොටසෙහි ශීර්ෂ පාඨය සංශෝධනය කිරීම.

"විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතිය සහ වෙනත් සංගම්".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 112 වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 112 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතිය, පීඨ ශිෂ්‍ය සමිතිය ආදිය.

112. (1) එක් එක් උසස් අධ්‍යාපන ආයතනය සඳහා විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතියක් තිබිය යුතු අතර එහි සංයුතිය, කාර්ය සහ කර්තව්‍ය මේ පනතේ උපලේඛනයෙහි නියම කර ඇති පරිදි විය යුතු ය.

(2) උසස් අධ්‍යාපන ආයතනයක එක් එක් පීඨය සඳහා පීඨ ශිෂ්‍ය සමිතියක් තිබිය යුතු අතර, එහි සංයුතිය, කාර්ය සහ කර්තව්‍ය මේ පනතේ උපලේඛනය මගින් නියම කරනු ලැබිය යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල සඳහන් සමිතිවල නිලධරයන් තෝරා පත් කර ගැනීම සඳහා ඡන්ද විමසීම් පවත්වන ආකාරය ද, ඒ නිලධරයන්ගේ කාර්යයන් සහ කර්තව්‍යයන් ද, එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බලමණ්ඩලය විසින්, අතුරු ව්‍යවස්ථා මගින්, නියම කළ යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 114 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 114 වන වගන්තිය ඉවත් කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ඒ උසස් අධ්‍යාපන ආයතනය විසින්" යන වචනවල සිට "පිළිගත හැකිය." යන වචන දක්වා වූ සියලු වචන වෙනුවට "ඒ උසස් අධ්‍යාපන ආයතනය විසින් පිළිගත හැකිය." යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "117 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ" යන වචන වෙනුවට "අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 116 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 116 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ දැක්වෙන "ශිෂ්‍ය සම්බන්ධතා සභාවට" යන වචන වෙනුවට "විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතියට සහ පීඨ ශිෂ්‍ය සමිතියට" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනේ "ශිෂ්‍ය සම්බන්ධතා සභාවලට" යන වචන වෙනුවට, "විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතිවලට සහ පීඨ ශිෂ්‍ය සමිතිවලට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තිය ඉවත් කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 117 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට උපලේඛනය එකතු කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තිය අගට, මෙහි පහත දැක්වෙන උපලේඛනය මෙයින් එකතු කරනු ලැබේ :—

" උපලේඛනය

(112 වගන්තිය)

විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතිය සහ පීඨ ශිෂ්‍ය සමිතිය

1. (1) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතිය, ඒ ආයතනයේ මුළු මහත් ශිෂ්‍ය ප්‍රජාව ම නියෝජනය වන්නක් විය යුතු ය.

(2) එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතිය, එක් එක් පීඨ ශිෂ්‍ය සමිතියේ සියලු සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු අතර, ඒ සමිතිය විසින් මෙහි පහත සඳහන් නිලධරයන් තෝරා පත්කර ගත යුතු ය :—

(අ) සභාපති

(ආ) උප සභාපති

(ඇ) ලේකම්

(ඈ) සංස්කාරක සහ

(ඉ) කනිෂ්ඨ භාණ්ඩාගාරික.

2. විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතියේ කාර්ය හා කර්තව්‍ය මෙසේ විය යුතු ය:—

(අ) විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් අතර සහයෝගි සහජීවන හැඟීම ප්‍රවර්ධනය කිරීම;

(ආ) පාලන අධිකාරියේ උපදෙස් විමසා විශ්ව විද්‍යාල විනෝද කටයුතු පහසුකම්, අධ්‍යාත්මික හා ආගමික කටයුතු, ශිෂ්‍යයන්ට උපදේශන, කෑම සහ ආහාර පාන සැපයීම යනාදියෙහි ශිෂ්‍ය ශුභ සාධන ක්‍රියාකාරකම් සංවිධානය කිරීම හා අධීක්ෂණය කිරීම;

(ඇ) ශිෂ්‍යයන් ජීවත්වන හා වැඩකරන තත්ත්වයට අදාළ හෝ ලෙස සම්බන්ධ කාරණා පිළිබඳව එවැනි උසස් අධ්‍යාපන ආයතනවල බලධාරීන් සමග පිළිගත් අදහස් හුවමාරු කිරීමේ ක්‍රමයක් සැලසීම;

(ඈ) විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය ශුභ සාධන කටයුතු භාර ගැනීම සඳහා, පාලන අධිකාරිය විසින් තත්කාර්යය සඳහා සාදනු ලබන රීතිවලට අනුකූලව, පත් කරනු ලබන වෙනත් යම් මණ්ඩලයක නියෝජනය වීම;

(ඉ) විනය ආරක්ෂා කිරීම සඳහා විශ්ව විද්‍යාල බලධාරීන්ට සහභාගි වීම;

(ඊ) විනය පරීක්ෂණවල දී චූදිත ශිෂ්‍යයන් නියෝජනය කිරීම;

(උ) ශිෂ්‍යයන් අතර සංස්කෘතික, සාහිත්‍ය හා සෞන්දර්යාත්මක හැඟීම් හා ක්‍රියාකාරකම් වර්ධනය කිරීම සහ ශිෂ්‍යයින්ගේ සහරා සහ වාර සංග්‍රහ සංවිධානය කිරීම හා පළ කිරීම;

(ඌ) රටේ පුරවැසියන්ගේ කලා ශිල්ප, ජීවනය, සමාජ ශුභ සිද්ධිය ගැන උනන්දුවක් හා අවබෝධයක් ඇති කිරීම;

(එ) ශිෂ්‍ය ප්‍රජාවගේ සමාජමය හා සදාචාරාත්මක ශුභ සිද්ධියට හිතකර වන ක්‍රියාකාරකම් වර්ධනය කිරීම සහ යහපත් සමාජ ජීවිතයකට හිතකර ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම;

(ඒ) ශ්‍රී ලංකාව තුළ සහ විදේශවල වෙනත් විශ්ව විද්‍යාල හා ඒවා හා බැඳුණු සංවිධාන සමග සංස්කෘතික, සාහිත්‍යමය හා සමාජමය අන්තර් ක්‍රියාකාරකම් සංවිධානය කිරීම හා ප්‍රවර්ධනය කිරීම;

(ඔ) ව්‍යාප්ති පාඨමාලා සහ වැඩිහිටි අධ්‍යාපන වැඩ සටහන් සංවිධානයේ දී සහ ක්‍රියාත්මක කිරීමේදී විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් සමග ඒකාබද්ධව කටයුතු කිරීම;

(ඕ) උසස් අධ්‍යාපන ආයතනයේ හොඳනම රැකගැනීම සහ ආරක්ෂා කිරීම;

(ක) මහජන උනන්දුව ඇති කාරණා ගැන විවාද පැවැත්වීම;

(ග) ජාතික යහපත සහ ජාතික සමගිය වර්ධනය කිරීම;

(ච) උසස් අධ්‍යාපන ආයතනයේ දේපළ රැකගැනීම හා ආරක්ෂා කිරීම;

(ජ) ශාස්ත්‍රීය කටයුතු පිළිබඳ උනන්දුව වර්ධනය කිරීමට හා වැඩි දියුණු කිරීමට පියවර ගැනීම; සහ

(ට) පාලන අධිකාරිය විසින් කලින් කළ තීරණය කරනු ලබන යම් ක්‍රියාකාරකම් භාර ගැනීම.

3. (අ) විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය සමිතිය සඳහා ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකවරයකු සිටිය යුතු අතර ඔහු ඒ සමිතියේ නිලධරයන් විසින් නම් කරනු ලැබූ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයකු විය යුතු ය;

(ආ) විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය සමිතියේ නිලධරයකු විසින් සමගාමීව පීඨ ශිෂ්‍ය සමිතියක ධුරයක් දැරිය හැකි ය;

(ඇ) මේ පනතේ සඳහන් නිලධරයන් ශාස්ත්‍රීය අධ්‍යයන වර්ෂය අවසානයේ දී ධුරය දැරීම අවසන් කළ යුතු ය;

(ආ) විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සමිතියේ ධුරයක පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක, ඒ සමිතිය විසින් ඒ පුරප්පාඩුව පිරවීමට සුදුසු තැනැත්තකු හැකි ඉක්මනින් තෝරා පත් කර ගත යුතුය. එසේ තෝරා පත් කර ගනු ලැබූ තැනැත්තා ඔහුගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය;

(ඉ) පීඨ ශිෂ්‍ය සමිතියක ධුරයක පුරප්පාඩුවක් ඇතිවූ අවස්ථාවක, ඒ පීඨයේ ශිෂ්‍යයන් විසින් ඒ පුරප්පාඩුව පිරවීමට සුදුසු තැනැත්තකු හැකි ඉක්මනින් තෝරා පත් කරගත යුතුය. එසේ තෝරා පත් කර ගනු ලැබූ තැනැත්තා ඔහුගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

4. (1) විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතියක් විසින්, අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ අනුමතය ඇතිව, ඒ ප්‍රධාන විධායක නිලධරයා විසින් අනුමත කරන ලද සමාජයීය, සංස්කෘතික සහ ශුභසාධක කටයුතු සඳහා මුදල් රැස් කළ හැකි ය.

(2) උසස් අධ්‍යාපන ආයතනයක පාලන අධිකාරිය විසින් විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතියක හෝ පීඨ ශිෂ්‍ය සමිතියක හෝ මුදල් වියදම් කිරීමට අදාළව සහ ඒ ඒ සමිතිවල ගිණුම් තැබීමේ ආකාරයට අදාළව, රීති සෑදිය යුතු ය.

5. උසස් අධ්‍යාපන ආයතනයක පාලන අධිකාරිය විසින්, විශ්ව විද්‍යාල ශිෂ්‍ය සමිතියේ සහ පීඨ ශිෂ්‍ය සමිතියේ රැස්වීම් පැවැත්වීමට අදාළව සහ ඒ රැස්වීම්වල වාර්තා තබා ගැනීමේ ආකාරයට අදාළව රීති සෑදිය යුතු ය.

6. (1) පීඨ ශිෂ්‍ය සමිතියකින්, ඒ පීඨයේ සියලුම ශිෂ්‍යයන් නියෝජනය විය යුතු අතර, එවැනි සමිතියක නිලධරයන් ඒ පීඨයේ ශිෂ්‍යයන් විසින් ඒ අධ්‍යයන වර්ෂය සඳහා රහස් ඡන්දයෙන් තෝරා ගත යුතු ය.

(2) පීඨ ශිෂ්‍ය සමිතියක්—

(අ) සභාපතිවරයකුගෙන් ;

(ආ) උපසභාපතිවරයකුගෙන් ;

(ඇ) ලේකම්වරයකුගෙන් ;

(ඈ) සංස්කාරකවරයකුගෙන් ;

(ඉ) කනිෂ්ඨ භාණ්ඩාගාරිකවරයකුගෙන් ; සහ

(ඊ) පහත දැක්වෙන ආකාරයට එක් එක් උසස් අධ්‍යාපන ආයතනයක් විසින් තීරණය කරනු ලබන එවැනි වෙනත් සාමාජිකයන්ගෙන් :—

(i) දෙසියයක් හෝ ඊට අඩු ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇති පීඨයක් සඳහා සාමාජිකයන් දෙදෙනකුගෙන් ;

(ii) දෙසිය එකේ සිට හාරසියය දක්වා වූ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇති පීඨයක් සඳහා සාමාජිකයන් හතර දෙනකුගෙන් ;

(iii) හාරසිය එකේ සිට හයසියය දක්වා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇති පීඨයක් සඳහා සාමාජිකයන් හය දෙනකුගෙන් ; සහ

(iv) හයසියයකට වැඩි ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇති පීඨයක් සඳහා සාමාජිකයන් අට දෙනකුගෙන්

සමන්විත විය යුතු ය.

(3) එක් එක් පීඨ ශිෂ්‍ය සමිතිය සඳහා ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකවරයකු සිටිය යුතු අතර ඔහු ඒ සමිතියේ නිලධරයන් විසින් නම් කරනු ලැබූ ජ්‍යෙෂ්ඨ ආචාර්ය වරයකු විය යුතු ය.

7. පීඨ ශිෂ්‍ය සමිතියක කාර්යය සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය.

(අ) පීඨයේ ශිෂ්‍ය ප්‍රජාවගේ සාමූහික ජීවිතය සහ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම;

(ආ) එහි ශිෂ්‍යයන්ගේ ශාස්ත්‍රීය කටයුතු පිළිබඳ උනන්දුව දිරිගැන්වීමට සහ වැඩිදියුණු කිරීමට පියවර ගැනීම;

(ඇ) පීඨයේ සහ ආයතනයේ හොඳ නම රැකගැනීම සහ ආරක්ෂා කිරීම;

(ඈ) පීඨයේ ශිෂ්‍යයන් අතර සංස්කෘතික සහ ක්‍රීඩා කටයුතු පෝෂණය කිරීම;

(ඉ) මුදල් වියදම් කිරීමට සහ පීඨයේ ශිෂ්‍ය ප්‍රජාවගේ පොදු සුභසාධනයට අදාළ කරුණු පිළිබඳව නිර්දේශ විශ්ව විද්‍යාලයීය ශිෂ්‍ය සමිතිය වෙත ඉදිරිපත් කිරීම; සහ

(ඊ) පීඨයේ ශාස්ත්‍රීය සහ සුභසාධන කටයුතුවලට අදාළව පීඨ ශිෂ්‍ය සමිතියක සියලු තීරණ එහි සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් ගනු ලබන බව සහතික කිරීම.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.

214255

1988-10-21

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

1988 අංක 33 දරන
විශ්වවිද්‍යාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 සැප්තැම්බර් මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1988 සැප්තැම්බර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 30 යි. නැපැල් ගාස්තුව : ශත 75 යි.

NATIONAL LIBRARY OF SRI LANKA
NLSL

140 (88/09)

214255

ජාතික ලේඛනාගාර දෙපාර්තමේන්තුව ... 1988-10-21 ... SRI LANKA

1988 අංක 33 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 සැප්තැම්බර් මස 15 වන දින]

එල්. ඩී.—ඕ 55/88

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1988 අංක 33 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 70ඇ වගන්තිය, එහි අගට මෙහි පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1978 අංක 16 දරන පනතේ 70ඇ වගන්තිය සංශෝධනය කිරීම.

" (3) උපාධි ප්‍රදාන ආයතනයකට, ඒ උපාධි ප්‍රදාන ආයතනයේ (විධානයේ දිනට පෙර ඇතුළත් කර ගනු ලැබුව ද පසුව ඇතුළත් කරනු ලැබුව ද) සෑම ශිෂ්‍යයකුම, ඒ උපාධි ප්‍රදාන ආයතනය පිළිගනිමින් 25අ වගන්තිය යටතේ කරන ලද නියමයේ නිශ්චය කොට දැක්වෙන, අධ්‍යයන ක්ෂේත්‍රවල ඒ උපාධි ප්‍රදාන ආයතනය විසින් මෙහෙයවා පවත්වනු ලබන විභාගවලට පමණක් පෙනී සිටීමට සුදුසු විය යුතු බවට අමාත්‍යවරයා විසින් විශේෂ විධානයක් නිකුත් කළ හැකි ය.

(4) උපාධි ප්‍රදාන ආයතනයකට (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන විශේෂ විධානයක් ඒ සුදුසුවීම පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් අවසානාත්මක හා තීරණාත්මක වන අතර කිසිම අධිකරණයක දී එය ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ උපාධි ප්‍රදාන ආයතනයකට නිකුත් කරන ලද විශේෂ විධානයක්—

(අ) ඒ උපාධි ප්‍රදාන ආයතනය හෝ එහි පාලනාධිකාරය සහ ඒ උපාධි ප්‍රදාන ආයතනයේ ශිෂ්‍යයන් අතර ;

(ආ) ඒ උපාධි ප්‍රදාන ආයතනය හෝ එහි පාලනාධිකාරය සහ යම් උසස් අධ්‍යාපන ආයතනයක් අතර ; හෝ

(ඇ) ඒ උපාධි ප්‍රදාන ආයතනයේ ශිෂ්‍යයන් සහ යම් උසස් අධ්‍යාපන ආයතනයක් අතර

ඇතිකර ගන්නා ලද යම් ගිවිසුමක හෝ යම් නඩුවක දී ඇතිකර ගන්නා ලද යම් සමථයක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද බලාත්මක විය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.

219394

1989 - 9 - 29

SRI LANKA

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

1989 අංක 3 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1989 මැයි මස 05 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1989 මැයි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 75 යි.

තැපැල් ගාස්තුව : ශත 75 යි.

1989 අංක 3 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1989 මැයි මස 5 වන දින]

එල්. ඩී.—ඕ. 9/89.

1989 - 9 - 29

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1989 අංක 3 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1978 අංක 16 දරන පනතෙහි 70ඊ, 70උ, 70ඌ, 70එ, 70ඒ, 70ඔ, 70ඕ, 70ක සහ 70ග යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 70ඉ වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 70 ඊ, 70 උ, 70 ඌ, 70 එ, 70 ඒ, 70 ඔ, 70 ඕ, 70 ක සහ 70 ග යන වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"උපාධි ප්‍රදාන ආයතනයක ව්‍යවසායක් ආණ්ඩුව සතු කිරීමට අමාත්‍යවරයාට ඇති බලය.

70 ඊ. (1) උපාධි ප්‍රදාන ආයතනයක් විසින් කර ගෙන යනු ලබන යම් ව්‍යවසායක් මහජන යහපත පිණිස ආණ්ඩුව සතු කිරීම අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ඒ නියමයෙහි සඳහන් යම් දිනයක සිට බලපැවැත් වෙන පරිදි ඒ ව්‍යවසාය අමාත්‍යවරයා විසින් ආණ්ඩුව සතු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් මගින්, උපාධි ප්‍රදාන ආයතනයක් විසින් කර ගෙන යනු ලබන යම් ව්‍යවසායක් ආණ්ඩුව සතු කරනු ලැබූ අවස්ථාවක, ඒ නියමයෙහි සඳහන් දිනයේ සිට බලපැවැත් වෙන පරිදි ඒ ව්‍යවසාය සම්බන්ධයෙන් පරම හිමිකම සියලු බැඳීම්වලින් තොරව ආණ්ඩුව සතු විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම නියමයක් ම, ඒ නියමය අනුමත කළ යුතු බවට වූ යෝජනාවක් මගින් ඒ නියමයෙහි සඳහන් දිනයේ සිට දින තිහක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; නැතහොත් පාර්ලිමේන්තුවේ සභා වාර නොපැවැත්වේ නම් ඊළඟට පවත්වනු ලබන සභා වාරය ආරම්භ වීමෙන් දින පහළොවක් ඇතුළත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) උපාධි ප්‍රදාන ආයතනයක් විසින් කර ගෙන යනු ලබන ව්‍යවසායක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් අනුමත කිරීම පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප

2—ඩී 004043—7,875 (89/03)

කරනු ලබන අවස්ථාවක, ඒ ව්‍යවසාය ඒ නියමය ප්‍රකාර කිසිම විටක ආණ්ඩුව සතු කරන ලදැයි සලකනු නොලැබිය යුතු අතර, ඒ ව්‍යවසාය සම්බන්ධයෙන් හෝ ඒ විෂයයෙහි වූ යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් පිළිබඳව හෝ උද්ගත විය හැකි යම් ප්‍රශ්නයක් ඒ අනුව නිශ්චය කරනු ලැබිය යුතු ය.

නිසි බලධරයා පත් කිරීම.

70උ. (1) උපාධි ප්‍රදාන ආයතනයක් විසින් කර ගෙන යනු ලබන ව්‍යවසායක් 70ඊ වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් ආණ්ඩුව සතු කරනු ලැබූ අවස්ථාවක, ඒ ව්‍යවසායේ කටයුතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම පිණිස නිසි බලධරයකු පත් කරනු ලැබිය යුතු ය.

(2) උපාධි ප්‍රදාන ආයතනයක් විසින් කර ගෙන යනු ලබන යම් ව්‍යවසායක කටයුතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම පිණිස (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිසි බලධරයකු විසින් ඒ ව්‍යවසායේ දේපළ තම සන්තකයට ගනු ලැබිය යුතු ය.

ව්‍යවසායක ගිවිසුම්.

70ඌ. (1) උපාධි ප්‍රදාන ආයතනයක් විසින් කර ගෙන යනු ලබන ව්‍යවසායක්, 70ඊ වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් ආණ්ඩුව සතු කරනු ලැබූ අවස්ථාවක, ඒ ව්‍යවසායේ කාර්යයන්ට අදාළ වන්නා වූ ද, ඒ නියමයෙහි සඳහන් දිනයට ඉහතින් වූ දිනයේ පැවැතියා වූ ද යම් ගිවිසුමක් හෝ එකඟවීමක් යටතේ වූ සියලු අයිතිවාසිකම් හා වගකීම් ආණ්ඩුව සතු විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්—

(අ) (i) ඔහුගේ මතය අනුව අසද්භාවයෙන් ඇතුළත්ව ඇති කිසියම් ගිවිසුමක් හෝ එකඟවීමක් ; හෝ

(ii) විශ්වවිද්‍යාලයයට ඇතුළුවීම සඳහා කොමිෂන් සභාව විසින් කලින් කල නිශ්චිතව සඳහන් කරන ලද අවම අවශ්‍යතා සම්පූර්ණ කර නොමැති, ආයතනයේ ශිෂ්‍යයකු සමඟ වූ කිසියම් ගිවිසුමක් හෝ එකඟවීමක් යටතේ වූ කිසියම් වගකීමක් ප්‍රතික්ෂේප කිරීම ; හෝ

219394

(ආ) උසස් අධ්‍යාපන ආයතනවල අනුරූප තනතුරු වලට අනුයුක්ත නියම හා කොන්දේසි කෙරෙහි සැලකිල්ල ඇතිව එවැනි යම් ආයතනයක ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයකු සමඟ ඇතිකර ගන්නා ලද යම් ගිවිසුමක හෝ එකඟවීමක නියම හා කොන්දේසි සමාලෝචනය කිරීම හෝ වෙනස් කිරීම

කරනු ලැබිය හැකිය. ඒ නියමයෙහි සඳහන් දින සිට මාස හයක් ඇතුළත ගිවිසුමේ හෝ එකඟවීමේ පාර්ශ්වකරුවන් වෙත ඒ ප්‍රතික්ෂේප කිරීම හෝ වෙනස් කිරීම සම්බන්ධයෙන් දැන්වීමක් දෙනු ලැබිය යුතු ය.

(3) එවැනි යම් ගිවිසුමක් හෝ එකඟවීමක් යටතේ වූ වගකීම් අමාත්‍යවරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක ඒ වගකීම් ආණ්ඩුව වෙත කිසි විටක සතු කරනු නොලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා ඉල්ලීම.

70එ. (1) උපාධි ප්‍රදාන ආයතනයක් විසින් කර ගෙන යනු ලබන ව්‍යවසායක් සම්බන්ධයෙන් 70ඊ වගන්තිය යටතේ කරන ලද නියමයකින් අගතියට පත් යම් තැනැත්තකු විසින් ඒ නියමයේ දින සිට දින දහහතරක් ඇතුළත ඒ නියමය ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා අමාත්‍යවරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් ඉල්ලීමක් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් තුන්දෙනකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත උපදේශක මණ්ඩලයක් වෙත අමාත්‍යවරයා විසින් යොමු කරනු ලැබිය යුතු අතර, නියමය ප්‍රත්‍යාදිෂ්ට කළ යුතු ද නැද්ද යන වග පිළිබඳව ඒ උපදේශක මණ්ඩලය විසින් දින හැටක් ඇතුළත අමාත්‍යවරයාට උපදෙස් දෙනු ලැබිය යුතු ය.

(3) උපදේශක මණ්ඩලය විසින් අමාත්‍යවරයා වෙත දෙන ලද උපදෙස් සලකා බැලීමෙන් පසුව, ඒ ඉල්ලීම කරන ලද්දේ යම් සතු කිරීමේ නියමයක් සම්බන්ධයෙන් ද, ඒ නියමය අමාත්‍යවරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

වන්දි.

70ඡ. (1) 70ඊ වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් ආණ්ඩුව සතු කරනු ලැබුවේ යම් ආයතනයක ව්‍යවසායක් ද ඒ ආයතනයේ අයිතිකරුවෝ, ඒ සතු කිරීම වෙනුවෙන් සාධාරණ වන්දියක් ලැබීමට හිමිකම් ලබන්නාහ.

(2) උපාධි ප්‍රදාන ආයතනයක් විසින් කර ගෙන යනු ලැබූ සහ 70ඊ වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් ආණ්ඩුව සතු කරනු ලැබූ ව්‍යවසායක් වෙනුවෙන් ගෙවිය යුතු වන්දිය තක්සේරු කළ යුතු ආකාරය හා ඒ වන්දිය ගෙවිය යුතු ආකාරය සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ යටතේ කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) යම් නියෝගයක් (4) වන උපවගන්තිය යටතේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

(6) උපාධි ප්‍රදාන ආයතනයක් විසින් කර ගෙන යනු ලැබූ සහ 70ඊ වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් ආණ්ඩුව සතු කරනු ලැබූ යම් ව්‍යවසායක් සම්බන්ධයෙන් කරනු ලැබිය යුතු සියලු ගෙවීම්, ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු ය.

(7) මේ වගන්තියෙහි "අයිතිකරු" යන්න උපාධි ප්‍රදාන ආයතනයක් විසින් කරගෙන යනු ලැබූ ව්‍යවසායක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ ව්‍යවසායේ අයිතිකරු හෝ ඒ ව්‍යවසායේ කාර්ය සඳහා ගිවිසුම්වලට ඇතුළත් වීමට අයිතිකරු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු හෝ ඉන් අදහස් වේ.

70ඔ. (අ) 70ඊ වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් ආණ්ඩුව සතු කරනු ලැබූ යම් දේපළක සන්තකය, 70උ වගන්තිය යටතේ පත් කරනු ලැබූ නිසි බලධරයකුට භාර දීමට ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින ; හෝ — වැරදි.

(ආ) එවැනි යම් දේපළක සන්තකය ගැනීමෙන් එවැනි යම් නිසි බලධරයකු වළක්වන හෝ ඔහුට බාධා කරන හෝ කෙළින් ම හෝ අන්‍යාකාරයකින් වෙනත් යම් තැනැත්තකු ලවා එවැනි යම් නිසි බලධරයකු වැළැක්වීමට හෝ ඔහුට බාධා කිරීමට සලස්වන

යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

70ඕ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, උපාධි ප්‍රදාන ආයතනයක් විසින් කර ගෙන යනු ලබන ව්‍යවසායක්, 70ඊ වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් ආණ්ඩුව සතු කරනු ලැබූ අවස්ථාවක, ඒ නියමයෙහි සඳහන් දිනයට ඉගතින් ම වූ දිනයෙහි IXඅ කොටස යටතේ ඒ ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි (උපාධි, අභිඥාන පත්‍ර සහ ඒ ආයතනය නමින් වූ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීමේ බලය ද ඇතුළුව) සියලු බලතල, ඒ නියමයෙහි සඳහන් දින සිට බලපැවැත්වෙන පරිදි, ඒ කොටසේ විධිවිධානවලට යටත්ව, ඒ ව්‍යවසාය පරිපාලනය කිරීම සහ කළමනාකරණය සඳහා පත් කරන ලද නිසි බලධරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි අතර ඒ ආයතනය විසින් එවැනි යම් බලයක් ක්‍රියාත්මක කිරීම, ඒ දිනයේ සිට නතර කළ යුතු ය. ඒ කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, ඒ සෑම ව්‍යවසායකට ම අදාළ විය යුතු ය. — නිසි බලධරයාගේ බලතල.

ව්‍යවසායයක් පැවරීම.

70ක. 70ඊ වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් ආණ්ඩුව සතු කරනු ලැබූ ව්‍යවසායයක් සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් හෝ මහජන යහපත පිණිස සහ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් යම් උසස් අධ්‍යාපන ආයතනයකට අමාත්‍යවරයා විසින් පවරා දෙනු ලැබිය හැකි අතර, ඒ ව්‍යවසාය පරිපාලනය කිරීම සහ කළමනාකරණය සඳහා පත් කරන ලද නිසි බලධරයා එසේ පවරනු ලැබූ ව්‍යවසායයෙන් හෝ එහි කොටසින් සංයුක්ත කරනු ලබන, ඒ උසස් අධ්‍යාපන ආයතනයේ යම් පීඨයක පීඨාධිපති ලෙස සලකනු ලැබිය යුතු ය; තව ද මේ පනතේ VII වන කොටසේ විධිවිධානවලට අනුකූලව ඒ පීඨයේ පීඨාධිපතිවරයකු තෝරා පත කර ගනු ලබන තෙක්, එසේ කටයුතු කළ යුතු ය.

අර්ථ නිරූපණය.

70ග. 70ඊ වගන්තියේ සිට 70ක වගන්තිය තෙක් වූ වගන්තිවල, "ව්‍යවසාය" යන්න උපාධි ප්‍රදාන ආයතනයන් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ ආයතනය සම්බන්ධයෙන් 25අ වගන්තිය යටතේ කරන ලද නියමයෙහි සඳහන් කරන ලද යම් අධ්‍යයන ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා වූ ව්‍යවසායක් අදහස් වන අතර—

(අ) ඒ ආයතනය සම්බන්ධයෙන් 70ඊ වගන්තිය යටතේ කරන ලද නියමයේ දිනයට ඉහතින්ම වූ දිනයෙහි ඒ ව්‍යවසායයේ කාර්ය සඳහා පාවිච්චි කරනු ලැබූ සියලු චංචල හා නිශ්චල දේපළ;

(ආ) ඒ දේපළ හෝ ව්‍යවසාය සම්බන්ධයෙන් හෝ ඒ දේපළින් හෝ ව්‍යවසායයෙන් උද්ගත වන සියලු අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද හා සම්බන්ධතා සහ ඒ ව්‍යවසායයේ සියලු බැරකම්; සහ

(ඇ) ඒ ව්‍යවසායයට සම්බන්ධ හෝ අදාළ සියලු පොත්, ගිණුම් හා ලේඛන සහ ඒ ව්‍යවසායයේ දේපළ කිසිවක්

ඊට ඇතුළත් වේ.".

අනනුකූලතාවක් සම්බන්ධයෙන් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ
පාර්ලිමේන්තුව

1995 අංක 1 දරන
විශ්වවිද්‍යාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1995 ජනවාරි මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

ජනවාරි මස 06 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

මිළ : ශත 90 යි. නැපැල් ගාස්තුව : [illegible]

1995 අංක 1 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1995 ජනවාරි මස 03 වන දින]

එල්. ඩී. ඕ. 45/94

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 1995 අංක 1 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය. මේ පනතේ වෙන් වෙන් විධිවිධාන සඳහා වෙන් වෙන් දිනයන් නියම කරනු ලැබිය හැකි ය.

1978 අංක 16 දරන පනතේ 24අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

2. (මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන,) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 24අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 24ආ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය :—

"ආයතනයක් හෝ විද්‍යායතනයක් උසස් අධ්‍යාපන ආයතනයක් හෝ මධ්‍යස්ථානයක් ලෙස පිළිගැනීම.

24ආ (1) මේ පනතේ වෙනත් යම් විධිවිධාන යක පටහැනිව කුමක් සඳහන්ව ඇතද, අමාත්‍ය වරයා විසින්, කොමිෂන් සභාව විමසා සහ යම් ආයතනයක හෝ විද්‍යායතනයක පාලක බල මණ්ඩලයේ සහ ඒ ආයතනය හෝ විද්‍යායතනය අනුබද්ධ කිරීමට යෝජිත උසස් අධ්‍යාපන ආයතනයේ සනාථන සභාවේ සහ පාලක සභාවේ එකඟත්වය ඇතිව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ඒ ආයතනය හෝ විද්‍යායතනය, ඒ නියමයෙහි සඳහන් කරනු ලබන අධ්‍යයන ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය ලබාදීමේ, දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා, උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතනයක් හෝ මධ්‍යස්ථානයක් ලෙස පිළිගනු ලැබිය හැකි අතර, ඒ නියමය මගින් ම ඒ ආයතනය හෝ විද්‍යායතනය, උසස් අධ්‍යාපන ආයතනයකට අනුබද්ධ කළ හැකි ය; එවැනි නියමයක් කරනු ලැබූ විට, ඒ ආයතනය හෝ විද්‍යායතනය පළමු කී නියමයේ දින සිට බලපැවැත්වෙන පරිදි, 24අ වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින්, පිහිටුවන ලදැයි සලකනු ලැබිය යුතු ය.

(2) ආයතනයක් හෝ විද්‍යායතනයක් උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතනයක් හෝ මධ්‍යස්ථාන යක් ලෙස පිළිගැනීමින්, (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබූ විට—

(අ) ඒ නියමයේ දිනයට ඉහතින් ම වූ දිනයේ දී ඒ ආයතනයට හෝ විද්‍යායතනයට අයත් ව තිබුණා වූ සහ ඒ ආයතනයේ හෝ

විද්‍යායතනයේ කාර්ය සඳහා ප්‍රයෝජනයට ගනු ලැබුවා වූ සියලු චංචල හා නිශ්චල දේපළ, ඒ නියමයේ දිනයට ඉහතින් ම වූ දිනයේ දී ඒ චංචල හෝ නිශ්චල දේපළ කෙරෙහි බලපාන ලද යම් බැඳීම්වලට හෝ භාරවලට සහ ඒ උසස් අධ්‍යාපන ආයතනය සහ ඒ ආයතනයේ හෝ විද්‍යායතනයේ පාලක බලමණ්ඩලය විසින් එකඟ වනු ලැබිය හැකි පරිදි ඒ සම්බන්ධයෙන් වූ යම් වන්දි ගෙවීමකට යටත්ව, ඒ ආයතනය හෝ විද්‍යායතනය ඒ නියමයෙන් අනුබද්ධ කරනු ලැබුවේ යම් උසස් අධ්‍යාපන ආයතනයකට ද ඒ උසස් අධ්‍යාපන ආයතනය වෙත, ඒ නියමයේ දින සිට පැවරෙන්නේය.

(ආ) ඒ නියමයේ දිනයට ඉහතින් ම වූ දිනයේ දී ඒ ආයතනයේ හෝ විද්‍යායතනයේ සියලු නිලධරයන් සහ සේවකයන් අතුරින්—

(i) ඒ ආයතනය හෝ විද්‍යායතනය අනුබද්ධ කරනු ලැබූ උසස් අධ්‍යාපන ආයතනයෙහි සේවා නියුක්තිය පිරිනමන ලදුව, ඒ සේවානියුක්තිය පිළිගත් නිලධරයන් හා සේවකයන්, ඔවුන් විසින් ඒ නියමයේ දිනයට ඉහතින් ම වූ දිනයේ දී භුක්ති විඳින ලද නියමයන්ට හා කොන්දේසිවලට වඩා අඩු වාසිදායක නොවන නියම හා කොන්දේසි මත, ඒ උසස් අධ්‍යාපන ආයතනය විසින් සේවයෙහි නියුක්ත කර ගනු ලැබිය යුතු ය; තව ද

(ii) ඒ උසස් අධ්‍යාපන ආයතනයෙහි සේවා නියුක්තිය පිරිනමනු නොලැබූ හෝ එසේ සේවා නියුක්තිය පිරිනමනු ලැබ එය පිළිනොගත් නිලධරයන් හා සේවකයන් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් වන්දියක් හෝ පාරිතෝෂිකයක් ඒ උසස් අධ්‍යාපන ආයතනය විසින් ගෙවනු ලැබීමට හිමිකම් ලැබිය යුතු ය; සහ

(ඇ) ඒ ආයතනයක හෝ විද්‍යායතනයක පාලක බලමණ්ඩලය වෙත යම් ලිඛිත නීතියක් මගින් පැවරී ඇති යම් බලයක් හෝ වෙන් කර දී ඇති යම් කර්තව්‍යයක්, ඒ පාලක බලමණ්ඩලය විසින්, ඒ ආයතනය හෝ විද්‍යායතනය හා සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම, ඒ නියමයේ දින සිට නතර විය යුතු ය.

(3) මේ වගන්තියෙහි "පාලක බල මණ්ඩලය" යන්න, යම් ආයතනයක් හෝ විද්‍යායතනයක් සම්බන්ධව යෙදෙන විට, ඒ ආයතනයේ හෝ විද්‍යායතනයේ කටයුතු පාලනය කිරීම හා කළමනාකරණය කිරීම භාරව සිටින, එහි අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකරණ මණ්ඩලය, පාලක සභාව හෝ කවර හෝ නාමයකින් හඳුන්වනු ලබන වෙනත් යම් මණ්ඩලයක් ඉන් අදහස් වේ.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) (අ) (ආ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, විශ්ව විද්‍යාලයක උපකුලපතිවරයා, ඒ විශ්ව විද්‍යාලයේ පාලක සභාව විසින් නිර්දේශිත නම් තුනකින් යුත් මූල මණ්ඩලයකින්, කොමිෂන් සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් අවුරුදු තුනක කාලයක් සඳහා පත් කරනු ලැබිය යුතු ය.

(ආ) කිසිම තැනැත්තකු අනුක්‍රමික ධුර කාල දෙකකට වැඩි ගණනකට එකම විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා වශයෙන් පත් කරනු නොලැබිය යුතු ය.

(ඇ) විශ්ව විද්‍යාලයක උපකුලපතිවරයා, කොමිෂන් සභාව විමසීමෙන් පසු, ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන්;

(2) ඒ වගන්තියේ නැවත අංක කරන ලද (1) වන උපවගන්තියේ "ඒ පීඨයේ පීඨාධිපතිවරයකු තෝරා, පත් කර ගනු ලබන තෙක්" යන වචන වෙනුවට, "ඒ පීඨයේ පීඨාධිපතිවරයකු තෝරා, පත් කර ගනු ලබන තෙක් හෝ වැඩබලන පීඨාධිපතිවරයකු පත් කරනු ලබන තෙක්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තිය අගට, පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීමෙන් :—

" (2) 70වන වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් ආණ්ඩුව සතු කරනු ලැබූ ව්‍යවසායක් සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් හෝ (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් උසස් අධ්‍යාපන ආයතනයකට පවරා දෙනු ලැබුව ද, ඒ ව්‍යවසාය පාලනය කිරීම සහ කළමනාකරණය කිරීම පිණිස පත් කරන ලද නිසි බලධරයා සහ ඔහුගේ ධුරයේ අනුප්‍රාප්තිකයන් විසින්—

(අ) ඒ උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බලමණ්ඩලයේ විධානවලට යටත්ව ; සහ

(ආ) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක් දක්වා

(1) වන උපවගන්තිය යටතේ වූ නියමයේ දිනයට ඉහතින් ම වූ දිනයේදී ඒ ව්‍යවසායෙහි ලියාපදිංචි වී සිටි ශිෂ්‍යයන් හා සම්බන්ධව ඒ නිසි බලධරයා විසින් 70 වන වගන්තිය යටතේ ක්‍රියාත්මක කළ හැකි (ඒ ව්‍යවසායෙන් නියෝජනය වන ආයතනයේ නමින්, උපාධි, අභිඥාන පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීමේ බලය ඇතුළුව) සියලු බලතල තවදුරටත් ක්‍රියාත්මක කළ යුතු අතර, ඒ සෑම ශිෂ්‍යයකු විසින් ම, ඒ ව්‍යවසායේ ශිෂ්‍යයකු වශයෙන් හැදෑරීම් ආරම්භ කළ පාඨමාලාව (ආ) ඡේදය යටතේ නියම කරනු ලබන දිනය දක්වා තවදුරටත් හැදෑරීම කළ යුතු ය.

(3) 70වන වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් ආණ්ඩුව සතු කරනු ලැබූ ව්‍යවසායක් සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් හෝ, (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් උසස් අධ්‍යාපන ආයතනයකට පවරනු ලැබූ අවස්ථාවක, (1) වන උප වගන්තිය යටතේ නියමය කළ දිනයට ඉහතින් ම වූ දිනයේ දී ඒ ව්‍යවසායේ ලියාපදිංචි වී සිටි යම් ශිෂ්‍යයකු වෙත, ඒ උසස් අධ්‍යාපන ආයතනයේ යම් උපාධියක්, අභිඥාන පත්‍රයක්, සහතිකයක් හෝ වෙනත් යම් ශාස්ත්‍රීය විශිෂ්ටතාවක් ප්‍රදානය කරනු ලැබීමට කිසිම අයිතිවාසිකමක් හෝ හිමිකමක් පැවරෙන්නේ යයි මේ පනතේ ඇතුළත් කිසිවක් කියවා තේරුම් ගනු නොලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා සහ මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද " ව්‍යවසාය " යන යෙදුමට සේවා සැපයීම සඳහා 70 වන වගන්තිය යටතේ ආණ්ඩුව සතු කර ගන්නා ලද යම් ශිල්පයන් හෝ ප්‍රතිලාභයන් ලබන්නේ වූ අයිතිවාසිකම් හා බැඳීම් ඇතුළත් නොවිය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (1) ආචාර්ය තනතුරකට කරනු ලබන සෑම පත් කිරීමක් ම, ප්‍රථම අවස්ථාවේදී වර්ෂ තුනක ආධූනික කාලයක් සඳහා විය යුතු අතර, එක් අවස්ථාවක එක් වර්ෂයක් බැගින් වර්ෂ පහක් නොඉක්මවන වැඩිදුර කාලයකට, ඒ කාලය දීර්ඝ කිරීම, ඒ ආචාර්යවරයා අනුයුක්ත ව ඇති උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බල මණ්ඩලය විසින් කළ හැකි ය :

එසේ වුවද පත් කිරීම—

(අ) ආචාර්ය තනතුරකට වන්නා වූ ද, පත්වීම්ලාභියා වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක හෝ ඔහු අනුයුක්තව ඇති උසස් අධ්‍යාපන ආයතනයක, වෙනත් දෙපාර්තමේන්තුවක තනතුරක කලින් ස්ථිර කරනු ලැබ ඇත්තා වූ ද අවස්ථාවක, ඒ පත් කිරීම, ප්‍රථම අවස්ථාවේ දී එක් වර්ෂයක ආධූනික කාලයක් සඳහා විය යුතු ය ;

(ආ) ආචාර්ය තනතුරකට වන්නා වූ ද, පත්වීම්ලාභියා, වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක ආචාර්ය තනතුරකට සමාන යම් තනතුරක කලින් ස්ථිර කරනු ලැබ ඇත්තා වූ ද, අවස්ථාවක, ඒ පත් කිරීම, යම් ආධූනික කාලයකට යටත් නොවිය යුතු ය ; තවද

(ඇ) ආචාර්ය තනතුරකට වන්නා වූ ද, පත්වීම්ලාභියා අනුයුක්තව ඇති උසස් අධ්‍යාපන ආයතනයේ එම දෙපාර්තමේන්තුවේම වෙනත් යම් තනතුරක කලින් ස්ථිර කරනු ලැබ ඇත්තා වූ ද අවස්ථාවක, ඒ පත් කිරීම, යම් ආධූනික කාලයකට යටත් නොවිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

" ආචාර්ය තනතුරක් නොවන තනතුරකට පත් කිරීම.

74. ආචාර්ය තනතුරක් නොවන තනතුරකට කරනු ලබන සෑම පත් කිරීමක් ම, ප්‍රථම අවස්ථාවේ දී වර්ෂ තුනක ආධූනික කාලයක් සඳහා විය යුතු අතර, ඒ පත් කිරීම ආචාර්ය තනතුරක් නොවන තනතුරක සිට ආචාර්ය තනතුරක් නොවන වෙනත් තනතුරකට උසස් කිරීමේ හේතුවෙන් වූ පත් කිරීමක් වන අවස්ථාවක හැර, කොමිෂන් සභාව විසින් හෝ ඒ පත් කිරීම අදාළ වන උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බල මණ්ඩලය විසින් ඉන් ඉන්පසුව ස්ථිර කරනු ලැබීමට යටත්

එසේ වුවද කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක හෝ ආචාර්ය තනතුරක් නොවන තනතුරක පත්වීම ස්ථිර කරනු ලැබ ඇති යම් තැනැත්තකු, ඉන් අනතුරුව උසස් කරනු ලැබීමෙන් හෝ 60අ වගන්තියේ හෝ 144 වන වගන්තියේ හෝ විධිවිධාන යටතේ හැර, කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක හෝ ආචාර්ය තනතුරක් නොවන තනතුරකට පසුව පත් කරනු ලැබ ඇති අවස්ථාවක, ඔහුගේ එම දෙවන පත්වීම ප්‍රථම අවස්ථාවේ දී එක් වර්ෂයක ආධුනික කාලයක් සඳහා විය යුතු අතර, ඉන් පසුව, අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාව විසින් හෝ ඒ උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බලමණ්ඩලය විසින් හෝ ස්ථිර කරනු ලැබීමට යටත් වන්නේ ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තියේ (අ) ඡේදයේ යෙදෙන "අවස්ථාවේ බලපැවැත් වූ බඳවා ගැනීමේ පටිපාටිවලට හා පත් කිරීමේ ක්‍රම වලට පටහැනිව කරනු ලැබුවේ යයි කියන ලබන පත් කිරීම් හා උසස් කිරීම් පිළිබඳව විමර්ශන පැවැත්වීම ;" යන වචන වෙනුවට "ආයතනවලට පත් කිරීම් හෝ උසස් කිරීම් කරනු ලැබූ හෝ කරන ලදැයි කියනු ලබන අවස්ථාවේ බල පැවැත්වූ බඳවා ගැනීමේ පටිපාටිවලට සහ පත් කිරීමේ ක්‍රමවලට පට හැනිව කරනු ලැබුවේ යයි කියනු ලබන පත් කිරීම් හා උසස් කිරීම් පිළිබඳව සහ තනතුරුවල පුරප්පාඩු ඇතිවූ අවස්ථා වල, ඒ තනතුරුවලට පත් කිරීම් හෝ උසස් කිරීම් කරනු නොලැබූ බවට වූ චෝදනා පිළිබඳව විමර්ශන පැවැත්වීම" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 93 වන වගන්තිය, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(2අ) (අ) අර්ථ සාධක අරමුදලෙහි දායකයකු මියයාමෙන් පසු ඒ දායකයාගේ ගිණුමෙහි බැරට ඇති මුදල් ගෙවනු ලැබිය යුතු (මෙහි මින් මතු මේ වගන්තියේ "නම් කළ තැනැත්තා" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකු, දායකයා විසින් නම් කරනු ලැබිය හැකි ය ;

(ආ) නාම යෝජකයෙගේ අන්තිම කැමති පත්‍රයෙහි පට හැනිව කුමක් සඳහන්ව ඇත ද, (අ) ඡේදය යටතේ කරන ලද, නාම කිරීමක් බලාත්මක වන්නේ ය ;

(ඇ) (අ) ඡේදය යටතේ කරන ලද නම් කිරීමක් නාම යෝජකයාගේ ජීවිත කාලය තුළ දී නම් කළ තැනැත්තා මිය යාමෙන් හෝ නාමයෝජකගේ අත්සන සහතික කරන සාක්ෂිකරුවකු ඉදිරිපිට නාමයෝජක විසින් අත්සන් කරනු ලබන ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ ලිඛිත දැන්වීමක් මගින් හෝ නාමයෝජක විසින් තදනන්තරව කරනු ලබන යම් නම් කිරීමක් මගින් හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ආ) නම් කළ තැනැත්තා විසින් ඔහුගේ අනන්‍යතාව පිළිබඳව කොමිෂන් සභාවේ ලේකම්වරයා සෑහීමට පත් කළහොත් මිස, අර්ථ සාධක අරමුදලෙහි දායකයකුගේ ගිණුමේ බැරට ඇති කිසිම මුදලක් ඒ දායකයාගේ යම් නම් කළ තැනැත්තකුට ගෙවනු නොලැබිය යුතු ය ;

(ඉ) අර්ථසාධක අරමුදලෙහි දායකයකුගේ ගිණුමේ බැරට ඇති යම් මුදලක්, ඒ දායකයා මියයාමෙන් පසු ඒ දායකයාගේ නම් කළ තැනැත්තාට ගෙවීම, ඒ මුදල් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ බැදීම් මුළුමනින්ම ඉටු කිරීමක් විය යුතු ය. ".

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (4) දායකයකු, කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක හෝ සේවයෙහි නියුක්තව සිටිය දී මියගිය අවස්ථාවක, කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින්, අර්ථ සාධක අරමුදලේ ඒ දායකයාගේ ගිණුමෙහි බැරට තිබෙන සම්පූර්ණ මුදල, ඒ මුදලට එකතු වී ඇති පොලිය ද සමග, (3) උපවගන්තිය යටතේ නම් කරන ලද නම් කළ තැනැත්තාට හෝ තැනැත්තන්ට හෝ, එසේ වලංගු නම් කිරීමක් කර නොමැති නම්, ඒ මුදලට නීත්‍යානුකූල හිමිකමක් ඇති තැනැත්තාට හෝ තැනැත්තන්ට, 04 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ගෙවනු ලැබිය යුතු ය.".

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2009 අංක 57 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 07 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2009 ඔක්තෝබර් මස 09 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 2.50 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

2009 අංක 57 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 07 වන දින]

එල්.ඩී.—ඕ. 49/2007.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 57 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය. *ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 48 වන වගන්තියේ (1අ) උපවගන්තියේ (ආ), (ඇ) සහ (ඈ) ඡේද ඉවත් කොට පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *1978 අංක 16 දරන පනතේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.*

"(ආ) පීඨය සංයුක්ත වන අධ්‍යයන අංශවලට අයත් වූ සියලු ස්ථිර ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු, මහාචාර්යවරු, ආශ්‍රිත මහාචාර්යවරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු සහ කථිකාචාර්යවරු ;

(ඇ) කථිකාචාර්යවරු අතරින් අධ්‍යයන අංශයේ (ආධුනික) කථිකාචාර්යවරුන් විසින් තෝරාගනු ලබන සාමාජිකයන් දෙදෙනකු ;

(ඈ) (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් තැනැත්තන් හැර පීඨයට සම්බන්ධ වී ඇති සහ ඉගැන්වීමේ කාර්යයෙහි යෙදී සිටින ස්ථිර කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් අතරින් තෝරා පත්කර ගනු ලබන සාමාජිකයන් දෙදෙනකු ; ".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ii) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම.*

"(ii) කලින් කල සාදනු ලබන රීතිවලට අනුව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු වැටුප් සංකේතයක් හෝ වැටුප් තලයක් අයත් වන්නා වූ ආචාර්යවරයකුගේ තනතුර හැර වෙනත් තනතුරකට බඳවා ගැනීම:

2-PL 004220 —3,490 (2009/07)

එසේ වුවද, කොමිෂන් සභාව විසින් තත්කාර්ය සඳහා සාදන ලද රීති මගින් නිශ්චිතව දක්වා ඇති කාර්ය පටිපාටියට අනුව ඉහත තනතුරු සඳහා බඳවා ගැනීම පිණිස අදාළ උසස් අධ්‍යාපන ආයතනවලට නිර්දේශ ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබිය හැකි ය. කොමිෂන් සභාව විසින් එකී නිර්දේශ ලැබීමෙන් පසු අවශ්‍ය බඳවා ගැනීම් කරනු ලැබිය යුතු ය; සහ "

ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු වගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"එසේ වුව ද, පත්වීම —

(අ) ආචාර්ය තනතුරක් වන අවස්ථාවක සහ ඒ පත්වීම්ලාභියා අනුයුක්ත කරනු ලැබ ඇති වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක වෙනත් අධ්‍යයන අංශයක එකී පත්වීම්ලාභියා ආචාර්යවරයකු ලෙස කලින් ස්ථිර කරනු ලැබ ඇති අවස්ථාවක දී ඒ පත් කිරීම, ප්‍රථම අවස්ථාවේ දී එක් වර්ෂයක ආධුනික කාලයකට පමණක් විය යුතු ය ; හෝ

(ආ) ආචාර්යවරයකු වන අවස්ථාවක සහ ඒ පත්වීම්ලාභියා අනුයුක්ත කරනු ලැබ ඇති වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක වෙනත් අධ්‍යයන අංශයක ආචාර්යවරයකුට සමාන තනතුරක ස්ථිර කරනු ලැබ ඇති අවස්ථාවක දී, ඒ පත් කිරීම, ප්‍රථම අවස්ථාවේ දී, එක් වර්ෂයක ආධුනික කාලයකට පමණක් විය යුතු ය ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. "ආචාර්යවරයකුගේ තනතුරක් දරන්නකු හැර" යන වචනවල සිට "සලකනු ලැබිය යුතු ය" යන වචන දක්වා වූ වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"ආචාර්යවරයකුගේ තනතුරක් හැර වෙනත් තනතුරක් දරන්නකු විසින් තමාගේ විශ්‍රාම ගන්නා වෛකල්පිත වයසින් පසුව එනම්, උදාහරණයක් වශයෙන් විශ්‍රාමික වයස වන වයස අවුරුදු පනස් පහේ සිට වයස අවුරුදු පනස් හත දක්වා සේවයේ නියුක්තව සිටිය යුතු අතර, ඉන්පසු සේවයෙන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තියේ "ආචාර්යවරයා" යන අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තිය සංශෝධනය කිරීම.

"ආචාර්යවරයා" යන්නෙන්, යම් ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, ආශ්‍රිත මහාචාර්යවරයකු, 1 වන ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු, 2 වන ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු, කථිකාචාර්යවරයකු සහ (ආධුනික) කථිකාචාර්යවරයකු, මෙන්ම ආචාර්යවරයකු වන්නා වූ තනතුරක් ලෙස ආඥාපනත මගින් ප්‍රකාශ කරනු ලැබ ඇති යම් තනතුරක් දරන්නකු අදහස් වේ ; සහ"

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

ල

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.

ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2016 අංක 17 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2016 ඔක්තෝබර් මස 05 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2016 ඔක්තෝබර් මස 07 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

එල්.ඩී.—ඕ. 35/2013.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2016 අංක දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 75 වන වගන්තිය මෙයින් ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— 1978 අංක 16 දරන පනතේ 75 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

''ආචාර්යවරුන් හැර වෙනත් තැනැත්තන් විශ්‍රාම යෑම.

75. (1) ආණ්ඩුව විසින්, කලින් කල, තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ රජයේ නිලධරයෙකුගේ විශ්‍රාම යෑමේ වයස, එය රජයේ නිලධරයෙකුට අදාළ වන දිනයේ සිටම බලාත්මක වන පරිදි ආචාර්යවරයකු හැර යම් ධුරයක් දරන්නකුගේ විශ්‍රාම යෑමේ වයස සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

(2) (අ) කොමිෂන් සභාව විසින් හෝ එම ධුර දරන්නා අනුයුක්ත කර ඇත්තේ යම් උසස් අධ්‍යාපන ආයතනයකට ද, එම උසස් අධ්‍යාපන ආයතනයේ පාලන අධිකාරිය විසින් හෝ එම තැනැත්තා උසස් අධ්‍යාපන විද්‍යායතනයකට අනුයුක්ත කර ඇති අවස්ථාවක දී, එම විද්‍යායතනය අනුබද්ධ කර ඇත්තේ යම් උසස් අධ්‍යාපන ආයතනයකට ද, එකී උසස් අධ්‍යාපන ආයතනයේ පාලන අධිකාරිය විසින් එම විද්‍යායතනයේ නිර්දේශ මත අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාව විසින් හෝ එම පාලන අධිකාරිය විසින් හෝ එම විද්‍යායතනය විසින් පවත්වනු ලැබීමට නියමිත පරීක්ෂණයකට යටත්ව එම ධුරය දරන්නාගේ විෂමාචාරය,

2—PL 010092—2861 (2016/07)

අකාර්යක්ෂමතාවය හෝ රාජකාරිය පැහැරහැරීම යන කරුණු සම්බන්ධයෙන් ඔහුගේ සේවය අත්හිටුවිය හැකි ය.

(ආ) එම පරීක්ෂණයෙන් පසු එම ධුරය දරන්නා වරදකරු බවට පත්වී ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාව විසින් හෝ එම තැනැත්තා අනුයුක්ත කර ඇත්තේ යම් උසස් අධ්‍යාපන ආයතනයකට ද, එම උසස් අධ්‍යාපන ආයතනයේ පාලන අධිකාරිය විසින් හෝ එම තැනැත්තා උසස් අධ්‍යාපන විද්‍යායතනයකට අනුයුක්ත කර ඇති අවස්ථාවකදී, එම විද්‍යායතනය අනුබද්ධ කර ඇත්තේ යම් උසස් අධ්‍යාපන ආයතනයකට ද, එකී උසස් අධ්‍යාපන ආයතනයේ පාලන අධිකාරිය විසින්, කොමිෂන් සභාව හෝ අදාළ උසස් අධ්‍යාපන විද්‍යායතනයේ පාලන අධිකාරිය මගින් සම්මත කරගනු ලබන යෝජනා සම්මතයක් මත එම ධුරය දරන්නා සේවයෙන් පහ කිරීම හෝ අනිවාර්ය විශ්‍රාම ගැන්වීම සිදුකල හැකි ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තියේ ''පාලන අධිකාරිය'' යන අර්ථනිරූපනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථනිරූපනය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

''උසස් අධ්‍යාපන විද්‍යායතනය'' යන්නෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ හෝ 24ආ වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ ලෙස සලකනු ලබන උසස් අධ්‍යාපන විද්‍යායතනයක් අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.